NATIONAL SCIENCE FOUNDATION

ජාතික විද්‍යා පදනමේ විද්‍යා සඟරාව



මෙම ප්‍රකාශනයෙහි අඩංගු ලිපිවල අන්තර්ගතය එම ලිපි සැකසූ ලේඛකයන්ගේ අදහස් වන අතර ජාතික විද්‍යා පදනම ඒ හා සම්බන්ධව වග කියනු නොලැබේ.

© ජාතික විද්‍යා පදනම - ශ්‍රී ලංකාව

ISSN 1391-0299

ජාතික විද්‍යා පදනම

සභාපතිනිය
මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු

විධායක අධ්‍යක්ෂ
ආචාර්ය සරත් අභයවර්ධන

විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශය සඳහා උපදේශක කමිටුව

මහාචාර්ය එම්. ටී. එම්. ජිෆ්රි
මහාචාර්ය ශ්‍යාම් ප්‍රනාන්දු
ආචාර්ය ජයන්ත වත්තවිදානගේ
තුසිත මලලසේකර
එන්. අයි. එන්. එස්. නඩරාසා
ආචාර්ය හිරාන් අමරසේකර
සී. එම්. ආර්. ඇන්තනි
ආචාර්ය කුමාරි තිලකරත්න
එන්. ඒ. අතුකෝරළ
පාලිත විජේසිංහ

විදුරාව 27 වෙළුම - කලාපය 01
ජාතික විද්‍යා පදනමේ වෙබ් අඩවිය වන www.nsf.ac.lk හි අන්තර්ගත කොට ඇත.

විදුරාව 27 වෙළුම - කලාපය 01

විදුරාව

27 වෙළුම - කලාපය 01
ජනවාරි 2010

පටුන

කතු වැකිය

සියලු විද්‍යාඥයන් වෙත ගෞරවයෙනි! 02
තුසිත මලලසේකර

කවරයේ කතාව 1

විද්‍යාව ප්‍රචලිත කිරීම: විද්‍යා ලේඛක කාර්යභාරය 03
ඉන්දීය විද්‍යා ලේඛක මහාචාර්ය ඩී. බාලසුබ්‍රමනියන්

කවරයේ කතාව 2

විද්‍යා සන්නිවේදනය එදා, අද සහ හෙට 06
ආචාර්ය ජයන්ත වත්තවිදානගේ

කවරයේ කතාව 3

විද්‍යා සන්නිවේදනයේ බලපෑම කෙබඳුද? 10
මහාචාර්ය කාලෝ ෆොන්සේකා

කවරයේ කතාව 4

විද්‍යාව, විද්‍යාඥයන් සහ විද්‍යා සන්නිවේදනය 17
තුසිත මලලසේකර

කවරයේ කතාව 5

සන්නිවේදනය සඳහා "නව මාධ්‍ය භාවිතය" 23
ආචාර්ය බුද්ධි වීරසිංහ

කවරයේ කතාව 6

යෞවනයන් සමග විද්‍යා සන්නිවේදනය උදෙසා අන්තර්ජාලය සහ ජංගම දුරකථන භාවිතය 27
තුසිත මලලසේකර

සංස්කාරකවරු
තුසිත මලලසේකර
අසෝක ද සිල්වා
මහාචාර්ය එස්. මෝහනදාස්

සහාය සංස්කාරක
කේ. ජී. ජනක කරුණාසේන

අකුරු සැකසුම හා පිටු නිර්මාණය
දිමුතු ජයමාලි වීරසූරිය

පිටකවරය
ඉසුරු රන්දික සිල්වා

ප්‍රකාශනය සහ මුද්‍රණය
ජාතික විද්‍යා පදනම
47/5, මේට්ලන්ඩ් පෙදෙස
කොළඹ 07

පිළිබිඹු මූලාශ්‍රය: අන්තර්ජාලය

දුරකථනය: 2696771
ෆැක්ස්: 2694754
ඉ-මේල්: vidurava@nsf.ac.lk

සියලු විද්‍යාඥයන් වෙත ගෞරවයෙනි!

විද්‍යාවේ සොයාගැනීම් හා ජයග්‍රහණ, අවශේෂ පොදු ජනතාව අත පත්වීම, අනිවාර්ය ලෙසම සිදුවිය යුත්තක් බව අවිවාදයෙන් පිළිගනු ලැබූවකි. එහෙත් එම කාර්යය සිදු කළ යුත්තේ විද්‍යාඥයන් විසින්ද එසේ නැතිනම් විද්‍යා ලේඛකයන් විසින්ද යන්න මහත් විවාදයට ලක්ව තිබෙන්නා වූ කරුණකි.

තම දැනුම, තම සොයා ගැනීම් පිළිබඳ වත ගොත එයට අදාළ ක්ෂේත්‍රයන්හි විද්‍යාඥයන් විසින්ම ජනතාව අත පත් කරනුයේ නම් ඉතාම නිවැරදි කරුණු ඉදිරිපත් වනු ඇත. එනමුදු විද්‍යාඥයන් කතා බහ කරන, ලියන-කියන භාෂාව පොදු ජනතා ව්‍යවහාරයෙන් ඈත්වූ තාක්ෂණික හෙවත් ශිල්පීය භාෂාවක් වීම මෙතැනදී හරහට සිටින බව නොකිව මනාය.

මෙ නිසාම විද්‍යාඥයන් බොහෝ විට සිය දැනුම ජනතාව වෙත පත් කරනුයේ තමන්ට සමීප වන ඒදණ්ඩක් හෝ පාලමක් හෝ හරහාය. මෙම ඒදණ්ඩ නම් විද්‍යාඥයෙක් නොවන ජනමාධ්‍යවේදියාය. ජනමාධ්‍යවේදීන්ගේ මූලික අපේක්ෂාව වන්නේ සිය නිර්මාණශීලී හැකියාව ප්‍රදර්ශනය කරන අන්දමින් පාඨක-ශ්‍රාවක පිරිසට රසවත් තොරතුරක් ඉදිරිපත් කිරීමය. එහිදී ජනතාව තුළ කුතුහලය හෝ විස්මය හෝ උපදවන වර්ණවත් යෙදුම් සහිතව කෙරෙන රචනාව විද්‍යාඥයා දකිනුයේ සිය තොරතුරු විකෘති කිරීමක් ලෙසය. විද්‍යා ලේඛකයා හා විද්‍යාඥයා අතර ගැටුම ඇරඹෙන්නේ මෙතැනදීය. මෙම උභතෝකෝටිකයට ඇති විසඳුම වන්නේ සන්නිවේදන කුසලතා හිමිකරගත් විද්‍යාඥයන් පිරිසක් බිහිවීමය. ඔවුන් විද්‍යා ලේඛකයන් ඉක්මවා ගිය විද්‍යාඥ ලේඛකයන් විය යුතුය.

එහෙත් එය අසීරුය. එනමුදු කළ නොහැකි කාර්යයක් නම් නොවේ. තම විද්‍යාත්මක භාෂාව විෂය ක්ෂේත්‍රයට සහ තම 'සමාජය' වෙත සම්පාදනය කරන දේශන- ලේඛනවලට සීමා කර 'පොදු සන්නිවේදනය' සඳහා විද්‍යාඥයන් සූදානම් විය යුතුය. තම දේශයෙහි ජනතාවගේ මුව රැඳෙන භාෂාව විද්‍යාඥයෙකු වීමට පෙර තම තොල් අතරින් ද බැහැර වූ බව පළමුව සිහි කළ යුතුය. ඉන් පසුව කළ යුත්තේ තම විෂය ක්ෂේත්‍රයට අදාළ තොරතුරු එම වදන් මාලාවෙන් ඉදිරිපත් කිරීමට උත්සාහ කිරීමය. මෙම පෙරුම්පිරීම පල දැරීමට එතරම් කාලයක් අවශ්‍ය නොවේ.

අධිෂ්ඨානය, උද්යෝගය සහ අවශ්‍යතාව ඇත්නම් ඕනෑම විෂය ක්ෂේත්‍රයක විද්‍යාඥයෙකු හට ''හොඳ සන්නිවේදකයෙක්'' විය හැකිය. මෙවර 'විදුරාව සඟරාව' විද්‍යා සන්නිවේදනය සඳහා කැපකර ඇත්තේ එවන් වෙහෙසක් දරා, අන් විද්‍යාඥයන් අතරින් වෙසෙසි බවක් හිමි කර ගැනීමට පුල පුලා සිටින ''ඔබ'' වෙනුවෙනි.

-තුසිත මලලසේකර

විද්‍යාව ප්‍රචලිත කිරීම: විද්‍යා ලේඛක කාර්යභාරය

මහාචාර්ය ඞී. බාලසුබ්‍රමනියන්

විද්‍යාව අනුසරණය කිරීම හෙවත් ඒ පසුපස හඹා යෑම මේ මෑතක් වන තුරු-මෙයට පරම්පරා තුනක් තරම් වූ මෑත කාලය දක්වා සලකනු ලැබූයේ මහත්මා දාර්ශනිකයන් හෝ ස්වභාවවාදීන් හෝ විසින් පමණක් සිදු කළ යුතු කාර්යයක් ලෙසය. එය සමස්ත ඥානාන්විත හඹායාමේ අංගයක් ලෙස මෙන්ම මනසට අභියෝගයක් සපයන්නට සමත් වූවක් වශයෙන් ද සිත්ගන්නා සුළු විනෝදාංශයක් ලෙස ද සලකනු ලැබිණ. මෙන්ඩල් සහෝදරතුමා ක්‍රිස්තියානු පූජකවරයෙකු ලෙස නිරත වූ සිය ජීවිතයේ ප්‍රමුඛ කාර්යයට අමතරව පැළෑටියේ ජාන විද්‍යාත්මක පසුබිම පිළිබඳව ද විමසිලිමත්ව බැලීමට යොමු විය. වංශවතෙකු වුවද චාර්ල්ස් ඩාර්වින් භූ විද්‍යාව සහ ජීව විද්‍යාව කෙරෙහි උනන්දුවක් දක්වූවේය. මෙම වංශවතා තුළ උපන් පුරෝගාමී සංකල්ප ඔහුව විප්ලවීය විද්‍යාඥයෙකු බවට පත් කළේ ඔහු තුළ වූ උනන්දුව ප්‍රබල ආවේග බවට පරිණාමනය වූ බැවිනි. මූලික වශයෙන්ම රාජ්‍ය තාන්ත්‍රික දේශපාලනඥයෙකු වූ බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් ස්වභාවධර්මය සතු වූ විස්මිත බව පිළිබඳ ඉමහත් කුතුහලයක් දක්වීය. මේ සියලු ස්වභාවවාදීන් මැනවින් ලේඛන කටයුතුවල නියැලුනහ. එසේම ඔවුන් විසූ යුගයට ගැලපෙන සාහිත්‍යමය භාෂාවකින් ලියූහ. ඒ කොතරම් ද යත් චාර්ල්ස් ඩාවින් විසින් රචනා කළ 'ජීවීන්ගේ සම්භවය' නම් වූ ජනප්‍රිය කෘතිය එයට වඩා හොඳින් ''ශාස්ත්‍රීය ලෙස'' හෝ ''ජනප්‍රිය ලෙස'' රචනා කළ නොහැකි බව බොහෝ දෙනාගේ විශ්වාසය ය. එපරිද්දෙන්ම බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් රචිත ඍජු සහ ප්‍රබල ගද්‍ය නිර්මාණ සර්වග්‍රාමී හෙවත් ඕනෑම අයෙකු හට තේරුම් ගත හැකි තත්වයක පවතින බව පිළි ගැනෙයි.

භෞතිකමය නියම පිළිබඳ අපගේ අවබෝධය ඉහළ යාමත් ඒ හා සමගම රසායන සහ ජෛවීය විද්‍යා ක්ෂේත්‍ර පිළිබඳව වූ අපගේ දැනුම ඉහළ යාමත්, හේතු කොට මෙයට පෙර යොදා ගත් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් විද්‍යාව උපයෝගී කර ගැනීමට හැකි වී ඇත.



විශ්වය ප්‍රසාරණය වෙමින් පවතී

නිසැකවශයෙන්ම, මෙවැනි මහත්මා විද්‍යාඥයන් අත්පත්කරගත් ප්‍රගතිය 'විද්‍යාව' පිළිබඳ පැහැදිලි නිර්වචනයක් සැපයීමටත් සමත් වින. ඒ පමණක් නොව එකිනෙකාට සීමා වූ මූලධර්ම, නීති හා රීති සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, භූ විද්‍යාව හා ජීව විද්‍යාව වශයෙන් විද්‍යාව කුටීර තුළට වෙන් කර ප්‍රවර්ග කිරීමටත් එමගින් හැකි විය. එලෙසම දැනුම සහ විද්‍යාව කේන්ද්‍ර ගත වීම, සහ විශේෂිත වීම ද සිදු විය. භෞතිකමය නියම පිළිබඳ අපගේ අවබෝධය ඉහළ යාමත් ඒ හා සමගම රසායන සහ ජෛවීය විද්‍යා ක්ෂේත්‍ර පිළිබඳව වූ අපගේ දැනුම ඉහළ යාමත්, හේතු කොට මෙයට පෙර යොදා ගත් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් විද්‍යාව උපයෝගී කර ගැනීමට හැකි වී ඇත. එතෙක් තාක්ෂණය, විද්‍යාව ඉදිරියට මෙහෙයවූ අතර කුතුහලය විසින් විද්‍යාව ජනනය කරනු ලැබීය. දැන් නව යෙදවුම් සඳහා සහ නව තාක්ෂණ බිහි කිරීම සඳහා විද්‍යාව භාවිත කිරීමට හැකිව තිබේ. මානව සුබ සාධනය, වාණිජමය කටයුතු සහ එදිනෙදා කාර්යයන් සඳහා විද්‍යාව භාවිත කිරීම දැන් පුළුල් අන්දමින් ව්‍යාප්තව ඇත.

මෙහි එක් අතුරු ප්‍රතිඵලයක් වූයේ විද්‍යාව සඳහා යොදා ගත් භාෂාව සංකීර්ණ, ශිල්පීය වීමත් එය පොදු මිනිසාට තේරුම් ගත හැකි එදිනෙදා හුරුපුරුදු භාෂා විලාශයෙන් ඈත් වීමත්ය. විද්‍යාව හා තාක්ෂණය තමන්ගේම වාග් ව්‍යවහාර සම්ප්‍රදායක්, දුරවබෝධය ඇති කරන විෂයානු රූප භාෂාවක් සහ විශේෂිත ප්‍රවේශ සංවර්ධනය කර ගැනීම හේතු කොට කාර්ය නියැලි විද්‍යාඥයන් සහ පොදු ජනතාව අතර පරතරය තව දුරටත් දුරස්ථ කිරීමට සමත් විය. එහෙයින් ඩාර්වින්, නිව්ටන් හෝ ෆ්‍රැන්ක්ලින් වැනි විද්‍යාඥයන්ගේ මුල් කෘති කියවා තේරුම් ගත් අන්දමින් වර්තමාන විද්‍යාඥයන්ගේ මුල් කෘති කියවීමට හෝ කියවා වටහා ගැනීමට හෝ සාමාන්‍ය ජනතාවට තවදුරටත් හැකියාව හා අවස්ථාව නොමැති විය. මේ අතර විද්‍යාඥයන් ද තම ශිල්පීය දැනුම තම ශිල්ප-සමාජයට හෝ වෘත්තියට හෝ සීමා වූ විශේෂිත සඟරාවල පළ කිරීමට ද පියවර ගනු ලැබිණ.

විද්‍යාව ජනප්‍රිය ලෙස ප්‍රචලිත කිරීමට සහ සාමාන්‍ය 'ගිහි' ජනතාවට පහසුවෙන් කියවා තේරුම් ගත හැකි ලෙස ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව මතු වූයේ මෙම සන්දර්භය තුළිනි. තම එදිනෙදා ජීවිතයේදී විද්‍යාත්මක වෘත්තීන් හි නියැලෙන අයට පමණක් නොව විද්‍යාත්මක දැනුම සාකච්ඡාවට ලක් කිරීම සහ එය 'ගිහි' පොදු ජනතාව අතරට ගෙන ඒමට විද්‍යාඥයන් වැනි විශිෂ්ට පුද්ගලයන් මගින් විද්‍යාව ප්‍රචලිත කිරීම පිළිබඳ නව ප්‍රබෝධයක් ඇති වූයේ ද මෙම සන්දර්භය හේතු කොට ගෙනය. විද්‍යාව යන්න මානව අත්දැකීම් හි අංගයක් මිස නුහුරු විෂයයක් නොවිය යුතුය යන්න මෙම තත්වය පසුබිමෙහි පැවති හැඟීම විය.

සියලු චලිත එක් නියම සමූහයකින් විස්තර වෙයි

මෙම තත්වය පසු කර අප බොහෝ දුර පැමිණ සිටින අතර විද්‍යා ලේඛකයාගේ වැදගත්කම වඩ වඩාත් දැනෙන්නට පටන් ගෙන ඇත. වෘත්තිකයන් සහ 'ගිහි' පොදු ජනතාව එකට එක් කිරීමට උත්සාහ දරනුයේ විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා නියැලෙන්නවුන්ය. සමකාලීන සමාජය තුළ විද්‍යාව දිගු සහ හරස් නූල් වියමනක ගෙතී පවතියි. විද්‍යාව මානව ක්‍රියාකාරිත්වයේ සංස්කෘතිකමය සංචරකයක තත්වය ඉක්මවා ගොස් ඇත. විද්‍යාත්මක සාක්ෂරතාව යන පදය මේ හා සම්බන්ධව වැඩි වැඩියෙන් භාවිත වෙයි. ජීවිතයේ උපරිම ඵල නෙලා ගැනීමට සහ වර්තමාන සමාජයෙහි සක්‍රිය සාමාජිකයෙකු වීමට නම් කෙනෙකු විද්‍යාත්මක සාක්ෂරතාවය සහිත අයෙකු වීම අත්‍යවශ්‍ය ය.

සෑම කෙනෙකු තුළම සංගීතය යනු යම් රිද්මයානුකූල රටාවකට සකස් කරගනු ලබන ඉඳහිට අන්තර 12කට හෝ සමහර අවස්ථාවලදී 20කට වෙන් කරනු ලබන අෂ්ටකයේ මූලික ස්වර 8න් සමන්විත බවට වන සංගීත සාක්ෂරතාව පවතියි. මෙය දැනගැනීම සඳහා අප ක්‍රියාකාරී සංගීතඥයන් විය යුතු නොවේ. එලෙසින්ම මුදල් පිළිබඳව, එහි භාවිතය, බැංකු වල සිදුවන කටයුතු, මුදල් ගනුදෙනුවකදී අලාභයක් සිදු කර නොගැනීමට අවශ්‍ය මූල්‍ය සාක්ෂරතාව අප හිමි කර ගෙන ඇත. එසේම අපට 'විද්‍යා සාක්ෂරතාව' ලද හැකිද? මෙම ප්‍රශ්නය විද්‍යාඥයන් දෙදෙනෙකු තුළ යම් කුහුලක් ඇති කිරීමට සමත් විය. ඔවුන් ඇසීමට යොමු වූයේ 'විද්‍යාව අපට ලබා දී ඇති අත්‍යවශ්‍ය සංකල්ප කවරේද? යන ප්‍රශ්නයය. මෙයට දශක දෙකකට පෙර හු භෞතික විද්‍යාඥ ආචාර්ය රොබර්ට් හේසන් සහ භෞතික විද්‍යාඥ ආචාර්ය ජේම්ස් ට්‍රෙෆිල් යන දෙදෙනා එක්ව ඔවුන් විසින් රචිත ''විද්‍යාත්මක කරුණු' යන කෘතිය තුළින් මෙහි පහත දැක්වෙන මහා සංකල්ප-අදහස් ගෙන හැර දැක්වීය.

රට වැසියෙකු දැන සිටිය යුතු මූලික නියම සහ මූල ධර්ම දුසිම් දෙකකට-ශ්‍රේෂ්ඨ සංකල්ප 20කට වඩා නොමැත. මෙසේ හැඳින්වූ සංකල්ප 20 මෙසේය.

(01) විශ්වය ක්‍රමානුකූල (විධිමත්) සහ පෙරැයිය හැකි වූවකි;
(02) සියළු චලිත එක් නියම සමූහයකින් විස්තර වෙයි;
(03) ශක්තිය සංරක්ෂණය වී පවතියි;
(04) ශක්තිය හැම විටම වඩා ප්‍රයෝජනවත් ස්වරූපයක සිට එතරම් ප්‍රයෝජනවත් නොවන ස්වරූපයකට ගලා යයි;
(05) විද්‍යුතය සහ චුම්බකත්වය එකම බලයෙහි අංශ දෙකකි;
(06) සියල්ල තැනී ඇත්තේ පරමාණුවලිනි;
(07) සෑම දෙයක්ම-අංශු, ශක්තිය, ඉලෙක්ට්‍රොන භ්‍රමණ ශීඝ්‍රතාව - වියුත ඒකක වලින් සැපයෙයි. එය වෙනස් නොකර ඔබට කිසිවක් මැනිය නොහැකිය;
(08) ඉලෙක්ට්‍රෝන නම් ''මැලියම්'' මගින් පරමාණු එකට බැඳ තබයි;
(09) ද්‍රව්‍යයක් හැසිරෙන අන්දම එහි පරමාණු ස්කන්ධ ඇති ආකාරය මත රැඳෙයි;
(10) න්‍යෂ්ටික ශක්තිය ලැබෙනුයේ ස්කන්ධය පරිවර්තනය වීම මගිනි;
(11) සෑම දෙයක්ම සත්‍ය වශයෙන්ම තැනී ඇත්තේ ක්වාත (ආනරික්ෂිත අණුපරමාණු වලින් එකක්) සහ ලෙප්ටන වලිනි;
(12) අනෙක් සියල්ලම මෙන්ම තාරකාද ඉපිද නැසී යයි;
(13) විශ්වය අතීතයේ කිසියම් වේලාවක උපත ලබා එවක් පටන්ම ප්‍රසාරණය වෙමින් පවතියි;
(14) සෑම නිරීක්ෂකයෙකුම දකිනුයේ ස්වභාවධර්මයෙහි එකම නියමයන්ය;
(15) පෘථිවියෙහි පෘෂ්ඨය නිරතුරුවම වෙනස්කම්වලට ලක් වෙයි. පෘථිවියෙහි කිසිදු ලක්ෂණයක් ස්ථිරවම නොපවතියි;
(16) පෘථිවිය මත සිදුවන සෑම දෙයක්ම චක්‍රානුකූලව සිදුවෙයි;
(17) සෑම ජීවියෙක්ම, ජීවිතය රසායනික කම්හල් ලෙස සැලකෙන සෛල වලින් තැනී ඇත;
(18) සියලු ජීවයන් එකම ජාන කේතයක් පදනම් කර ගනියි;
(19) සියලු ජීවී ස්වරූප ස්වභාවික වරණය තුළින් පරිණාමය වී ඇත;
(20) සියලු ජීවීන් එකිනෙකට සම්බන්ධය.

මේවා මෙයට වසර විස්සකට පෙර පළ කර ඇති අතරම, බොහෝ දෙනා අතර සාකච්ඡාවට ද ලක්ව ඇත. එසේම ඒවා බොහෝ දෙනා ප්‍රසංශාවට මෙන්ම විවේචනයට ද ලක් කර ඇත. එනමුදු මෙම ශ්‍රේෂ්ඨ සංකල්ප 20ට අතිරේකව අලුත් අදහසක් මේ දක්වා ඉදිරිපත්ව නැත. එබැවින් මෙම කරුණු විද්‍යා සාක්ෂරතාවේ පදනම වන මූලික සංකල්ප සමූහය ලෙස පෙනේ. මෙම රීති පිළිබඳව දැනුමත්, අවබෝධයත් ලැබීම

සහ ඒවා අගයකිරීම තුළින් ප්‍රබුද්ධත්වය සහ සුපෝෂණය වීම ලද හැකිය. ඒ සංගීතය සහ කලාව, ආර්ථිකය, ප්‍රචාරය හෝ ආගම අපගේ එදිනෙදා ජීවිතය ඉහළ තලයකට ගෙන ඒමට සමත් වන බැවිනි. එයට අමතරව විද්‍යාව, අපගේ අගයයන්, විශ්වාස සහ ජීවන රටාවට බලපාන බැවින් එය වඩාත් වැදගත් වෙයි. මෙම තත්වය අගය කිරීම සහ පිළිගැනීම ජීවිතය විචාරශීලී ප්‍රවේශයක් වෙත යොමු කිරීමට සමත් වෙයි.

විද්‍යා ලේඛකයා සංස්කෘතීන් දෙකක් අතර සබඳතා ඇති කරන පාලමක් ලෙස කටයුතු කිරීම වැදගත් වන අතරම විද්‍යාවෙහි සමකාලීනව සිදු වන ප්‍රගතිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේත් යෙදිය යුතුය.

ශ්‍රීමත් සී. පී. ස්නෝ පෙන්වා දුන් පරිදි විද්‍යා ලේඛකයා සංස්කෘතීන් දෙකක් අතර සබඳතා ඇති කරන පාලමක් ලෙස කටයුතු කිරීම වැදගත් වන අතරම විද්‍යාවෙහි සමකාලීනව සිදු වන ප්‍රගතිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේත් යෙදිය යුතුය. විද්‍යාව ප්‍රචලිත කරන්නා වෙතද වගකීමක් පවතියි. ඔහු ''නරක'' විද්‍යාවෙන් ''හොඳ'' විද්‍යාව පෙරා ගත යුතුය. වංචනික විද්‍යාවෙන් අවංචනික විද්‍යාව තෝරා බේරා ගත යුතුය. ඒ සඳහා ඔහු නිරතුරුවම විද්‍යාව සමග ගැවසෙන්නෙකු විය යුතුය. ඔහු විද්‍යාත්මක කටයුතුවල නියැලෙන්නෙකු හෝ අඩුතරමින් විද්‍යාත්මක සංකල්පය නිපදවන්නෙකු හෝ විශ්ලේෂකයෙකු හෝ වේ නම් එය වඩාත් උචිතය.



ශ්‍රීමත් සී. පී. ස්නෝ

නවීන විද්‍යාව පිළිබඳව ජනතාව තුළ පවත්නා සංජානනය දෙආකාරය. එක් අතකින් ජනතාව එය අගය කරයි. අනෙක් අතින් එදෙස සැක සංකාවෙන් යුතුව බලයි. භෞතික විද්‍යාවන් පිළිබඳ දැනුමෙහි ලැබී ඇති ප්‍රගතිය, භූ කේන්ද්‍රීය ආකල්පයන්ගෙන් මුදා ගෙන ඇත. ගැලිලියෝගේ සිට නිව්ටන් දක්වා පැමිණෙන විට සහ විශ්වය පිළිබඳ පැහැදිලි කිරීම් තව දුරටත් ලැබෙන විට විශ්වය තුළ මිනිසා සිටින ස්ථානය බොහෝ වෙනස්කම්වලට ලක්ව ඇත. ඉමහත් වූ විශ්වය තුළ අප ඉතා කුඩා තිතක් බව අවබෝධ කර ගැනීමට එමගින් හැකිවී ඇත. එය අපට නිහතමානීකම උගන්වා ඇත. එසේම එය අප හට තවදුරටත් විප්ලවකාරී ලෙස සිතීමට පෙළඹවීමට සමත්ව ඇත. පෘථිවියෙන් බැහැර බුද්ධිමය ජීවීන් සිටිය හැකි බවටත්, එවැනි පරසක්වල බුද්ධීන් ගැන සොයා යෑමට අපට හැකි වේය යනාදිය එවැනි සිතුවිලි අතර වෙයි. ඉතා කැපී පෙනෙන තාරකා භෞතික විද්‍යාඥයෙකු සහ විද්‍යාව ප්‍රචලිත කරන්නෙකු ලෙස ක්‍රියා කළ ආචාර්ය කාර්ල් සේගාන්, සෙටී (සර්ච් ෆො එක්ස්ට්‍රා ටෙරස්ටියල් ඉන්ටෙලිජන්ස්) ලෙස හැඳින්වෙන එවැනි බුද්ධිමය ජීවීන් පිළිබඳ හඹායාමට මහත් ඕනෑකමක් හා පෙළඹවීමකින් යුතුව යෝජනා කිරීම මෙහිදී සැලකිල්ලට යොමු විය යුතුය. ඔහුගේ ලිපි, රචනා මෙන්ම රූපවාහිනී වැඩසටහන් ද ලෝක ජනතාව සුපෝෂණය කිරීමට සමත්වින. මෙයට අමතරව ආචාර්ය කාල් සේගාන් සිය අවධානය ඔහු විසින් හඳුන්වා දුන් ''භූතයන්'' හෝ විද්‍යාව පිළිබඳව ජනතා සිත් තුළ පවත්නා සැක සංකා හෝ වෙත ද යොමු කළ අයෙකි.



සියල්ල තැනී ඇත්තේ පරමාණුවලිනි

නව ජෛවීය විද්‍යාව මෙවැනි ''භූතයන්'' එනම් ක්ලෝනකරවීම, ජාන වෙනස් කිරීම් (ට්‍රාන්ස්ජෙනික්ස්) සම්ප්‍රදායික හුරුපුරුදු නව අකෘතීන් ලෙස හිමිකම් ලියාපදිංචි වීම ආදියෙන් බහුලය. මේවා උදාහරණ කිහිපයක් පමණක් වන නමුත් ඒ කිසිවක් 'භූතයන්' විය නොයුතුය. විද්‍යාව ප්‍රචලිත කිරීමේ නියැලෙන්නන්ගේ කාර්යය විය යුත්තේ මේ එක් එක් 'භූතයා' රැගෙන එහි පරාමිතීන් සහ පිරිවිතර මතුකර දක්වමින් ඒවායෙහි හිතකර හා අහිතකර යන දෙඅංශයේම බලපෑම් සාකච්ඡාවට ලක් කිරීමය. මෙහිදී ඔහුගේ සමාජයීය වගකීම විය යුත්තේ කිසියම් අදහසක්, ආකල්පයක්, ක්‍රමයක්, සංකල්පයක් හෝ ද්‍රව්‍යයක් හෝ වුව යෝග්‍යද යන්න විමසීමත් ඉන් ලැබිය හැකි ප්‍රයෝජන කවරේද යන්න සාකච්ඡාවට ලක් කිරීමත්ය. විද්‍යාවෙහි ප්‍රගතිය ශීඝ්‍රව සිදුවෙයි. සමාජයීය ආකල්ප සහ අදහස් විශේෂයෙන්ම නීතිය හා නෛතික දර්ශනයන්හි වෙනස්වීම් ඇතිවන්නේ එයට වඩා මලානික වූ වේගයකිනි. ඉතා සෙමිනි. පොදු ජනතාවගේ ගනුදෙනුවලදී විද්‍යාවේ බලපෑම විවාදයට ලක් කළ යුතුය. විද්‍යාව ප්‍රචලිත කරන්නන්හට කාර්යභාරය නිසි ලෙස ඉටු කරනු ලැබූයේ නම් ඒ තමන් ඉතා වැදගත් සේවයක් ඉටු කළ බවට ආස්වාදයක් ලද හැකිය.

(ප්‍රංශයේ පැරිස් නුවර දී වර්ෂ 1997 සඳහා වන යුනෙස්කෝ කාලිංග ත්‍යාගය පිරිනැමීමේදී පැවැත්වූ දේශනය අනුසාරයෙන් සැකසින)

මහාචාර්ය ඩී. බාලසුබ්‍රමනියන්

ප්‍රකට විද්‍යා සන්නිවේදකයෙකු වන ඉන්දීය ජාතික මහාචාර්ය ඩී. බාලසුබ්‍රමනියන් වර්තමානයේ හයිදාබාද් එල්. වී. ප්‍රසාද් අක්ෂි රෝහලේ අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කරයි. හයිදාබාද් විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකු සහ පීඨාධිපතිවරයෙකු වශයෙන් සේවය කළ මෙම කතුවරයා යුනෙස්කෝ මගින් විද්‍යාව ප්‍රචලිතකිරීම සඳහා පිරිනමන කාලිංග සම්මානය (1997), ඉන්දියානු රජය මගින් පිරිනමනු ලබන ''පද්මශ්‍රී'' සම්මානය (2002), සහ ප්‍රංශ රජය මගින් ප්‍රදානය කරනු ලබන "Chevalier de L'ordre National de Merite" සම්මානය ඇතුළු සම්මාන රාශියක් හිමිකරගෙන ඇත.

විද්‍යා සන්නිවේදනය එදා, අද සහ හෙට

ආචාර්ය ජයන්ත වත්තවිදානගේ

විද්‍යා සන්නිවේදනය යනු කුමක්ද?, විද්‍යා සන්නිවේදනය කළ යුත්තේ ඇයිද?, ඒ කුමන දිශාවකටද? යන්න පිළිබඳ වටහා ගැනීමට සහ විද්‍යා සන්නිවේදනය තීව්‍ර කිරීම සඳහා තව තවත් ප්‍රමාද නොවිය යුතුය. ජාතික සංවර්ධනය සහ ඉදිරි ගමන වේගවත් කිරීම සඳහා විද්‍යා සන්නිවේදනයට කළ හැකි මෙහෙවර අපමණය.

මෙම ලිපිය මගින් විද්‍යාව ජනතාව අතට ගෙන යාම හෙවත් විද්‍යාව ජනප්‍රිය භාවයට පත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳවත්, ඒ සඳහා භාවිත කෙරෙන විවිධ ක්‍රමවේද පිළිබඳවත් එහි අතීතය, වර්තමානය හා අනාගතය පිළිබඳවත් කරුණු විමසා බැලෙයි.

විද්‍යාව තේරුම් ගැනීම යන්නෙන් අදහස් කොට ඇත්තේ විද්‍යාත්මක කරුණු, සංකල්ප හා ප්‍රතිපත්ති පිළිබඳවත් ඒවා පෞද්ගලික, සමාජයීය හා ආර්ථික යහපැවැත්ම කෙරෙහි බලපාන ආකාරයත් පිළිබඳවත් අවබෝධයක් ලබා ගැනීමයි.

යම්කිසි විෂයක් හෝ දර්ශනයක් ජනප්‍රිය වන්නේ හෝ ජන අප්‍රිය වන්නේ ඒ පිළිබඳව කිසියම් අවබෝධයක් ජනතාව තුළ හටගත් පසුවය. එබැවින් පළමුව මේ සියවස් පහක් තරම් පැරණි වූ, සත්‍ය සොයාගැනීම පිණිස භාවිත කෙරෙන වඩාත් විශ්වසනීය වූ නවීන විද්‍යාව නම්වූ ක්‍රම වේදය පිළිබඳව පැහැදිලි අවබෝධයක් පොදු ජනතාව තුළ ඇති කළ යුතුය. මේ සඳහා භාවිත කෙරෙන විවිධ ක්‍රමවේද අතර විද්‍යා දින, විද්‍යා ප්‍රදර්ශන, වැඩමුළු, දේශන වැනි සීමිත පිරිසක් සඳහා සංවිධානය කෙරෙන ක්‍රියාකාරකම්වලට අමතරව ජනමාධ්‍ය භාවිතයද බහුලව සිදුවේ. ඊට අමතරව ලෝකයේ බොහෝ නගරවල විවිධ ක්‍රියාකාරකම් සිදු කිරීම මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගත හැකි ආකාරයේ විද්‍යා මධ්‍යස්ථාන පිහිටුවා තිබෙයි. මේ අයුරින් ප්‍රජාවේ පොදු සංස්කෘතිය තුළට විද්‍යාවේ සංස්කෘතියත්, විද්‍යාවේ දැනුම් සම්භාරයත් එක් කිරීම සඳහා වූ සියළු ක්‍රියාදාමයන්ගේ එකතුව විද්‍යා සන්නිවේදනය ලෙස හැඳින්වේ.



තෝමස් හක්ස්ලිගේ, "සොබාදහමේ මිනිසාට හිමි තැන" නමැති ග්‍රන්ථය

මෙම කටයුත්ත සඳහා ජනමාධ්‍ය භාවිතය සැලකීමේදී විද්‍යා ලේඛන කලාව හෙවත් විද්‍යා පුවත්පත් කලාව, හෙවත් විද්‍යා ජන මාධ්‍ය වේදය පුවත්පත් කලාවේ (ජන මාධ්‍යයේ) නව ශාඛාවක් ලෙසට වර්ධනය වූ අතර එමගින් විද්‍යාව පිළිබඳ විවිධ තොරතුරු හා සිදුවීම් මහජනතාව වෙත වාර්තා කිරීම සිදු විය. කෙසේ වෙතත් විද්‍යාත්මක දැනුම සහ සංකල්ප ඉතාම කාර්යක්ෂම ලෙස ජනතාව අතරට ගෙනයාමට නම් එම කාර්යයෙහි යෙදෙන්නන් හට විද්‍යාව පිළිබඳ පමණක් නොව ජනමාධ්‍ය භාවිතය පිළිබඳවත් නිරවුල් අවබෝධයක් තිබිය යුතුය.

ඒ සමගම අප පැහැදිලි කර ගත යුතු තවත් අංගයක් නම් විද්‍යා සන්නිවේදනය සහ විද්‍යා අධ්‍යාපනය යන ක්‍රියාවලීන් එකිනෙකට වෙනස් වන්නේද යන්නයි.

පොදු, සම්මුතියට අනුව නම් විද්‍යා අධ්‍යාපනය යනු විද්‍යාව විෂය ක්ෂේත්‍රයක් ලෙස අධ්‍යනය කිරීමට තීරණය කොට ඒ සඳහා කැපවී සිටින පිරිසකට විද්‍යාව ඉගැන්වීමයි. මෙය බොහෝ විට ප්‍රාථමික, ද්විතීයික හා තෘතියික අධ්‍යාපන ආයතනවල විධිමත් ලෙස සිදු කෙරෙන ක්‍රියාවලියකි. මෙලෙස සිදු කෙරෙන විද්‍යා අධ්‍යාපනය මගින් ප්‍රධාන අදහස් දෙකක් ඉටු විය යුතු බව බොහෝ විද්‍යා අධ්‍යාපන විශාරදයන්ගේ අදහසය.

- ප්‍රජාව විසින් විද්‍යාව තේරුම් ගැනීම.
- ප්‍රජාව විද්‍යාව පිළිබඳ වැටහීමක් හෙවත් සම්ප්‍රජානනයක් ඇති කර ගැනීම.

විද්‍යාව තේරුම් ගැනීම යන්නෙන් අදහස් කොට ඇත්තේ විද්‍යාත්මක කරුණු, සංකල්ප හා ප්‍රතිපත්ති පිළිබඳවත් ඒවා පෞද්ගලික, සමාජයීය හා ආර්ථික යහපැවැත්ම කෙරෙහි බලපාන ආකාරයත් පිළිබඳවත් අවබෝධයක් ලබා ගැනීමයි. විද්‍යාව වැටහීම හෙවත් සම්ප්‍රජානනය යනු විද්‍යාව සහ තාක්ෂණය කෙරෙහි යොමු වූ ආකල්ප සමූහයක්, හුරුබවක් සහ ළැදි බවකි. මෙහිදී පෙනෙන්නේ විද්‍යාව හා තාක්ෂණය කෙරෙහි යොමු වූ කුසලතා සමූහයක් තුළින් ප්‍රකට වන විශ්වාස හා හැඟීම් පද්ධතියක් හටගන්නා බවයි.

කෙසේ වෙතත් විද්‍යාව හා තාක්ෂණය ප්‍රජාව තුළ ප්‍රචලිත කිරීම ප්‍රජාවේ පුළුල් පරාසයක් එල්ල කොට සිදු කෙරෙන අතර එය අත්‍යවශ්‍යයෙන්ම, අන්තර් ක්ෂේත්‍ර ප්‍රවේශයක් විය යුතුය. ඒ සඳහා විවිධ ක්ෂේත්‍රවල දැනුම් සම්භාරයක් හා ක්‍රමවේදයක් භාවිත කළ හැකිය. මෙසේ පොදු ජනතාව වෙත විද්‍යාව හා තාක්ෂණය හොඳින් ලංවී හුරු වූ විට එදිනෙදා ජීවිතයේදී ඔවුන් දේශපාලනය වැනි විෂයන් පිළිබඳව ඔවුන්ගේ අදහස් දක්වන අයුරින් විද්‍යාත්මක කරුණු පිළිබඳවද අදහස් දක්වනු ඇත.

එය එසේ විය යුත්තේ එමගින් ජනතාවගේ ජීවන තත්වය ඉහළ දැමීම පිණිසත්, අනාගත ශ්‍රම බලකාය බල ගැන්වීම පිණිසත් ඔවුන් වෙත විද්‍යා සංස්කෘතියක් උරුම කර දීම සඳහාත් එය මහත් පිටිවහලක් වන බැවිනි. එපමණක් නොව පොදුවේ මහජනතාව විද්‍යාව පිළිබඳව ළැදි බවක් හා හුරුවක් තිබීම ඔවුන් පොදු තීරණ ගැනීමේදී සහ පොදු ප්‍රතිපත්ති සම්පාදනයේදී ද අතිශය වැදගත් වේ. ඊට අමතරව විද්‍යා පර්යේෂණයන්හි ප්‍රතිඵල සමාජයේ යහපැවැත්මට භාවිතයට ගැනීමද පහසු කරවන අතර සමාජය තුළ වඩාත් ඉහළ විද්‍යා අවබෝධයක් ඇති කිරීම සඳහාද එය එමගින් අවස්ථාව සලසයි.

මයිකල් පැරඩේ

ශ්‍රී ලංකාව තුළ වසර දෙදහස් පන්සියයක පමණ අතීතයේ සිට අද දක්වා ශිෂ්ටාචාරය තුළ බොහෝ විද්‍යාත්මක සංකල්පයන්ට සමාන්තර අදහස් හා ඒ සම්බන්ධ කුසලතා ද ඉතා හොඳින් ප්‍රචලිත වී තිබීම සිත් ගන්නා සුලුය.

මිහිඳු මාහිමියන් විසින් දේවානම් පියතිස්ස රජතුමාට දෙන ලදැයි සැලකෙන අවවාදය ප්‍රධාන සන්ධි ස්ථානයක් ලෙස සැලකෙයි. ''මහ රජ, අහසේ සරණ සියොතුන්, වන මෘගයන් හටද ඔබට මෙන්ම මෙම භූමියේ ඕනෑම තැනක වාසය කිරීමේ අයිතියක් ඇති අතර මෙම භූමිය ජනතාවටත්, සියලු ජීවීන්ටත් අයිති වන අතර ඔබ එහි ආරක්ෂකයා පමණි''.

මෙම අවවාදය පිළිගත් දෙවනපැතිස් රජතුමා විසින් මිහින්තලය පළමු අභය භූමිය ලෙස රාජ අණින් සම්මත කළ බවත් රජු ඇතුළු ජනතාව පරිසරයේ වූ ජීව අජීව සංඝටකයන් අතර වූ අන්තර් සම්බන්ධතාවය සංවේදී ලෙස තේරුම් ගෙන දිවි ගෙවූ බවත් ඉතිහාසය තුළින් ප්‍රකට වන කරුණකි. කෙසේ වෙතත් අද සමස්ත මිහිතලයම මුහුණ දී ඇති ප්‍රබලතම පරිසර ගැටළුවටත් ප්‍රධාන ලෙසම තුඩු දෙන නූතන මිනිසාගේ අධික ශක්ති හා සම්පත් තිරසාර ලෙස භාවිත කිරීමේ සංකල්පය එකල පොදු ජනතාවගේ සංකල්පයක් බවට පත්වී තිබුණු නිසා විය යුතුය. සරල ඇඳුම් පැළඳුම්, සරල ආහාර හා සරල දිවි පැවැත්ම පිළිබඳ පරිසර හිතකාමී සංකල්පයන් සහ සියලු ජීවීන් සමග මිහිතලය බෙදා හදා ගැනීම පිළිබඳ සංකල්පයන් ද, ඒ අනුව හැඩ ගැසුනු සංකල්පයන් ද පොදු ජනතාවගේ සංකල්පයන් හා චර්යාවන් බවට පත්වී තිබීම පරිසර ගැටළු අවම කර ගැනීමට බලපෑ බව ඉතිහාසය පිළිබඳ බොහෝ මූලාශ්‍ර පෙන්වා දෙයි.

දැන් අපි පසළොස් වැනි හා දහසය වැනි සියවස්වල යුරෝපයෙහි ජනිත වූ නවීන විද්‍යාව ජනතාව අතරට ගෙනයාම සඳහා වූ විද්‍යා සන්නිවේදනය ආරම්භ වූ අයුරු දැන් සලකා බලමු. නවීන විද්‍යාව නමැති, සත්‍ය සොයා ගැනීම සඳහා භාවිත කළ හැකි මෙම නව ක්‍රමවේදය ආරම්භ වූයේ ගැලිලියෝ ප්‍රමුඛ විද්වතුන් කිහිප දෙනෙකුගේ දායකත්වයෙනි. එසේ නමුත් නවීන විද්‍යාව තුළින් මතු වූ බොහෝ සත්‍යයන් එකල ජන සමාජයෙහි මුල්බැසගෙන තිබූ අදහස් වලට පටහැනි වූ නිසාත් ඒවා සොයා ගත් මේ නව ක්‍රමවේදය නිසා යුරෝපයේ බොහෝ රටවල රාජ්‍ය තන්ත්‍ර, විවිධ ආගමික සංවිධාන හා සිවිල් සංවිධාන විසින් මේ නව ක්‍රමවේදය හා ඉන් ජනිත වූ අදහස් ප්‍රතික්ෂේප කරන ලදී. මෙනිසා නවීන විද්‍යාව හා පොදු ජනතාව අතර විශාල පරතරයක් හට ගැණිනි. කොටින්ම කියතොත් මේ නවීන විද්‍යාත්මක අදහස් ජනතාව අතර ප්‍රචලිත කිරීම, මරණය හෝ ඊට ආසන්න දඬුවම් ලැබිය හැකි වරදක් විය.

නවීන විද්‍යාව නමැති, සත්‍ය සොයා ගැනීම සඳහා භාවිත කළ හැකි මෙම නව ක්‍රමවේදය ආරම්භ වූයේ ගැලීලියෝ ප්‍රමුඛ විද්වතුන් කිහිප දෙනෙකුගේ දායකත්වයෙනි.

කෙසේ වෙතත් 18 වන සියවසෙහි දී බ්‍රිතාන්‍යයෙහි ''රාජකීය සංගමය'' ප්‍රථම වරට විද්‍යාත්මක තොරතුරු හා නවීන විද්‍යාව පිළිබඳ විධිමත් හා නොවිධිමත් සංවාද සිදුවන ස්ථානයක් බවට පත් විය. එසේ නමුත් මෙම සාකච්ඡාවලට සහභාගි වූයේත්, සහභාගිවිය හැකි වූයේත් සමාජයේ ඉහළ පන්තියට අයත් පුද්ගලයන්ට පමණි. එම සියවසෙහිදීම බ්‍රිතාන්‍යය කේන්ද්‍ර කොටගෙන හටගත් කාර්මික විප්ලවයෙහි ප්‍රතිඵලය ලෙස ඇති වූ කර්මාන්තශාලාවල සේවය කරන, මෙම නව චින්තනයෙහි භාවිත හා සම්බන්ධ වූ නව ශ්‍රම බලකායක් ද, ජනතාව අතුරෙන් හටගැනීම සිදු විය.

ඒ අතර 1799 දී බිහිවන ''බ්‍රිතාන්‍ය රාජකීය ආයතනය'' විද්‍යාව පිළිබඳ සාකච්ඡා, සංවාදයන් සඳහා සමාජයේ සියලු පන්තීන්ට අයත් සාමාජිකයින් හවුල් කර ගත් ප්‍රථම ආයතනය විය. ඒ බව පැහැදිලි වන්නේ රාජකීය ආයතනයෙහි පර්යේෂණාගාර සහ දෙසුම් හල හම්ප්‍රි ඩේවි වැනි මධ්‍යම පන්තිකයන්ටත්, මයිකල් පැරඩේ වැනි පහළ පන්තියේ පුද්ගලයන්ටත්, භාවිත කිරීම සඳහා ඉඩ සලසා දීම මගිනි. එපමණක් නොව එම වසරෙහි රාජකීය ආයතනයෙහි වාර්ෂික නත්තල් දේශනය ද මයිකල් පැරඩේ වෙත පිරිනැමීම මගින් මෙය තව දුරටත් පැහැදිලි වේ. ඉන් පසුව බ්‍රිතාන්‍ය විද්‍යාභිවර්ධන සංගමය ආරම්භ කිරීම, විද්‍යාව ජනප්‍රිය භාවයට පත් කිරීම සඳහා වූ සන්නිවේදනයෙහි ප්‍රධාන සන්ධිස්ථානයක් විය. සංගමයේ එක් අභිමතාර්ථයක් වූයේ විද්‍යාව පිළිබඳ පොදු ජනතාවගේ අවධානය ලබා ගැනීමටත්, විද්‍යාවේ ඉදිරි ගමන වැළැක්වීමට තුඩු දෙන ජන මත ඉවත් කිරීමත්ය. බ්‍රිතාන්‍ය විද්‍යාභිවර්ධන සංගමයේ ආරම්භයත් සමග එයින් උත්තේජනයට පත් වීම නිසා එවකට බ්‍රිතාන්‍යයෙහි යටත් විජිත ලෙසට පැවති රටවල ද විද්‍යාභිවර්ධන සංගම් බිහි විය. මේ අනුව 1848 දී ඇමරිකාවේ ද, 1888 දී ඕස්ට්‍රේලියාවේ ද, 1903 දී දකුණු අප්‍රිකාවේ ද විද්‍යාභිවර්ධන සංගම් පිහිට වූ අතර 1888 දී ඉන්දීය විද්‍යාභිවර්ධන සංගමයත්, ඉන්දීය විද්‍යා කොන්ග්‍රසයත් ආරම්භ විය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ විද්‍යාභිවර්ධන සංගමය පිහිටුවන ලද්දේ 1944 දීය.



තෝමස් හෙන්රි හක්ස්ලි

පොදු ජනතාව අතරට විද්‍යාව සන්නිවේදනය කිරීම සැලකීමේ දී බ්‍රිතාන්‍ය ජාතික තෝමස් හෙන්රි හක්ස්ලි (Thomas Henry Huxley) ගෞරවයෙන් සිහිපත් කළ යුතු චරිතයකි. සිංහල භාෂාවෙන් පළවූ මුල් යුගයේ විද්‍යා කෘති අතර මහ ගත්කරු මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ''ග්‍රාමීය විද්‍යා ප්‍රවේශය'' සහ ''සත්ව සන්නතිය'' දැක්විය හැකිය. ශ්‍රී ලංකාවෙහි පුවත්පත් මාධ්‍යයෙහි නවීන විද්‍යාව පදනම් කොටගෙන ලියූ ප්‍රථම සිංහල ලිපිය ලෙස සැලකෙන්නේ 1882 ලක්මිණි පහන පත්‍රයේ පලවූ පෝෂණය සම්බන්ධ ලිපියකි. ඉන් පසුව 1833 දී සත්‍යාලංකාරය පත්‍රයෙහි ධූමකේතුවක් පිළිබඳ තොරතුරු පළ විය. 1950 දශකයෙන් පසුව ශ්‍රී ලංකාවේ සිංහල විද්‍යා සන්නිවේදනයේ පිබිදීමක් ඇති විය. එයට මූලික වූවන් අතර ආචාර්ය ඊ. ඩබ්. අදිකාරම් (එතුමා නවීන විද්‍යා සඟරාවේ සංස්කාරක වරයා ද විය), ආචාර්ය එම්. ඩබ්. කරුණානන්ද, වෛද්‍ය බුද්ධදාස බෝධිනායක ('විද්‍යා' සඟරාවේ සංස්කාරකවරයා



ආචාර්ය ඊ. ඩබ්. අදිකාරම්

වෛද්‍ය බුද්ධදාස බෝධිනායක



මහාචාර්ය නන්දදාස කෝදාගොඩ

ද විය. විද්‍යා සඟරාව පසු කලෙක මහාචාර්ය ටියුලි ද සිල්වා සහ තුසිත මලලසේකර දෙපළ විසින් බොහෝ කලක් සංස්කරණය කරනු ලැබීය). ධනසිරි බෝධිනායක (ලේක්හවුස් ප්‍රකාශනයක්වූ විදුනැණ පුවත්පතේ සංස්කාරක) මහාචාර්ය නන්දදාස කෝදාගොඩ, (එතුමා යුනෙස්කෝ කාලිංග ත්‍යාගයට නම් කළ අතරම ලක්ෂ්මි. එස්. බෙගන් ජාත්‍යන්තර සම්මානයෙන් ද පුද ලැබීය). බන්දුසීලද සිල්වා (ප්‍රථම සිංහල විද්‍යා ශබ්ද කෝෂය) සංස්කාරක මෙන්ම පසු කලෙක තාරකා විද්‍යා ලේඛකයෙකු ලෙස ප්‍රකට වූ අනුර සී. පෙරේරා සමග ජන ප්‍රකාශනයක් වූ ''විදුමිණ'' පුවත්පත සංස්කරණය කළේය. ඔහු පසුව එස්. එම්. බන්දුසීල ලෙස ප්‍රකට වූ අතර ආතර් සී. ක්ලාර්ක් මහතාගේ පොත් විශාල සංඛ්‍යාවක් පරිවර්තනය කිරීමට ද යොමු විය. ''විද්‍යා දින'' නමින් සඟරාවක් ද එකල පළ විය. ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය මගින් පළ කළ ''විද්‍යා ව්‍යාප්ති'' සඟරාව ද කලක් විද්‍යාත්මක දැනුම බෙදා හැරීමට දායක විය. 1988 දී උපාලි ප්‍රකාශනයක් ලෙස අනුර සිරිවර්ධන ගේ සංස්කාරකත්වයෙන් ඇරඹූ 'විදුසර' පුවත්පත අද ද පළ වෙයි. සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය විසින් වසර 40ක පමණ කාලයක් ප්‍රකාශයට පත් කරන ''සැපත'' සඟරාව ද වෛද්‍ය විද්‍යාත්මක දැනුම නංවාලීමේ මහඟු කාර්යක් ඉටු කරයි. ජාතික විද්‍යා සභාව විසින් වර්ෂ 1976 දී ආරම්භ කළ 'විදුරාව' සඟරාව ප්‍රකාශනය අද ද, එහි අනුප්‍රාප්තික ජාතික විද්‍යා පදනම විසින් සිදු කරනු ලබයි.

ආරම්භයේ සිටම 'නවයුගය' සඟරාව විද්‍යා සන්නිවේදනයේ කැපී පෙනෙන වෙනසක් කරනු ලැබීය. ''ලංකාදීප'' පුවත්පත කලක සිටම සතිපතා විද්‍යා අතිරේකයක් පළ කරයි. ''විද්‍යා විත්ති'' නමින් එය මුල් යුගයේදී ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් විසින් සංස්කරණය කළ අතර පසුව ටික කලක් තුසිත මලලසේකර විසින් සංස්කරණය කරනු ලැබීය. 'විජය', 'මිහිර' වැනි ළමා පුවත්පත්, 'තරුණී', 'සිරිකත', 'නවලිය' වැනි කාන්තා පුවත්පත් සිංහලෙන් විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා බොහෝ සහයක් ලබා දෙමින් එදා මෙන්ම අද ද කටයුතු කරනු පෙනේ. මෑත කාලයේදී 'ලක්බිම' පුවත්පත මගින් නොමිලයේ ලබා දෙන 'සමුදුර' සාර සංග්‍රහය ද විද්‍යා සන්නිවේදනය සඳහා දායක වෙයි. ආචාර්ය උපාලි එම්. සේනානායක, අතුල මංචනායක, වෛද්‍ය විලියම් ද අල්විස්, කේ. ආරියසිංහ, කේ. ආර්. අභයසිංහ, නාලක ගුණවර්ධන, ආචාර්ය ජයන්ත වත්තවිදානගේ, එඩ්වින් ආරියදාස, පර්සි ජයමාන්න, ඩී. අමරසිංහ, ආර්. ඩී. ජේ. අතපත්තු, මහින්ද රණවීර, බෙනඩික්ට් දොඩම්පෙගම ජෝසප් ඩැනිස්ටර් කුරේ වැනි ලේඛකයන් ද

පෙර නම් සඳහන් කළ ලේඛකයන්ට අමතරව සිංහලෙන් විද්‍යාව ජනප්‍රිය කිරීම සඳහා දායක වූ සිංහල ලේඛකයන් අතර පුරෝගාමී වූ අයගෙන් කිහිප දෙනෙකි.

අද ශ්‍රී ලාංකීය ප්‍රජාවෙහි ස්වභාවය විමසා බැලීම අන් බොහෝ සංවර්ධන කටයුතු සැලසුම් කිරීම මෙන්ම විද්‍යා සන්නිවේදනය සඳහා ද වැදගත් වේ. ජනගහනයෙන් 74% නිල කටයුතු සහ අනෙකුත් කටයුතු සඳහා සිංහල භාෂාව භාවිත කරති. 8% විවිධ භාෂා භාවිතයෙහි යෙදෙයි. සතිපතා පුවත්පත් 36ක් පමණ පළවන අතර ව්‍යාප්තිය 1000:94ක් වේ. ප්‍රධාන දිනපතා පුවත්පත් 12ක් පමණ පවතින අතර ඒවායේ ව්‍යාප්තිය දළ වශයෙන් 1000:38ක් පමණ වේ (පුද්ගලයන් 1000කට පුවත්පත් 38). දේශීය රූපවාහිනී මාධ්‍ය ආයතන 21ක් පවතින අතර රූපවාහිනී ග්‍රාහකයන්ගේ ප්‍රතිශතය 1000:78.8ක් පමණ වේ. පසුගිය සංගණනයට අනුව අන්තර්ජාල පහසුකම් 1000:6.3ක ප්‍රතිශතයක් තිබුනද එම ප්‍රතිශතය ශීඝ්‍රයෙන් ඉහළ යන බවක් දක්නට ලැබේ. ඒ සමගම කේබල් රූපවාහිනී ග්‍රාහකයන්ගේ ප්‍රතිශතය ද ශීඝ්‍රයෙන් ඉහළ යයි. කෙසේ වෙතත් කණගාටුවට කරුණ නම් අන්තර්ජාලය හා කේබල් රූපවාහිනී හැරුණු කොට දේශීය රූපවාහිනී නාලිකා, FM නාලිකා සහ පුවත්පත්වල විද්‍යාව සන්නිවේදනය සඳහා දී ඇති ඉඩකඩ ඉතා අල්ප වීමය. මාධ්‍ය ආයතනවල ප්‍රධානීන්ගෙන් මේ පිළිබඳව විමසූ විට ඔවුන් පොදුවේ පවසන කාරණය නම් විද්‍යුත් මාධ්‍ය සඳහා වන, වැඩසටහන් නිෂ්පාදනය හා විකාශනය කිරීම අතිශය මිල අධික කටයුත්තක් බවත් ඒ සඳහා අනුග්‍රහය දක්වන ආයතන විරල බවත්ය. මෙහිදී මතුවන ගැටළු කිහිපයක් වෙයි.

ජනතාවගේ සුබ සිද්ධිය, සංවර්ධනය හා යහපැවැත්ම කෙරෙහි ඔවුන් එදිනෙදා මුහුණ දෙන ගැටළු විද්‍යාත්මක ලෙස විසඳා ගැනීම වැදගත් නම් ජාතික සංවර්ධනය උදෙසා විද්‍යා සන්නිවේදන කාර්යය කෙසේ හෝ කළ යුතුය. නමුත් එසේ කිරීම සඳහා ඇති අවකාශය අඩු වී ඇත්තේ එම තොරතුරු සඳහා වෙළඳ වටිනාකමක්, ඉල්ලුමක් නොමැති බැවිනි. එසේ නම් ගැටළුව විසඳා ගත හැක්කේ කෙසේද?

රාජ්‍ය මාධ්‍ය හා රජය, මෙය ජාතික අවශ්‍යතාවයක් සේ සලකා විද්‍යා සන්නිවේදනයට යටිතල පහසුකම් සලසාදිය යුතුය. එසේත් නැතිනම් විද්‍යා සන්නිවේදනය, එනම් ජනතාව අතරට ගෙන යන විද්‍යාත්මක ක්‍රමවේදය හා තොරතුරු වෙළඳ වටිනාකමක් ඇති ආකර්ෂණශීලී භාණ්ඩයක් බවට පත් කළ යුතුය. මෙය ජනමාධ්‍යවේදීන් වෙත මෙන්ම විද්‍යාඥයන් වෙත පැවරී ඇති අභියෝගයකි.

මෙම අභියෝගයට මුහුණ දීම සඳහා ජනමාධ්‍යවේදීන් මෙන්ම පර්යේෂණවල යෙදී සිටින විද්‍යාඥයන් ද බලවත්කරණය කිරීමෙහිලා ජාතික විද්‍යා පදනමත්, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයත් කර ඇති කාර්යභාරය ප්‍රශංසා කටයුතුය. මෙම ආයතන මගින් විද්‍යා සන්නිවේදනයෙහි කාර්යක්ෂමතාව හා ආකර්ෂණීය ලෙස යෙදෙන මාධ්‍යවේදීන් ජාතික මට්ටමෙන් ඇගයීමට ලක් කෙරෙමින් දිරි දීම සිදු කරයි. පාසල් ප්‍රජාව වෙත විද්‍යාව රැගෙන යාම පිළිබඳ විවිධ වූ ක්‍රියාකාරකම් රැසක් සිදු කෙරෙන අතර, සමහර ක්‍රමවේදයන් ඉතාමත් ආකර්ෂණීය වන බව ඒ පිළිබඳ තොරතුරු සොයාබැලුවහොත් ඔබටත් වැටහෙනු ඇත.

ඒ අතර ජාතික විද්‍යා පදනම මගින් වසර කිහිපයක සිට පර්යේෂණවල යෙදී සිටින විද්‍යාඥයන්ට, පොදු ජනතාව වෙත විද්‍යා සන්නිවේදනය කිරීම පිළිබඳ දැනුම හා කුසලතා ලබා දීමේ වැඩපිළිවෙළක් දියත් කොට තිබෙන අතර එහි ප්‍රතිඵල ලෙස ඊට සහභාගි වූ බොහෝ දෙනකු අතින් බිහිවන නිර්මාණ මෙම වැඩපිළිවෙළෙහි සාර්ථකත්වයට සාක්ෂි සපයයි.

විද්‍යාව ජනප්‍රිය කිරීමෙහි වැදගත්කම විවිධ අංශ ඔස්සේ විහිදෙයි. සෘජු ලෙසට විද්‍යාවේ හා තාක්ෂණයේ දායකත්වය මත දේශයෙහි ආර්ථික වර්ධනයක් ඇති වන බව අප දනිමු. ඒ සඳහා පොදු ජනතාව තුළ පවතින විද්‍යා අවබෝධය අතිශය වැදගත් වේ. අනෙක් අතට ප්‍රජාවේ සෞඛ්‍යය සහ යහ පැවත්ම කෙරෙහි විද්‍යාව අති ප්‍රබල ලෙස දායක වෙයි. විද්‍යාව හා තාක්ෂණය තුළින් ජාතික සංවර්ධනයක් ලබන්නට නම් විද්‍යාව පොදු සංස්කෘතිය, කලා ශිල්ප හා ජන ජීවිතය හා බද්ධ විය යුතුය.

අවසාන වශයෙන් ජාතියේ දියුණුව කවර දිශාවකට යොමු කළ යුතුද යන්න පිළිබඳ ඉඟියක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙහි, තම දිවියේ සැලකිය යුතු කාලයක් ගත කළ කීර්තිමත් විද්‍යාඥයෙක් මෙන්ම විද්‍යා සන්නිවේදකයෙක් වූ ආතර් සී. ක්ලාක් මහතාගේ "My Vission for Sri Lanka" ලිපියෙහි පාඨයක් වෙත ඔබේ සිත යොමු කරවමි. ''මිනිසාගේ සෞඛ්‍ය හා සුබ සිද්ධිය සම්බන්ධයෙන් ඉතිරි වී ඇති විශාලතම අභියෝගය වන්නේ ජීවිතයට තව වසර කිහිපයක් එක් කිරීම නොව ජීවත් වන කාලයට නව ජීවයක් එක් කිරීමයි''. ඊළඟ වසර පනහ සඳහා දැක්ම විය යුත්තේ සියළුම ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීමයි. අපහසුවෙන් වුව ද එවැනි සංවර්ධනයක් අර්ථවත් වන්නේ එය සාමාජීය වශයෙන් හා පාරිසරික වශයෙන් යහපත් වුවහොත් පමණි.

ආචාර්ය ජයන්ත වත්තවිදානගේ

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ
සත්ව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙකු මෙන්ම
ප්‍රවීණ විද්‍යා ලේඛකයෙකි, දේශකයෙකි.
විද්‍යුත් මාධ්‍ය නිපුනතාව සහිත
සන්නිවේදකයෙකි.

විද්‍යා සන්නිවේදනයේ බලපෑම කෙබඳු ද?

මහාචාර්ය කාලෝ ෆොන්සේකා

මහජනතාවට විද්‍යාව සන්නිවේදනය කිරීම සඳහා සම්පත් මහත් රාශියක් ආයෝජනය කිරීමෙන් අනතුරුව එකී කාර්යය ඉටු කිරීම සඳහා අප ගත් උත්සාහයන්ගෙන් කිසියම් බලපෑමක් මහජනතාවට සිදු වී ඇත්දැයි සොයා බැලීමට කාලය පැමිණ ඇත. දේශන පැවැත්වීම, පුවත්පත්වලට ලිපි සැපයීම, ගුවන් විදුලිය ඔස්සේ කතා පැවැත්වීම, රූපවාහිනී වැඩසටහන්වලට සහභාගි වීම, ප්‍රදර්ශන සංවිධානය කිරීම යනාදියෙන් අපි ජනතාව වෙත විද්‍යාව ගෙන යාමට උත්සාහ දරමින් සිටිමු. මේ සියල්ලෙහි බලපෑම කෙබඳුද? විද්‍යාව සන්නිවේදනයෙහිලා අපගේ ප්‍රතිපත්ති ජනතාව වෙත ඇති කෙරෙන බලපෑම කුමක් වන්නට ඇත්ද?



මානව පරිණාමය

විද්‍යාත්මක යෙදවුම් පුළුල් ලෙස භාවිතයට ගන්නා රට ඇමරිකාව බව කිසිදු සැකයක් නොමැත. ගුවන්විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, ඩිජිටල් කැමරා, අහස් යාත්‍රා, පරිගණක, ක්ෂුද්‍ර තරංග උඳුන් සහ ගිණිය නොහැකි විවිධ දෑ ද ඇතුළත්ව විද්‍යාත්මක යොදාගැනීම් භාවිතය අතින් ලොව අන් රටවල් අතරින් පෙරමුණේ සිටින්නේ ඇමරිකාවය. දැනට වසර කිහිපයකට පෙර ඇමරිකා එක්සත් ජනපදයේ සිදු කරන ලද සමීක්ෂණයකට අනුව එකී සමීක්ෂණයට දායක වූවන් අතරින් 76%ක් අවුරුදු 6000කට පෙර ලෝකය මවා ඇති බව විශ්වාස කරති. එවැනිම වූ ප්‍රතිශතයක් සුරදූතයන්, භූතයින්, සහ යක්ෂයින් පිළිබඳ විශ්වාස කරති. ඇමරිකා වාසීන්ගෙන් 79%ක් දෙනා හාස්කම් පිළිබඳ විශ්වාස කළහ. හාස්කම් සත්‍යයක් නම් එය ස්වභාවධර්මයේ නීති උල්ලංඝනය කිරීමක් වේ. ලෝකයේ සත්ව සහ ශාක සන්තතියේ ඇදහිය නොහැකි විවිධත්වය පිළිබඳ අනර්ඝතම පැහැදිලි කිරීම වන චාල්ස් ඩාවින්ගේ ජෛව පරිණාමය පිළිබඳ සිද්ධාන්තයේ වලංගු භාවය පිළිගනු ලබන්නේ ඇමරිකානුවන්ගෙන් 15%ක් පමණි. එදිනෙදා ජීවිතය කෙරෙහි විද්‍යාවෙහි බලපෑම විශිෂ්ටතම වන්නාවූ ඇමරිකාවේ සත්‍ය වශයෙන්ම පවතින තත්වය එයයි. එසේ හෙයින්, ජනතාව වෙත විද්‍යාත්මක දැනුම සන්නිවේදනයෙහිලා විද්‍යාඥයින් විසින් ගනු ලබන උත්සාහයන්ගේ සැලකිය යුතු බලපෑමක් කොහෙත්ම තිබේද යන ප්‍රශ්නය පැන නගී.

ඇමරිකාවේ ජනතාව කෙරෙහි විද්‍යා සන්නිවේදනය මගින් සිදු වන බලපෑම නොසැලකිය යුතු මට්ටමක තිබෙන්නේ ඇයිද යන්න වටහා ගැනීමට අප අයත් වන්නා වූ සහ තමන් විසින්ම ''හෝමෝ සේපියන්ස්'' ලෙස නම් කරනු ලබන්නාවූ විශේෂයේ සමාජ පරිණාමය පිළිබඳ අවධානය යොමු කිරීමට සිදුවේ. ඩෙස්මන්ඩ් මොරිස් විසින් රචිත ''නිරුවත් වානරයා'' නමැති ග්‍රන්ථයට අනුව දැනට ජීවත් වන වඳුරන් සහ වානර විශේෂ 193 දෙනාගෙන් එකකට අප අයත්වේ. මොවුන් අතරින් රෝම සහිත විශේෂ 192ක් ඇති අතර මිනිසා රෝම

නොමැති එකම විශේෂය වේ. එහෙයින් මොරිස් විසින් ''හෝමෝ සේපියන්ස්'' විශේෂය හැඳින්වීමට ''නිරුවත් වානරයා'' යන වදන යොදා ගන්නා ලදී. ලෝකය පිළිබඳ විද්‍යාත්මක දෘෂ්ටියට අනුව ජීවයේ ආරම්භය සහ පරිණාමය මේ මිහිමත සිදු විය. එක් අවස්ථාවකදී මානව වර්ගයා පොළොව මත ජනිත විය. පූර්ව අවධියේදී ඔවුහු ''ඇන්ත්‍රපොයිඩයෝ'' වූහ. ඉන් අනතුරුව අපද අයත් වන ''හොමිනිඩ්'' බවට පත් වූහ. වාචික සන්නිවේදනයේ එක්තරා ස්වරූපයක් ''ඇන්ත්‍රපොයිඩයන්ගේ'' සිට ''හොමිනිඩයන්'' දක්වා පරිවර්තනය වීම සලකුණු කළ බවට සාක්ෂි තිබේ. අනෙක් සියලුම වඳුරන් සහ වානරයන් එකිනෙකා සමඟ සන්නිවේදනය කළේ මොරදීමෙන් සහ අංගචලනයෙනි.

වඳුරන්, බැබූනයන්, සහ ගොරිල්ලන් ආදීහු, ශබ්ද, මොරදීම, සහ අංග චලනයෙන් එකිනෙකා සමග සන්නිවේදනය කරනු ඔබ දැක ඇත. මුල්ම යුගයේ මෙකී පරිවර්තන කාලය තුළ මානව වර්ගයා ශබ්ද සහ මොරදීම්වලින් ඔබ්බට ගිය යම් ආකාරයක වාචික සන්නිවේදනයක් ගොඩනගාගත් බව පෙනෙන්නට තිබේ. සමහර විද්‍යාඥයන්ට අනුව, මානව වර්ගයා සහ අනෙක් සතුන් අතර ප්‍රධාන වෙනස්කම, අන් සමහරුන් විශ්වාස කරන ආකාරයට 'උපකරණ භාවිතය' නොව, මෙකී 'වාචික සන්නිවේදනයයි'. මේ මතයට අනුව, අප අපවම නම් කරනු ලැබීමට ලැදියාවක් දක්වන ''හෝමෝ සේපියන්ස් (*Homo sapiens*)ගේ ලක්ෂණ නිර්වචනය කෙරෙන්නේ භාෂාව භාවිතය මගිනි.

ලේඛන හැකියාව භාවිතයට පැමිණීමට බොහෝ කාලයකට පෙර සන්නිවේදනය සඳහා කථන භාෂාව භාවිතයට පැමිණ ඇත. පහළ ප්‍රිමාටාවන් වන ඔරං ඔටං, චිම්පන්සි, ගිබන් සහ ගොරිල්ලන්, අංකුර වාචික සන්නිවේදන ස්වරූපයක් වූ මොරදීම, සහ අංග චලන මගින් සන්නිවේදනය කළහ. අපට වැටහෙන පරිදි ඇන්ත්‍රපොයිඩයන්ගේ සිට මානවයා දක්වා සිදුවූ සංක්‍රාන්තිය භාෂාව භාවිතය මගින් සලකුණු කර ඇත.

පොළොව මත මිනිසාගේ පැවැත්ම අවුරුදු මිලියනයක් පමණ අතීතයට දිවයන බව ගණන් බලා ඇත. මෙම කාලයෙන් 99% ක්ම 'මිනිසා' ගත කර ඇත්තේ සමාජ පරිණාමයේ ''දඩයම්'' යුගය තුළය. මෙම යුගය තුළ, සතුන් දඩයම් කිරීමත්, පලතුරු සහ අල වර්ග ආහාර පිණිස එක් රැස් කිරීමත් ඔහුගේ ජීවන රටාව විය. ''දඩයම් යුගය'' තුළ පොළොව මත මානවයින්ගේ සංඛ්‍යාව බහුල නොවීය. ''හෝමෝ සේපියන්ස්'' අප්‍රිකාවේ ජනිත වූ බවත් ඉන් අනතුරුව ලෝකයේ වෙනත් ප්‍රදේශ කරා ව්‍යාප්ත වූ බවත් විශ්වාස කෙරේ. එකල මිනිස්සු 100කින් පමණ සමන්විත කුඩා ගෝත්‍රවල 'දඩයම්කරුවන්' ලෙස ජීවත් වූහ. එක් තැනක ආහාර සඳහා සතුන් හිඟ වූ විට ඔවුහු කැලයේ වෙනත් කොටසකට සංක්‍රමණය වූහ. එනිසා, එය 'තැනින් තැනට යන ජීවිතයක්', එනම්, ස්ථිර නවාතැනක් නොමැති ජීවිතයක් විය. මානව සමාජ පැවැත්මේ මුල්ම අවධි පිළිබඳ මානව විද්‍යාඥයන් පවසන්නේ මෙයයි.


චාල්ස් ඩාවින්

සමූහචාරී හෝ සමාජ සත්වයන් වූ නිසා, දඩයමින් ජීවත් වූ මෙම යුගයේ එක් කණ්ඩායමක සාමාජිකයන් අතර එකිනෙකා සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් විය. ඔවුන් දඩයමේ යන විට එකිනෙකා සමග සන්නිවේදනය කිරීම අනිවාර්ය විය. එනිසා, ජීවිතය සුරැකීමේ වටිනාකමක් භාෂාව සතු විය.

මානව වර්ගයා කෘෂිකර්මයට හුරු වූයේ අදින් වසර 10,000කට පමණ පෙරය. සරුසාර ඉඩම් සහ ජලය සපයා ගත හැකි බව කෘෂිකර්මය සඳහා මූලික අවශ්‍යතා ලෙස සැලකිය හැක. එනිසා, තැනින් තැනට යෑමට අදහසක් මිනිසුනට නොවීය. දඩයම් යුගයේදී මෙන් තැනින් තැනට යන නිදහසක් මෙකල මිනිසුනට නොවීය. එනිසා, සරුබිම් සහ ජලය සමග ස්ථාවර සන්තක ප්‍රදේශයක පදිංචිවීමේ නැඹුරුතාවයක් පෙනෙන්නට තිබිණි. අවශ්‍යතාවයක් ඇති වුවහොත් යම් කණ්ඩායමක මරණය දක්වා සටන් කිරීම මගින් වුවද රැක බලා ගැනීමට කැමැත්තක් දක්වන, 'නිජභූමිය, මාතෘභූමිය, හෝ පීතෘ භූමිය' යන හැඟීම උත්පාදනය විය. එමගින් නිජභූමිය පිළිබඳ සංකල්පය ඉතා තදින් මුල් බැස ගත්තේය. මෙම අවධියේදී ගෝත්‍රයක ඕනෑම සාමාජිකයෙකුට, විශේෂයෙන්ම පුරුෂයන්ට ප්‍රධාන යුතුකම් තුනක් තිබිණි. පළමුවැන්න, තමන් ආරක්ෂා වීමයි. මීළඟ යුතුකම වූයේ තමාගේ කුටුම්භය ආරක්ෂා කර ගැනීමයි. තෙවැන්න වූයේ තමන් අයත්වන ගෝත්‍රය සහ තමන් වාසය කරන සන්තක ප්‍රදේශය රැක ගැනීමයි. මෙය මානව සමාජ පරිණාමනයෙහි හරවත් කතාන්දරයයි. කෘෂිකර්මාන්තයේ ආරම්භයත් සමග ආහාර සැපයුම ඉහළ ගිය අතර ආහාර සැපයුම් මාර්ගය වඩා විශ්වාසදායී විය. ක්‍රම ක්‍රමයෙන් අනෙකුත් වෙනස්කම් සිදුවීම ආරම්භ විය. වඩා බලවත් සහ ශක්තිමත් මිනිසුන් විසින් දුර්වලයන් පාලනය කිරීම ඇරඹුනි. එය ඉඩම් හිමියන්ගේ සහ දාසයන්ගේ යුගයක ඇරඹුම විය. තම ආඥාව ඉටු කර ගැනීමට අනෙක් මිනිසුන් හට ප්‍රබල ලෙස අණ කළ හැකි බලවත් පුද්ගලයෙක් රජ බවට පත් විය. මෙය රාජාණ්ඩුවෙහි පටන් ගැනීම විය. රාජාණ්ඩු බිහිවීමත් සමග තමන්ගේ සම්ප්‍රදායක මාතෘ භූමියට වැඩිපුර සරුබිම් ඈඳා ගැනීම උදෙසා එයට යාබද ප්‍රදේශවල කණ්ඩායම් සමග සටන් වැදුනහ. මිනිසුන්ගේ මනස තුළ 'යුද්ධය' ආරම්භ වූයේ මෙලෙස විය හැකිය. දඩයම් යුගය තුළ මිහිමත ජීවත් වූයේ මිනිසුන් ටික දෙනෙකු බැවින් ගැටුම් හටගත්තේද සුළු වශයෙනි. පිටස්තරයින් තම සන්තක ප්‍රදේශය යටත් කර ගැනීම පිණිස සිදු කළ ආක්‍රමණවලදී එය ආරක්ෂා කර ගැනීමට අපොහොසත් වන්නේ නම් එහි වැසියෝ තම

සන්තක ප්‍රදේශය අතහැර වෙනත් ප්‍රදේශයකට පලා ගියහ. අනෙක් අතට ඔවුන් තම සන්තක ප්‍රදේශය ආරක්‍ෂා කිරීමට තීරණය කළේ නම් සටනක් ඇති වීම නොවැළැක්විය හැකි විය. එහෙයින්, කෘෂිකර්මාන්තයත් සමග ආහාර සම්පාදනය ඉහළ ගිය අතර ගෝත්‍රයක වූ ජන සංඛ්‍යාවේ ද ඉහළ යාමක් දක්නට ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස යුද්ධ ඇතිවීමද ස්ථිර දෙයක් බවට පත් වුණි. මෙය මානව සමාජ ඉතිහාස පරිණාමය පිළිබඳ එක්තරා දෘෂ්ටියකි.

කෘෂිකාර්මික අවධිය තුළ මානව ජනගහනය සංඛ්‍යාත්මක අතින් විශාල ලෙස වැඩි විය. දඩයම් යුගය තුළ අනවරතව ලැබෙන ආහාර සැපයුමක් නොවීය. දඩයක්කරුවෙකු හට තමන්ට සතෙකු දඩයම් කර ගැනීමට හැකිවේද යන්න පිළිබඳ සහතිකයක් නොවීය. පලතුරු සහ ඇට වර්ග මෙන්ම ආහාරයට ගත හැකි අනෙකුත් දෑ සොයාගැනීම පිළිබඳ ගැටළු පැවතිණි. කෘෂිකර්මාන්තයෙහි සංවර්ධනයත් සමග අනවරත, සුරක්ෂිත, අධික ආහාර සම්පාදනයක් දක්නට ලැබිණි. එනිසා ජන සංඛ්‍යා වර්ධනයක් සිදු වුණි. සංවර්ධිත කෘෂිකර්මය මගින් අනවරත ආහාර සම්පාදනයක් සහතික කිරීමත් සමගම මානව සමාජය තුළ වූ සමහර සාමාජිකයන්ට ආහාර නිෂ්පාදන ක්‍රියාවලියෙන් නිදහස් වීමට අවස්ථාවක් ලැබිණි. මෙය ශ්‍රම විභජනයකට මග පෑදුවේය. සමහරු ක්ෂේත්‍රයේ සාමූහික දැනුම වැඩිදියුණු කිරීමෙහිලා වෙහෙසුනහ. එක්තරා අවස්ථාවක ලිවීමේ කලාව සොයාගන්නා ලද අතර ඒත් සමගම මිනිසුන්ගේ ජීවන මට්ටමෙහි ශීඝ්‍ර වැඩිදියුණු වීමක් දක්නට ලැබිණි. මානව සමාජ පරිණාමනයෙහි අවධි කිහිපයක් මග හරිමින් විද්‍යා සන්නිවේදනය සහ එහි බලපෑම කෙරෙහි සෘජුව සම්බන්ධ වන්නාවූ අංශයක් දෙස දෑන් අපගේ අවධානය යොමු කරමු. පසළොස්වන (15) ශතවර්ෂයේදී මුද්‍රණ ශිල්පය යුරෝපයේදී ආරම්භ විය. මෙම සොයාගැනීම සඳහා ගෞරවය හිමි කර ගත්තේ ගුටෙන්බර්ග් විසිනි. කෙසේ වෙතත් 15වන ශතවර්ෂයට බොහෝ කලකට පෙර චීනුන් විසින් මුද්‍රණ ශිල්පයේ විද්‍යාව හා කලාව සොයාගත් බවට සාක්ෂි ඇත. මානව සමූහ අතර විශාල පරිමාණයෙන් සන්නිවේදනය ආරම්භ කෙරුණේ මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීමත් සමගය. විද්‍යාත්මක දැනුම නොව ආගම පැතිරවීම සඳහා මුල්කාලයේදී මුද්‍රණ ශිල්පය භාවිතයට ගන්නා ලදී. බයිබලය මුද්‍රණද්වාරයෙන් එළි දැක්විණි. ලේඛනය, පුවත්පත් කලාව සහ සන්නිවේදනයෙහි සියලුම අංග ආගම පැතිරවීම සඳහා ප්‍රධාන වශයෙන් යොදා ගන්නා ලදී. මුද්‍රණ යන්ත්‍රයෙහි සොයාගැනීමත් සමග උගතුන් විසින් ලියන දෑ පරිශීලනය කිරීමේ අවස්ථාවක් මිනිසුන් හට ලැබිණි. ඇරිස්ටෝටල් විසින් කරන ලද දෑ ප්‍රකාශයට පත් කෙරුණි. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අදහස් පුළුල්ව, එහෙත් සෙමින් පැතිරෙන්නට විය. මහජනතාව අතරින් ප්‍රශ්න පැන නගින්නට විය. ''තනි පුද්ගලයෙකු වෙත අති විශාල බලයක් ගොනු කරන්නේ ඇයි?'' යනාදී ලෙසින් ප්‍රශ්න පැන නැගුණි. මෙලෙසින් ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි වන නැඹුරුතාවයන්ගේ ඇරඹුමද මුද්‍රණාලවල සහ සන්නිවේදනයේ ආරම්භය දක්වා දිව යයි.

ප්‍රථම මුද්‍රණ යන්ත්‍රය


ගැලිලියෝ ගැලිලි

නූතන විද්‍යාවේ ඉතිහාසය ගැලිලියෝ ගැලිලි මුල් කොට ගෙන යුරෝපයේදී ආරම්භ විය. ගැලිලියෝ 1564දී උත්පත්තිය ලැබූ අතර 1646දී මිය ගියේය. පුරාවෘත්තයන්ට අනුව බර සහ සැහැල්ලු වස්තු නිදහස් පතනය පිළිබඳව ඇරිස්ටෝටල් විසින් උගන්වන ලද දෑ බිඳ දැමීම සඳහා ගැලිලියෝ පීසාහි ඇලවුණු කුළුණට නැග්ග බව සඳහන් වේ. ගැලිලියෝගෙන් පසුව විද්‍යාව මානව ශිෂ්ටාචාරයේ ඉදිරි ගමනට දායක වෙමින් ඉතා වැදගත් සමාජ බලවේගයක් බවට පත් විය. එනිසාම, විද්‍යා සන්නිවේදනයේ බලපෑමක් බටහිර ලෝකයේ මානව සමාජය කෙරෙහි ඇතිවන්නට විය. ''විද්‍යාව'' හෝ ''විද්‍යා'' හෝ ''විජ්ජා'', එකිනෙක හා සම්බන්ධ කොටස් දෙකකින් සමන්විතය. වටහා ගැනීමේ පහසුව සඳහා මේවා එකිනෙකින් වෙන් කර සලකා බලමු. සිද්ධාන්තමය ලෙස ලෝකය නොඑසේනම් විශ්වය දෙස එබී බලන විද්‍යාව පළමුවැන්නයි. මූලිකව ශක්තිය පැවතුණ අතර එහි එක් කොටසක් අනතුරුව පදාර්ථය බවට පරිවර්තනය වීමක් සිදුවූ බව විද්‍යාව අපට පවසයි. අප දෑන් හොඳින් දන්නා පරිදි ශක්තියට සහ පදාර්ථයට එකිනෙක අතර පරිවර්තනය විය හැකිය. පරිවර්තනය හටගත්තේ ''මහා පිපිරුමත්'' සමගය. මෙලෙස ඉන්ද්‍රිය විචාරය මගින් මෙහෙයවනු ලබන මානව වර්ගයාගේ පංචේන්ද්‍රිය ආධාරයෙන් යථාර්ථය පිළිබඳව වටහා ගත හැකි වන පරිදි විස්තරයක් විද්‍යාව මගින් සපයනු ලැබේ. එනිසා, විද්‍යාව ''ලෝකය පිළිබඳ දැනුම ව්‍යාප්ත කළ සිද්ධාන්තය'' බවට පත් විය.

දෙවැන්න, එදිනෙදා ජීවිතයේ තිබෙන්නා වූ ලෞකික ගැටළුවලට විසඳුම් ලබා දීමට විද්‍යාත්මක දැනුම යොදාගැනීමයි. මෙය ''විද්‍යාත්මක ශිල්ප ක්‍රමය'' ලෙස හැඳින්විය හැක. වඩාත් කඩිනමින් සහ කාර්යක්ෂම ලෙස

අපගේ කායික සැපතට අවශ්‍ය දෑ තෘප්තිමත් කිරීමෙහිලා භෞතික පරිසරය වෙනස් කිරීම සඳහා අපට මෙමගින් හැකියාව ලබා දෙයි.

ඒ අනුව, ලෝකය පිළිබඳ සිද්ධාන්තයක් සහ ශිල්ප ක්‍රමයක් ලෙස, අපගේ පැවැත්ම, සෞඛ්‍ය සහ සැප පහසුව ප්‍රවර්ධනය කිරීම පිණිස ලෝකය වෙනස් කිරීමට විද්‍යාව අප සතුව ඇත. ලෝකය පිළිබඳ සිද්ධාන්තයක් ලෙස විද්‍යාව යන්නට මානවයා විසින් වැඩි පිළිගැනීමක් ලබා දී නැත. එනමුදු, විද්‍යාව ශිල්ප ක්‍රමයක් ලෙස පුළුල් පිළිගැනීමකට ලක්ව තිබේ. එනිසා, පරිගණක, රූපවාහිනී, රේඩියෝ, මෝටර් රථ, කැමරා හිමි කර ගැනීම සහ ගුවන් යානා මගින් ගමන් බිමන් යෑම, ප්‍රතිජීවක භාවිතය යනාදියට සෑම කෙනෙකුම කැමැත්තක් දක්වයි. මෙම විද්‍යාත්මක සොයාගැනීම් සියල්ලම ඉතා ඉහළින් පිළිගත හැකි ඒවාය.

විද්‍යා සන්නිවේදකයන් ලෙස අපගේ ප්‍රධාන කාර්යභාරය වන්නේ මෙම විද්‍යාත්මක සොයාගැනීම් ක්‍රියා කරන ආකාරය පිළිබඳව එකී ජනයාට පැහැදිලි කිරීමද? නොඑසේනම්, අපගේ ප්‍රධාන කර්තව්‍යය විය යුත්තේ විද්‍යාව ලෝකය කෙසේ දකීද යන්න පිළිබඳ විස්තරයක් සැපයීමද? විද්‍යාත්මක සොයා ගැනීම් ප්‍රවර්ධනය කිරීමට විද්‍යා සන්නිවේදකයින් ප්‍රමුඛත්වය දී කටයුතු නොකළ යුතුය. මක් නිසාද යත් ඒවායේ නිෂ්පාදකයින් සහ වෙළඳ දැන්වීම් ප්‍රචාරකයින් තමන්ට ආවේණික කාර්යක්ෂම විධික්‍රම භාවිතයෙන් අදාළ ප්‍රවර්ධන කටයුතු සිදු කරන බැවිනි. ඒවාට එතරම් ප්‍රචාරයක් ලබා දීමට ද අවශ්‍ය නොවේ. විද්‍යාව ප්‍රායෝගිකව වැඩෙහි යෙදෙන ආකාරය මිනිසුන්ට දැක ගත හැකි වන අතර එනිසාම ඔවුන් ඒවා තම සන්තක කර ගැනීමට සාමාන්‍යයෙන් උත්සුක වනු ඇත. එහෙයින් සන්නිවේදකයින් ලෙස අපගේ ප්‍රධාන කාර්යභාරය විය යුත්තේ ලෝකය පිළිබඳ සිද්ධාන්තයක් ලෙස විද්‍යාව යන්න ව්‍යාප්ත කිරීම සහ විද්‍යාත්මක ක්‍රමය ක්‍රියාවෙහි යෙදෙන්නේ කෙලෙසද යන්න පිළිබඳ අවබෝධයක් මිනිසුන්ට ලබා දීමයි.

මානව වර්ගයා විශ්වය පිළිබඳ දරන මතයෙහි හැඩතල වෙනස් කිරීමට ලෝකය පිළිබඳ සිද්ධාන්තයක් ලෙස විද්‍යාව උපකාර වී ඇත. එමගින් මානව වර්ගයාට විශ්වය තුළ හිමි ස්ථානය පිළිබඳ නැවත තක්සේරුවකට පැමිණ ඇත. ලෝකය පිළිබඳ සිද්ධාන්තය යුරෝපය තුළ පිහිටියේ යුදෙව් - ක්‍රිස්තියානි සම්ප්‍රදායෙහි අංගයක් ලෙසය. කාල් මාක්ස් ලෝකය පිළිබඳ ව්‍යාප්ත කළ සිද්ධාන්තය, එහි ජනප්‍රිය තාර්කික බව, සහ විශ්වකෝෂ සංක්ෂිප්තය ලෙස ආගම විග්‍රහ කළේය. ලෝකය පවතින්නේ කෙසේද? කුමක් සඳහාද? යන්න පිළිබඳ මග පෙන්වීමක් ද එමගින් සැපයිණි. සෑම ආගමක්ම ලෝක දෘෂ්ටියක් සහ ජීවත් විය යුත්තේ කෙසේද යන්න පිළිබඳ ආචාර ධර්ම පද්ධතියක් ඉදිරිපත් කර ඇත. බෞද්ධ සම්ප්‍රදාය තුළ ලෝකය පිළිබඳ සිද්ධාන්තය ''චතුරාර්ය සත්‍යයෙහි'' අන්තර්ග්‍රහණය කර ඇති අතර ආචාර් ධර්ම පද්ධතිය ''පංච ශීලය'' මගින් ඉදිරිපත් කර ඇත. මේවා මිනිස් ජීවිතය පිළිබඳ විශ්වකෝෂ සංක්ෂිප්තය මූර්තිමත් කරයි. ක්‍රිස්තියානි දහමෙහි දෙවියන්, පරමාත්මය, දේව කැමැත්ත, ස්වර්ගය, අපාය, සහ දසපනත මගින් එහි විශ්වකෝෂ සංක්ෂිප්තය නියෝජනය කරනු ලැබේ. යුදෙව්-ක්‍රිස්තියානි දෘෂ්ටියට අනුව, ලෝකය එහි සියලුම සත්වයින්, ශාක සහ මිනිසුන් ඔවුන්ගේ වර්තමාන ස්වරූපයෙන්ම මීට වසර 6000කට පෙර, දින හයක් ඇතුළත මවනු ලැබීය. එලෙසම, පෘථිවිය විශ්වයේ කේන්ද්‍රස්ථානය බවද හිරු පොළොව වටා භ්‍රමණය වෙතැයිද ඔවුහු නිගමනය කළහ. මෙම විස්තරය බයිබලයේ පදගතාර්ථ අර්ථකථනයක් මත පදනම්වූ අතර සාමාන්‍යයෙන් මිනිස්සු එය පිළිගත්හ.

මෙකී දෘෂ්ටියට පටහැනිව විද්‍යාව පවසන්නේ විශ්වයේ කේන්ද්‍රස්ථානය පෘථිවිය නොවන බවත් පෘථිවිය සූර්යයා වටා භ්‍රමණය වන බවත්ය. මෙම දෘෂ්ටිය ගැලිලියෝ විසින් විස්තර විභාග කොට දක්වනු ලැබූ අතර රෝමානු කතෝලික පල්ලිය විසින්, එසේ කී දෙය බැහැර කිරීමට ඔහුට බල කරන ලදී. බ්‍රිතාන්‍ය ජාතික තාරකා විද්‍යාඥයකු වූ ජේම්ස් ජීන්ස් සාමිවරයාගේ චිරප්‍රසිද්ධ කියමනකට අනුව පෘථිවිය, ලොව ඇති සියලුම මුහුදුවල තිබෙන වැලි අතරින් එක් වැලි කැටයකින් මිලියනයකින් එකක් තරම් වන බව ප්‍රකාශ කරනු ලැබ ඇත. විශ්වය පිළිබඳ සලකන කල්හි අපගේ ග්‍රහයා එතරම් කුඩාය. නිර්මාණවල අධිපති වූ ද දෙවියන්ගේ පිළිබිඹුවට අනුව මවන ලද්දා වූ ද මිනිසා, දැනට ජීවත් වන වානර සහ වඳුරු විශේෂ 193 දෙනාගෙන් කෙනෙකු බව විද්‍යාව තව දුරටත් පවසයි.

එහෙයින්, විද්‍යාව මගින් විශ්වය පිළිබඳව වූ මානව දෘෂ්ටියෙහි හැඩ තල වෙනස් කරන ලදී. මෙහිදී අනිවාර්යයෙන්ම පැන නැගී ගැටළුව වන්නේ කුමන දෘෂ්ටියක් පිළිගත යුතුද යන්නයි. ආගම මගින් ඉදිරිපත් කළ පොදුවේ පිළිගත් දෘෂ්ටියද නොඑසේ නම් විද්‍යාව මගින් ප්‍රතිශෝධනය කරන ලද දෘෂ්ටියද? මේ නිසාවෙන් ආගම සහ විද්‍යාව අතර ගැටුම් පැන නැගුණි. මෙම විවාදය තවමත් අවසාන වී නොමැත. විද්‍යා සන්නිවේදනයෙහි කාර්යභාරය වන්නේ විද්‍යාවට කීමට ඇත්තේ කුමක්ද යන්න මහජනතාවට ගෙන හැර පෑමයි. වෙනත් අයුරකින් පවසතොත් විද්‍යා සන්නිවේදනයේ

වගකීම වන්නේ විද්‍යාව පිළිබඳව ජනතා අවබෝධය ඇති කරලීමයි. චිරප්‍රසිද්ධ ජෛව විද්‍යාඥයෙකු වන ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ රිචඩ් ඩව්කින්ස් විද්‍යාව පිළිබඳ ජනතා අවබෝධය සඳහා මහාචාර්යවරයා වීම මෙහිදී සඳහන් කළ යුතු වඩාත් සිත්ගන්නා සුළු කාරණයකි.

ලෝකය පිළිබඳ මානව වර්ගයා විසින් ලබා ගන්නා ලද වඩාත් විශ්වාසදායක දැනුමෙහි අයිතිය විද්‍යාවට හිමි විය යුතු බවට කිසිදු ගැටළුවක් නොමැත. වර්තමානයේ ලොව පිළිබඳ පිළිගත් සත්‍යය මෙයින් නිරූපණය කෙරේ. එනිසා, නූතන ලෝකයේ සිටින විද්‍යා සන්නිවේදකයෝ කිසිදු අඩුවකින් තොරව විශ්වය පිළිබඳ සත්‍යය මානව වර්ගයාට ප්‍රකාශ කරති. මෙම සත්‍යය සරල නොවේ. විද්‍යාත්මක දැනුම යාවත්කාල කළ යුතු සහ අසම්පූර්ණ වීම කරණ කොට ගෙන මෙකී දෑ අඩුපාඩු සහිත වීම නිසා මෙසේ නිදොස්ද නොවන බව කිව යුතුය. එසේ වූයේ නමුදු මිනිස් වර්ගයා සතු හොඳම දෑ ද මෙයයි. පෙර සඳහන් කළ දෙයක් නැවත කියන්නේ නම්, විද්‍යාව දෙවැදෑරුම් කාර්යයක් ඉටු කරයි. පළමුවැන්න, විද්‍යාවේ සොයාගැනීම් මගින් විශ්වය පිළිබඳව සහ එහි අපට හිමි ස්ථානය පිළිබඳ මිනිස් වර්ගයාගේ දෘෂ්ටියෙහි හැඩතල වෙනස් කිරීමය. දෙවැන්න, අපට දීර්ඝායුෂ ලබා ගැනීමට සහ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට හැකි වන පරිදි විද්‍යාවේ ශිල්ප ක්‍රම මගින් ලෝකය වෙනස් කිරීමයි. බොහෝ මිනිස්සු තම වාසිය තකා ලෝකය වෙනස් කිරීමට විද්‍යාව ශිල්ප ක්‍රමයක් ලෙස යොදා ගැනීම පිළිබඳ උනන්දුවක් දක්වති. මෙය ආශිර්වාදයක් වී ඇති නමුදු අවාසනාවකට එය අමිශ්‍රිත ආශිර්වාදයක් නොවේ. මෙය දෙපැත්ත කැපෙන ආයුධයක් බඳුය. මිනිස් වග වෙත යහපත් කිරීම සඳහා මෙය වැඩි වශයෙන් යොදා ගෙන ඇත. එමෙන්ම, විශාල ලෙස හානි ගෙන දීමට ද එය යොදා ගනු ලැබ තිබේ. විද්‍යාත්මක ශිල්ප ක්‍රමය සැලකූ විට එය යහපත් නොවන අතර අයහපත්ද නොවේ. යහපත් දෙය මෙන්ම අයහපත් දේ කිරීමට එය යොදා ගෙන ඇත. විද්‍යාව ශිල්ප ක්‍රමයක් ලෙස යහපත් දේ සඳහා යොදා ගැනීම සලකා බලන විට, නිරපේක්ෂ දරිද්‍රතාවය අඩු කිරීමට එය උපකාර වී ඇති ආකාරය අපට දැක ගත හැකිය. දීර්ඝ ලෙස මෙන්ම දුෂ්කර පැය ගණනාවක් කායික ශ්‍රමය යොදා ගැනීම 'යන්ත්‍ර' භාවිතය මගින් අඩු කොට ඇත. වෛද්‍ය විද්‍යාවේ දියුණුව ජීවිත අපේක්ෂාව ඉහළ දමා ඇති අතර ළදරු මරණ අනුපාතිකය පහත හෙලා ඇත. ඇඟිලි සලකුණු සහ ඩී. එන්. ඒ. පැතිකඩ යනාදී ශිල්ප ක්‍රම භාවිතයෙන් අපරාධ අනාවරණය කර ගැනීම සඳහා විද්‍යාව මගින් හැකියාව ලබා දී ඇත.

අධ්‍යාපනය පැතිරයාම මගින් අප සියලු දෙනාටම ප්‍රතිලාභ ලැබී ඇත. විශාල ලෙස ග්‍රන්ථ ප්‍රකාශනයට රුකුල් දීම මගින් විද්‍යාව, අධ්‍යාපනය සඳහා උපකාර කර ඇත. සංචාරය එමගින් පුළුල් ලෙස ප්‍රවර්ධනය කර ඇත. 'සංචාරයෙහි යෙදීම මනසට පෘථුල බවක් ලබා දේ' යනුවෙන් ප්‍රසිද්ධ කියමනක්ද තිබේ. සන්නිවේදනය සඳහා විද්‍යාව මගින් පහසුකම් සපයා

ට්‍රයිබල් යුද්ධය

ඇත. නිවෙස් තුළට වී අපගේ ක්‍රිකට් ක්‍රීඩකයන් ලෝකයේ විවිධ ස්ථානවල ක්‍රීඩා කරන ආකාරය අපට දැකගත හැකිය. පසුගිය කාලයේ හුසේන් බෝල්ට්ගේ මීටර 100 සහ 200 විශ්මයජනක තරග ජයග්‍රහණය අපගේ නිවස තුළ හිඳගෙන නිදහසේ නැරඹීමට අපට හැකි විය. එය එසේ සිදු කළ හැකි වූයේ විද්‍යාත්මක ශිල්ප ක්‍රමවල මහිමයෙනි.

ප්‍රමාණවත් තරම් උසස් මට්ටමක ඇති ඕනෑම විද්‍යාත්මක ශිල්පයක් මැජික්වලින් වෙන් කොට හඳුනාගත නොහැකි බව, අප රටට ඉමහත් ඇල්මක් දක්වූ 'ශ්‍රීමත් ආතර් සී ක්ලාර්ක්' වරක් ප්‍රකාශ කොට තිබේ. ඇත්ත වශයෙන්ම එය විජ්ජාවක් බඳුය. අප මෙතෙක් සාකච්ඡා කරමින් සිටියේ ශිල්පක්‍රමයක් ලෙස විද්‍යාව යොදා ගැනීමේ යහපත් ප්‍රතිඵල පිළිබඳය. විද්‍යාවට උපලක්ෂිත වූ මානව පීඩනයේ තීව්‍රතාවය පිළිබඳව සලකන විට අපට සිදු වන්නේ ලජ්ජාවෙන් මුහුණ සඟවා ගැනීමය. මෙහිදී මතක තබා ගත යුතුම දෙයක් නම්, විද්‍යාව දුෂ්ට නොවන බවත් එය දුෂ්ට දේ සඳහා මෙහෙය වූ මිනිසුන්ගේ නපුරුකම නිසා එකී ප්‍රතිඵල ඇති වූ බවත්ය. ඒ එසේ වුවත් ගැටුම් මිනිස් ස්වභාවයේම කොටසක් වූ අතර මානව සමාජ කිහිපයක් පමණක් එවැනි තත්වයන්ගෙන් තොර විය. මුල්ම ආයුධ වූයේ දුනු සහ ඊතලයි. මෙම ආයුධවලින් මහත් විනාශයක් සිදු නොවීය. එහෙත් අද මිනිසා විසින් සමූහ විනාශ සිදු කළ හැකි ආයුධ, විද්‍යාවේ පිහිටෙන් නිෂ්පාදනය කරනු ලබයි. ලෝකයේම බලාපොරොත්තු සුන් කරවමින් මහත් විනාශයක් සිදු කිරීමට මෙම ආයුධවලට හැකියාව ඇත. හිරෝෂිමා සහ නාගසාකිවලට හෙලන ලද පරමාණු බෝම්බ එකී නගරවලට මහත් ව්‍යසනයක් ඇති කර දුනි. විද්‍යාව හා තාක්ෂණය අමනෝඥ ලෙස සහ හිතුමතේ භාවිත කිරීම නිසා ප්‍රතිඵලය වූ පරිසර දූෂණය දිගු කාලීන එමෙන්ම බරපතල ගැටළු නිර්මාණය කර ඇත. ඕනෑම ඒකාධිපතියෙකුට තම බලය ස්ථාවර කර ගැනීමට අවශ්‍ය නම් ආයුධවල ස්වරූපයෙන් විද්‍යාව එකී අරමුණ ඉටු කර ගැනීම සඳහා භාවිත කළ හැකිය. මේවා විද්‍යාවේ ශිල්ප ක්‍රමයක් ලෙස භාවිතයෙන් සිදු වන අනිටු විපාකයකි.

සමූල ඝාතක අවි!

විද්‍යා සන්නිවේදනය කෙතරම් ඵලදායී වී තිබේද? එමගින් ඇති වූ බලපෑම කුමන ආකාරයක වීද? ඇත්තවශයෙන්ම මෙම ලිපියෙහි මාතෘකාවද මෙයයි. සිද්ධාන්තයක් ලෙස විද්‍යාව යොදා ගැනීමේ බලපෑම අවමය. විද්‍යාව ලෝකය පිළිබඳ පැවසීමට ඇති දේ පිළිගත්තේ ටික දෙනෙකි. මිහිමත පවතින ජීවයේ විවිධත්වය පිළිබඳ හොඳම විවරණය ඩාවින්ගේ පරිණාමවාදය මගින් ඉදිරිපත් කෙරෙන බව පිළිගත්තේ ඇමරිකානුවන්ගෙන් 15%ක් පමණි. අනෙක් අතට රූපවාහිනී, රේඩියෝ, පරිගණක, ගුවන් යානා, නූතන වෛද්‍ය විද්‍යාව, සහ විවිධ දෑ උදෙයෝගිමත් ලෙස භාවිත කරන ආකාරය මගින් තීරණය කරන්නා වූ ශිල්ප ක්‍රමයක් ලෙස විද්‍යාව භාවිතයේ බලපෑම අති විශාලය. පරිගණකවලින් සිදු කළ හැකි අරුම පුදුම දෑ පිළිබඳව මිනිසුන් තම අත්දැකීමෙන් දන්නා නිසා විද්‍යා සන්නිවේදකයන් වන අප ඒ ගැන ලිවිය යුතු නොවේ. එසේ නම් විද්‍යා සන්නිවේදකයින්ගේ කාර්යභාරය කුමක්ද? අපට සත්‍ය වශයෙන්ම වටහා ගැනීමට ඇත්තේ මෙයයි. සන්නිවේදනයේ වඩාත්ම ඵලදායී ආකාරයක් වන්නේ නිපුණ ලෙස සිදු කෙරෙන වෙළඳ දැන්වීම් ප්‍රචාරයයි. සියලුම ආකාරයේ භාණ්ඩ, සමහරක් යහපත්, සමහරක් අයපත් සහ තනිකරම දුෂ්ට නිෂ්පාදන වූ දුම්කොළ වැනි සමහර දෑ වෙළඳාම් කිරීමට විද්‍යාව භාවිත කරනු ලබයි.

මිනිස් ස්වභාවය සහ සියල්ලන්ටම ප්‍රතිලාභ ලැබෙන ලෙස එය වැඩි දියුණු කළ හැක්කේ කෙසේද යන්න සඳහා සිද්ධාන්තයක් ලෙස විද්‍යාවට කීමට ඇති දෙය සන්නිවේදනය කිරීම පිණිස විද්‍යා සන්නිවේදකයෝ නූතන වෙළඳ ප්‍රචාරණ ශිල්ප ක්‍රම භාවිත කළ යුතු වන්නාහ. පරිගණක ක්‍රියා කරන්නේ කෙසේද? කුමක් සඳහාද? ගුවන් යානා පියාසර කරන්නේ කෙසේද? සහ නැව් වතුර මත ගමන් කරන්නේ කෙසේද? යනාදිය මහජනයාට කීම පමණක් ඇත්ත වශයෙන්ම විද්‍යා සන්නිවේදකයාගේ කාර්යභාරය නොවිය යුතුය.

මෙකී දෑ රසවත් බවට කිසිදු සැකයක් නොමැති නමුදු එවැනි දේ පිළිබඳව විද්‍යා අධ්‍යාපනය වග කියනු ඇත. අනෙක් අතට විද්‍යා සන්නිවේදකයන්ගේ බැරෑරුම්ම වගකීම වන්නේ, දුම්කොළ සහ මාධ්‍යසාරවලින් සිදු කෙරෙන්නාවූ හානිය, ඒඩ්ස් පැතිරෙන ආකාරය, පරිසර දූෂණය සිදුවන ආකාරය, යනාදිය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමයි.

දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියෙහි වර්තමාන සභාපතිවරයා ලෙස කතුවරයාට දුම්කොළවලින් සිදු කෙරෙන හානිය පිළිබඳ නිදර්ශන ඉදිරිපත් කළ හැකිය. පසුගිය ශතවර්ෂය තුළ දුම්කොළ වසංගතය මගින් මිනිසුන් මිලියන සියයක් (100ක්) මරා දමනු ලැබීය. වර්තමානයේ තිබෙන දුම්බීමේ ප්‍රවණතාවය ආපසු හැරවීමට හෝ අත්හිටුවීමට ආණ්ඩු මගින් කිසිවක් සිදු නොකළ හොත් 21වන සියවස තුළ මිනිසුන් මිලියන දහසක් (1000ක්), එනම්, බිලියනයක ප්‍රමාණයක් මෙම වසංගතය මගින් මරා දැමිය හැකි බවට ඇස්තමේන්තු කර ඇත. වෘත්තීමය මට්ටමින් හසුරුවන්නාවූ වෙළඳ ප්‍රචාරණ යන්ත්‍රය තුළින් තම නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම මගින් දුම්කොළ කර්මාන්තය එහි දුෂ්ටත්වය ප්‍රබල ලෙස සමාජය වෙත මුදා හැර ඇත. අද තරුණ පුරපුර හෙට දවසේ ඔවුන්ගේ ලාභයයි! එනිසා, මෙම පුරුද්දට බාලවයස්කරුවන් බිලි බා ගැනීමට ඔවුහු හැකි සියලු ප්‍රයත්න දරති. මෙවැනි සන්දර්භයක් තුළ විද්‍යා සන්නිවේදකයකුගේ සැබෑ කාර්යභාරය කුමක්ද? සහතික වශයෙන්ම ඔබගේ මුළු මහත් ශක්තියම යොදා, මරණය විකුණන වෙළඳුන් ලෙස කුප්‍රකට දුම්කොළ කර්මාන්තකරුවන්ගෙන් අපගේ ඉදිරි පරපුර බේරා ගැනීම සඳහා හැකි සියලුම දේ හැකි වෙර යොදා ඉටු කිරීමය. මෙම සිතුවිලි ඔබගේ ලේ ඇට මිදුළුවලට උරාග

අද තරුණ පුරපුර හෙට දවසේ ඔවුන්ගේ ලාභයයි! එනිසා, මෙම පුරුද්දට බාලවයස්කරුවන් බිලි බා ගැනීමට ඔවුහු හැකි සියලු ප්‍රයත්න දරති. මෙවැනි සන්දර්භයක් තුළ විද්‍යා සන්නිවේදකයකුගේ සැබෑ කාර්යභාරය කුමක්ද? සහතික වශයෙන්ම ඔබගේ මුළු මහත් ශක්තියම යොදා, මරණය විකුණන වෙළඳුන් ලෙස කුප්‍රකට දුම්කොළ කර්මාන්තකරුවන්ගෙන් අපගේ ඉදිරි පරපුර බේරා ගැනීම සඳහා හැකි සියලුම දේ හැකි වෙර යොදා ඉටු කිරීමය. මෙම සිතුවිලි ඔබගේ ලේ ඇට මිදුළුවලට උරාගන්නා තුරු ඔබ තුළට කාවැද්දවිය යුතුය. අපගේ දරුවන් දුම්කොළ තර්ජනයෙන් බේරා ගැනීමට අඛණ්ඩව සහ කැපවුණු ප්‍රයත්නයක් සහිත යම් ආකාරයක ධූත මෙහෙවරක යෙදීම මගින් ඔබට මහජනතාව කෙරෙහි අතිවිශාල බලපෑමක් සිදු කළ හැකි විද්‍යා සන්නිවේදකයකුගේ තත්වයට ළඟා විය හැකිය.

න්නා තුරු ඔබ තුළට කාවැද්දවිය යුතුය. අපගේ දරුවන් දුම්කොළ තර්ජනයෙන් බේරා ගැනීමට අඛණ්ඩව සහ කැපවුණු ප්‍රයත්නයක් සහිත යම් ආකාරයක ධූත මෙහෙවරක යෙදීම මගින් ඔබට මහජනතාව කෙරෙහි අතිවිශාල බලපෑමක් සිදු කළ හැකි විද්‍යා සන්නිවේදකයකුගේ තත්වයට ළඟා විය හැකිය. දුම්කොළ කර්මාන්තකරුවෝ, දුම්කොළ යනු නීත්‍යානුකූල නිෂ්පාදනයක් බවත් එය වැඩිහිටියන් සඳහා වන බවත් යනාදී ලෙස තම අයිතිවාසිකම් ඉදිරිපත් කරති. මෙසේ හෙයින් තමන්ට මෙම ව්‍යාපාරය කරගෙන යෑමේ අයිතිවාසිකමක් ඇති බවද ප්‍රකාශ කරති. මෙම සංක්‍රාන්ති කාලය තුළ එය සිදු වූවත් විද්‍යා සන්නිවේදකයන් නුදුරු අනාගතයේදී මෙය මුලිනුපුටා දැමීමට කටයුතු සිදු කරනු ඇත.

HIV සහිත අවාසනාවන්ත මිනිසුන් හා සම්බන්ධව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කිරීම විද්‍යා සන්නිවේදකන්හට ක්‍රියාත්මක වීමට ඇති තවත් එක් ක්ෂේත්‍රයකි. නිශ්චිතවම HIV ආසාදිත පුද්ගලයන් සමග අප සබඳතා පැවැත්විය යුත්තේ කෙසේද? රෝගයේ ස්වභාවය පිළිබඳ හුදු විස්තරයක් සැපයීම මගින් හෝ ඒ පිළිබඳ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කිරීම මගින් හෝ වැදගත් බලපෑමක් සිදු නොකෙරෙනු ඇත. මෙම කරුණ සම්බන්ධව විද්‍යා සන්නිවේදකයන්ගේ මෙහෙවර විය යුත්තේ මෙකී මිනිසුන් කොට්ඨාශය ඉහත කී මාරාන්තික වෛරසයට අවාසනාවන්ත ලෙස, සමහර විට තමාගේ වරදකින් තොරව ගොදුරු වී ඇති බවත් ඔවුන් සමග සාමාන්‍ය ආකාරයට කටයුතු කිරීම මගින් කිසියම් වූ ලෙසකින් හානියක් නොවන බවත් මහජනතාවට කියා පෑමයි. එකම අනතුර වන්නේ ඔවුන් සමග ලිංගික සම්බන්ධතා පැවැත්වීම පමණි. මෙහිදී HIV පැතිරෙන ආකාරය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සැපයීම මගින් එම රෝගීන්ට සාමාන්‍ය ආකාරයට සලකන මෙන් අප කළ ආයාචනයට යම් තත්වයක් ලබා දීමට උපකාර වනු ඇත.

අවසාන වශයෙන් වඩා හොඳ සන්නිවේදකයෙකු වීම සඳහා විද්‍යා සන්නිවේදකයන් විසින් අනාගත විද්‍යාත්මක පෙරදැක්මක් සහ ජීවිතය පිළිබඳ ආකල්ප උපදවා ගත යුතුය. අනාගත විද්‍යාත්මක පෙරදැක්මක වටිනාකම කෙබඳුද? මෙම පැනයට පිළිතුරු සැපයීමට නම්, පළමුව අනාගත විද්‍යාත්මක පෙරදැක්ම යනු කුමක්ද යන්න පිළිබඳව පැහැදිලි අදහසක් අප සතුව තිබිය යුතුය. සත්‍යතාවය ඔප්පු කළ හැකි, සත්‍යය මත එළඹෙන නිගමන පදනම් කොට ගත් මානසික පරිචයක් අනාගත විද්‍යාත්මක පෙරදැක්මක් ලෙස හැඳින්විය හැක. අප විශ්වාස කරන බොහොමයක් දේ වෙනුවෙන් පෙනී සිටීමට කිසිම සාක්ෂ්‍යයක් නොමැති බව පෙන්වීමට කුඩා ප්‍රත්‍යවේක්ෂණයක් ප්‍රමාණවත් වේ. නිදසුන් ලෙස, ජීවිතය සාර්ථක වීමට නම් ජ්‍යෝතිෂයට අනුකූලව කටයුතු කළ යුතු බව සමහර මිනිස්සු විශ්වාස කරති. එමෙන්ම, විවිධ දෙවිවරුන්ට යාඥා කිරීමෙන් රෝග සුව කළ හැකි බව විශ්වාස කරති. තවදුරටත්, කේන්දර ගැලපෙන්නේ නැති ගැහැනු - පිරිමි එකිනෙකා හා විවාහ නොවිය යුතු බව විශ්වාස කරති. මේ ආකාරයට නිමක් නැති උදාහරණ ඉදිරිපත් කළ හැකිය.

මෙකී සෑම අවස්ථාවකදීම යම් විශ්වාසයක් පදනම් වූ සාක්ෂ්‍ය දෙස ඔබ විවේචනාත්මකව බැලුවහොත්, එම සාක්ෂ්‍යයෙහි විචක්ෂණශීලී බවක් නොතිබෙන බව ඔබට වැටහෙනු ඇත. එවැනි අවස්ථාවලදී විද්‍යා සන්නිවේදකයන් කුමක් කළ යුතුද? පහත දැක්වෙන ක්‍රියාමාර්ගය ඔවුන් විසින් තෝරා ගත යුතු බව කතුවරයා යෝජනා කරයි.

1 පියවර: හැකිතාක් පැහැදිලි ලෙස සහ නිශ්චිත ලෙස විශ්වාසය සඳහන් කරන්න.

2 පියවර: එම විශ්වාසයට ඇති සාක්ෂ්‍ය සලකා බලන්න. එය හුදෙක් ඕපාදූපයක්ද?, එසේත් නොමැති නම් ප්‍රචාරක කාර්යයක්ද? නැතිනම් සම්ප්‍රදායද?

3 පියවර: එකී විශ්වාසය සඳහා තිබිය හැකි පැහැදිලි කිරීම සලකන්න. නිදසුනක් ලෙස නැවත උත්පත්තිය හා බැඳුණු සිද්ධියක් හිස්ටීරියාව හා සම්බන්ධ දෙයක් විය හැක.

4 පියවර: එකිනෙකට ඇති සාක්ෂ්‍යවලට අයත් විවිධ පැහැදිලි කිරීම් ශ්‍රේණිගත කරන්න.

5 පියවර: ස්ථාවර නිගමනයකට එළැඹීමට නොහැකි නම්, හොඳ සාක්ෂ්‍යයක් ඉදිරිපත් වන තෙක් නිගමනයක් කරා එළඹීම අත්හිටුවීම නුවණට හුරුය. එසේ නොවුනහොත්, වඩාත්ම සාක්ෂ්‍ය ඇත්තා වූ විශ්වාසය ඔබගේ ක්‍රියාකිරීමේ උපකල්පනය ලෙස තෝරා ගන්න.

විද්‍යාඥයන් තම කටයුතු සිදු කළ යුතු සැබෑ ක්‍රමය නම් මෙයයි. ගුවන් යානා, නෞකා, සහ පරිගණක නිපදීමට යොදන, දැනුම උත්පාදනය කරන්නාවූ ඔවුන්ගේ ක්‍රමවේදය, බොහොමයක් දෛනික ගැටළු සඳහා උපකාර පිණිස යොදා ගන්නා මෙන් ආයාචනය කළ හැක. මෙම මානසික පරිචය ලබා ගැනීම ඔබට ඵලදායී විද්‍යා සන්නිවේදකයකු බවට පත්වීමට මග පෙන්වනු ඇත. විද්‍යාත්මක ආකල්ප ඔබව විවෘත මනසක් ඇති, එනිසාම, බොහෝ දෑ දරා ගත හැකි කෙනෙකු බවට පත් කරන බව ඔබටම සොයා ගත හැකි වනු ඇත. නූතන ලෝකයට අද වඩාත් අවශ්‍ය ශක්තිය වන්නේ දරා ගැනීමේ ශක්තියයි. එය ඔබ සතු නම්, ඔබ විශාල බලපෑමක් කළ හැකි සන්නිවේදකයකු බවට පත්වෙනු ඒකාන්තය.

මහාචාර්ය කාලෝ ෆොන්සේකා

කොළඹ වෛද්‍ය පීඨයෙහි මෙන්ම උතුරු කොළඹ වෛද්‍ය පීඨයෙහි ද දහසක් වෛද්‍යවරු බිහිකිරීමට දායක වූ කෘතහස්ත වෛද්‍ය මහාචාර්යවරයකු ලෙස හැඳින්විය හැකිය. ළඟන්නා ආකාරයෙන් අසීරු විද්‍යා දැනුම සිය ග්‍රාහකයන් වෙත සමීප කිරීම උදෙසා ඔහු තුළ පවත්නා ප්‍රවීණත්වය අති විශිෂ්ටය. මෙතුමා දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියෙහි වර්තමාන සභාපතිවරයායි.

විද්‍යාව, විද්‍යාඥයන් සහ විද්‍යා සන්නිවේදනය

තුසිත මලලසේකර

''තරුණ විද්‍යාඥයින්ගේ හඬ'' ජාල සම්බන්ධිකාරක ෆැස්සස් ඩමිනි, ඇය සංස්කරණය කළ '' වෘත්තීය දිවිය අරඹණ විද්‍යාඥයින් සඳහා මාධ්‍ය මාර්ගෝපදේශය'' හැඳින්වීමෙහි මෙසේ සඳහන් කරයි.


හොෆ්මන්

අයිසෙක් නිව්ටන්

මාර්කෝනි


අයින්ස්ටයින්

''විද්‍යාව ප්‍රවෘත්ති සමුදායක් සපයයි. නවතම පර්යේෂණ ප්‍රතිඵල සහ එම සංවර්ධන භාවිතය මගින් අප වෙසෙන ලෝකය කවරාකාරයෙන් හැඩගස්සනු ඇත් ද යන්න දැන ගැනීමට මහජනතාව තුළ පවතිනුයේ මහත් රුචියකි.

එසේ වුවද, විද්‍යාව පිළිබඳව කරන සාකච්ඡා, විද්‍යාඥයන් සිතන-පතන ලෙස හැමවිටම පෙළ නොගැසෙයි. නොසිදුවෙයි. ජානමය ලෙස විකරණය කළ ආහාර, සරම්ප, කම්මුල්ගාය, රුබෙල්ලා එන්නත, න්‍යෂ්ටික ශක්තිය සහ කුරුළු උණ ආදී මාතෘකා පිළිබඳව පසුගියදා සිදුවූ සංවාද තුළින් ජනතාව තුළ එම මාතෘකා පිළිබඳව තව තවත් නොපැහැදිලි තත්ව මතු වෙයි. එහෙයින් විද්‍යාඥයන් මාධ්‍ය හරහා මෙන්ම සෘජු ලෙස ජනතාවට ද විද්‍යාත්මක කරුණු පහදා දෙමින් අදහස් පළකිරීම බොහෝ සෙයින් වැදගත්ය''.

ඇය පවසන දෙය සරල ලෙසින් දැක්වුවහොත් ඉන් ගම්‍ය වන්නේ විද්‍යාඥයන් විද්‍යා සන්නිවේදනයේ යෙදීමේ ඇති වැදගත් කමය.

සන්නිවේදනය චර්යාත්මක පද්ධතියකි. එය වචනමය සහ වචනමය නොවන පොදු සංකේත භාවිත කරමින් තොරතුරු සහ අවබෝධය සම්ප්‍රේෂණය කිරීමට සමත්වෙයි. 'කොමියුනිස්' යන ලතින් වචනයේ තේරුම 'කොමන්' හෙවත් 'පොදු' යන්නය. එහෙයින් සන්නිවේදනයෙන් අපේක්ෂා කරන්නේ එය ලබන්නා සමග 'පොදු බවක්' හෙවත් 'ඒකඟතාවයක්' ඇතිකිරීමය. ඉතාම සුලබ මානව චර්යාව සන්නිවේදනය ලෙස සැලකීමට පුළුවන. බොහෝ ලෙසින් පැතිරුන සන්නිවේදන ක්‍රමය නම් කතා කිරීමය. නමුත් සිනහව, හිස වැනීම, ඇනුම් ඇරීම, රැවීම, ගෙරවීම සහ වෙනත් ඉඟි බිඟි ද, චිත්‍ර හා ලේඛනය ආදිය ද සන්නිවේදන ක්‍රම වෙයි.

සන්නිවේදනයේ යෙදීම පහසුය. එහෙත් සඵලමත් සන්නිවේදනයේ යෙදීම එතරම් පහසු කාර්යයක් නොවේ. සඵලමත් සන්නිවේදකයෙකු වීම සඳහා ඔබ වටහා ගත යුතු වන්නේ සන්නිවේදන ක්‍රියාවලිය පමණක් නොවේ. ලබා දීමට අපේක්ෂා කරන පණිවිඩය පිළිබඳවත්, එම පණිවුඩය ලබා දීමට අපේක්ෂිත ඉලක්ක කණ්ඩායම පිළිබඳවත් ඔබට මනා අවබෝධයක් තිබිය යුතුය.

සඵලමත් සන්නිවේදනය - නිර්වචනය

සන්නිවේදනය යනු තොරතුරු හුවමාරුවයි. බැලූ බැල්මට එය සරල ක්‍රියාවකි. නමුත් සන්නිවේදන ක්‍රියාවලිය

සන්නිවේදනය චර්යාත්මක පද්ධතියකි. එය වචනමය සහ වචනමය නොවන පොදු සංකේත භාවිත කරමින් තොරතුරු සහ අවබෝධය සම්ප්‍රේෂණය කිරීමට සමත්වෙයි.


ආතර් සී. ක්ලාර්ක්

සඵලමත් සන්නිවේදන අවශ්‍යතාවයක් වෙත ව්‍යාප්ත වන විට මෙයට වඩා පැහැදිලි නිර්වචනයක් පැවතීම අවශ්‍යතාවය කි.

සන්නිවේදනය යනු යවන්නෙකු හා ලබන්නකු දැනුම, ආකල්ප, හුරුපුරුදු හා කුසලතා හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලියයි. එය මත, අදහස්, කරුණු, හැඟීම් යනාදිය අපේක්ෂිත ලෙස එක් පොදු අදහසකට, තේරුමකට හෝ භාවිතයට ලඟා වීම සඳහා වන ක්‍රියාවලියකි.

සන්නිවේදනයේ මූලිකාංග

සන්නිවේදන ක්‍රියාවලියේ අංග අතර ඉතා වැදගත් අංග මෙසේය.

මූලාශ්‍රය හෝ යවන්නා:

සන්නිවේදන ක්‍රියාවලියේ ආරම්භකයාය. උදාහරණ වශයෙන් රූපවාහිනී හෝ ගුවන්විදුලි හෝ වැඩසටහනකට සහභාගි වන මෙන්ම පුවත්පතකට ලිපියක් සපයන විද්‍යාඥයෙකු දැක්විය හැකිය. සන්නිවේදනය සඳහා අපේක්ෂිත අදහස් හා තොරතුරු සතු මෙන්ම එමගින් අපේක්ෂිත අරමුණු ද සහිත පුද්ගලයා මොහුය.

පණිවුඩය:

පණිවුඩය ලබන්නා සමග හුවමාරු කරගෙන පොදු එකඟතාවයකට පැමිණීම සඳහා යවන්නාට අවශ්‍ය වන අදහස් පවතින්නේ පණිවුඩයෙහිය. වචනමය හෝ වචනමය නොවන හෝ ඒ දෙකෙන්ම හෝ සමන්විත වන පණිවුඩය තුළින් පණිවුඩය යවන තැනැත්තාගේ අපේක්ෂාවන් හා අරමුණු විද්‍යාමාන වෙයි.

මාධ්‍යය:

පණිවුඩය යවන්නාගේ සිට ලබන්නා තෙක් රැගෙන යන වාහකය, මාධ්‍යය වෙයි. එය මුද්‍රිත හෝ විද්‍යුත් හෝ විය හැකිය. ෆැක්ස්, කෙටි පණිවුඩ සහ දුරකථන ඇමතුම් යනාදිය ද පණිවුඩ යවන විද්‍යුත් මාධ්‍ය ලෙස වර්තමානයේ පිළිගැනෙයි.

ලබන්නා:

පණිවුඩය ලබන්නා පණිවුඩය ලැබූ අය හට ප්‍රතිචාර දක්වයි. ලබන්නා තම පූර්ව අත්දැකීම්, අධ්‍යාපන මට්ටම හා පණිවුඩයේ ස්වභාවය ආදිය මත එය වටහා ගනියි. පණිවුඩය තව තවත් ඉදිරියට ගෙන යාම හෝ එය නතර කර දැමීම හෝ ලබන්නා හට කළ හැකි වෙයි. පණිවුඩය යවන්නා, පණිවුඩය ලබන්නා සමග බෙදා හදා ගන්නා පණිවුඩය තුළ දැනුම, ආකල්ප, හුරුපුරුදු හා කුසලතා ඇතුළත් වේ.

දැනුම

පුද්ගලයෙකු දැන සිටිය යුතු කරුණු දැනුම ලෙස හැඳින්වෙයි. උදා. වර්ෂයේ මෙම කාලයේදී අධික වර්ෂාව සමග තදින් අකුණු ගැසීම් ඇතිවෙයි.

ආකල්ප:

පුද්ගලයෙකු, වස්තුවක් හෝ මතයක් (අදහසක්) පිළිබඳව කෙනෙකු තුළ පවත්නා හැඟීම ආකල්පයක් ලෙස හැඳින්වෙයි. උදා: අකුණු ගසන විටකදී විදුලි හා විද්‍යුත් උපකරණ භාවිතය පිළිබඳව කෙනෙකු තුළ පවතින හැඟීම.

හුරුපුරුදු - චර්යාව හෝ පරිචය හෝ ලෙස ද හැඳින්වෙයි. එමගින් පුද්ගලයෙකු විසින් සිදු කරන දේ දක්වෙයි.
උදා: සියළු විදුලි උපකරණවලට සම්බන්ධ කර ඇති විදුලි බලය සිඳීම.

කුසලතා- කුසලතා ලෙස හැඳින්වෙන්නේ කිසියම් පුද්ගලයෙකු යමක් සිදු කරන ආකාරයයි. උදා. විදුලි උපකරණවලින් විදුලිය සිඳීමට පෙර රබර් සෙරෙප්පු පැළඳීම සහ ට්‍රිප් ස්විච් එක ඕෆ් කිරීම.

සඵලමත් සන්නිවේදනය පිළිබඳව දැක්වූ නිර්වචනයේදී එය ක්‍රියාවලියක් ලෙස හඳුනා ගනු ලැබිණ. ක්‍රියාවලිය අනුව සන්නිවේදනයේ වෙනස්කම් ඇති විය හැකිය. ක්‍රියාවලිය ලෙස හැඳින්වෙන්නේ පණිවිඩය යවන අයගෙන් එය ලබන අය වෙත ගලා යන ආකාරයයි.

ඒක මාර්ගික සන්නිවේදනය

ඉතාම සරලම සන්නිවේදන ක්‍රියාවලිය වන මෙය එක් දෙසකට පමණක් විහිදෙයි.

මෙහිදී පණිවුඩය යවන්නා ඍජුවම පණිවුඩය ලබන්නා වෙත සරලාකාරයෙන් පණිවුඩය යවමින් කළ යුතු දේ දන්වයි. පණිවුඩය යවන්නා අනුමාන කරනුයේ තමන්, පණිවුඩය

තරුණ විද්‍යාඥයන් පිරිසක්

ලබන්නා මුහුණ දී ඇති ගැටළු සහ ඒවාට පිළිතුර යන දෙකම දන්නා බවත් පණිවුඩය ලබන්නා එය නොදැන සිටින බවත්ය.

මෙහිදී පණිවුඩය ලබන්නාට සිදුව ඇත්තේ "අණ" පිළිපැදීම පමණක් නිසා ලබන්නාගෙන් යවන්නාට ප්‍රතිපෝෂණයක් සිදු නොවේ. මෙම වර්ගයේ සන්නිවේදනයන්හි තිරසාරත්වයක් පවත්වා ගත නොහැක.

සමහර සන්නිවේදන මාර්ග ස්වභාවයෙන්ම ඒක-මාර්ගික වෙයි. ජනමාධ්‍ය සන්නිවේදනය බොහෝ විට මෙම ප්‍රවර්ගයට ඇතුළත්ය. සමහර අවස්ථාවලදී ප්‍රති-පෝෂණය ලබා ගැනීම සඳහා වැඩසටහන අවසානයේදී ප්‍රශ්නයක් ඇසීම, දුරකථන මාර්ග විවෘත කර තැබීම යනාදී පියවර ගත්තද ඒවායින් ලැබෙන ප්‍රතිඵල ඉතා සීමිතය.

සමහර සන්නිවේදන මාර්ග ස්වභාවයෙන්ම ඒක-මාර්ගික වෙයි. ජනමාධ්‍ය සන්නිවේදනය බොහෝ විට මෙම ප්‍රවර්ගයට ඇතුළත් ය. සමහර අවස්ථා වලදී ප්‍රති-පෝෂණය ලබා ගැනීම සඳහා වැඩසටහන අවසානයේදී ප්‍රශ්නයක් ඇසීම, දුරකථන මාර්ග විවෘත කර තැබීම යනාදී පියවර ගත්තද ඒවායින් ලැබෙන ප්‍රතිඵල ඉතා සීමිතය.

ද්වි මාර්ගික සන්නිවේදනය

වැඩිපුරම සාකච්ඡාවට ලක්වෙන සන්නිවේදන ක්‍රමය මෙය වේ. එය පණිවුඩය ලබන්නා සහ යවන්නා අතර ප්‍රති-පෝෂණයට ඉඩ සලසයි. තමන් ඉදිරිපත් කළ පණිවුඩය ලබන්නා වෙත පත් වූයේද යන්න නිගමනය කිරීමට මෙම පසු-පෝෂණය අවස්ථාව උදා කරයි. එමගින් ලබන්නාට පවත්නා අවශ්‍යතාවය ගැන යවන්නා හට ඉගි කළ හැකි අතරම, යවන්නා හට ද ඊළඟ අවස්ථාවේදී හෝ එම අවශ්‍යතාවයට ප්‍රතිචාර දැක්විය හැකිය.

තුන්මාර්ගික සන්නිවේදනය

මෙහිදී උචිත පණිවුඩය සැලසුම්කර ලබා දීමට පළමු ලබන්නා පිළිබඳව - අවශ්‍යතාව, සතු සම්පත් සහ ඔහුගේ/ ඇයගේ චර්යාත්මක, අධ්‍යාපනික, සමාජයීය සහ ආර්ථික හා පාරිසරිකමය සාධක ඇතුළත් - තොරතුරු පණිවුඩය යවන්නා වෙත සැපයෙයි. මෙය පූර්ව - ප්‍රතිපෝෂණයක් ලෙස සැපයෙන්නකි.

සන්නිවේදන මාර්ග

1. අන්තර් පුද්ගල සන්නිවේදනය

මෙය දෙදෙනෙකු අතර මුහුණට-මුහුණ ලා සිදුවන සන්නිවේදනයයි. විද්‍යාඥයකු ව්‍යවසායකයකු බවට පත්විය හැකි අයෙකු හෝ ජනමාධ්‍යවේදියෙකු හෝ සමග කෙරෙන කතාබහ මෙයට උදාහරණයි.

ව්‍යවහාරයෙහිදී ඉතාම සාර්ථක සන්නිවේදන ක්‍රමය ලෙස මෙය පිළිගැනෙයි. එසේ වුවද විද්‍යාඥයෙකු හට, විෂය විශේෂඥයකු ලෙස පාරිභෝගික සියළු දෙනා හට තනි තනිව කතා කිරීම හෝ පැහැදිලි කිරීම ප්‍රායෝගිකව කළ නොහැකි කාර්යයකි.

2 සමූහ සන්නිවේදනයඃ

සම ජාතීය කණ්ඩායමකට හෝ සමූහයකට හෝ අයත් එක සමාන පසුබිකින් යුක්ත සහ උනන්දු සහිත පණිවුඩ ලබන්නන් සමූහයකට සන්නිවේදනය කිරීමේදී මෙම ක්‍රමය වඩා සඵලමත්ය.

උදාහරණයක් ලෙස ආහාර විද්‍යාඥයෙකු ආහාර නිෂ්පාදනයේ නියැලි පුද්ගලයන් කණ්ඩායමක් සමග කතා කිරීම දැක්විය හැකිය. සමූහ සන්නිවේදනය සඳහා, දේශන, දේශන සාකච්ඡා, සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මේලන ආදී විවධ ක්‍රම භාවිත කළ හැකිය.

ජනමාධ්‍ය සන්නිවේදනය

එකවර අතිවිශාල ජන සංඛ්‍යාවකට සමීප වීම සඳහා මෙම සන්නිවේදන ක්‍රමය භාවිත කෙරේ. ප්‍රවෘත්ති පත්‍ර, සඟරා, වාර ප්‍රකාශන, පත්‍රිකා, ගුවන් විදුලිය, රූපවාහිනිය, සංයුක්ත තැටි, කෙටි පණිවිඩ, අන්තර්ජාලය මේ සඳහා යොදාගන්නා වාහකයන් වෙති. එමගින් පණිවිඩයක් දසත පැතිරවීම අපේක්ෂා කෙරේ.

සඵලමත් බව

සන්නිවේදන ප්‍රයත්නයක සඵලමත් බව රැඳෙනුයේ කිසියම් අවස්ථාවකදී තෝරාගන්නා උචිත සන්නිවේදන ක්‍රියාවලිය, අංග සහ ක්‍රමය මතය.

සන්නිවේදන ක්‍රියාදාම සාර්ථක යැයි පවසනුයේ පණිවුඩය යවන්නා අපේක්ෂා කළ දැනුම, ආකල්ප, හුරුපුරුදු සහ කුසලතාවන්හි අපේක්ෂිත වෙනස්කම පණිවුඩය ලබන්නා තුළ ඇතිවූයේ නම් පමණය. එසේම මෙහිදී මතක තබා ගත යුතු වැදගත් කරුණක් වන්නේ දැනුම වෙනස් කිරීම හා නංවාලීම මෙන්ම ආකල්ප වෙනසක් ඇති කිරීමද පහසු වුවද හුරුපුරුදු නැතිනම් චර්යා වෙනසක් ඇති කිරීම පහසු නොවන බවය. එයට හේතුවක් වන්නේ නව හුරු පුරුද්දකට යාමේදී අවශ්‍ය වන සමාජ, ආගමික, ආර්ථික සහ පාරිසරිකමය සාධක සහාය සහ හැකියාව ලබාගන්නාට අපේක්ෂිත පරිදි නොලැබීමයි.

සඵලමත් බව නංවාලීම කළ හැක්කේ කෙසේද?

සන්නිවේදන කාර්යයක සඵලමත් බව සහතික කිරීම සඳහා ගත යුතු යැයි විශ්වාස කෙරෙන ප්‍රධාන මූලධර්මය වන්නේ 'ඔබගේ ඉලක්ක කණ්ඩායම දැනගන්න' යන්නය. එය ඉතා පහසු දෙයක් බවට සිතේවි. එහෙත් ඉලක්ක කණ්ඩායම ගැන දැනගැනීමට යාමේදී එහි සංකීර්ණභාවය අවබෝධ වනු නිසැකය.

සන්නිවේදන පර්යේෂණ හෙළිදරව් කරගෙන ඇති පහත දැක්වෙන පොදු තොරතුරු සන්නිවේදන ක්‍රමෝපායක් සැලසුම් කිරීමේදී ඔබට උදව් කර ගත හැකිය.

පොදු සාධක

වෙනසක් සඳහා පිරිමින් පෙළඹවීම කාන්තාවක පොළඹවනවාට වඩා අසීරුය. එයට හේතුව බොහෝ සමාජ තුළ පිරිමින් හුරුව ලබා ඇත්තේ කාන්තාවන්ට වඩා වැඩි ප්‍රගල්භ බවක් දැක්වීමටය.

- ලබන්නාගේ අධ්‍යාපන මට්ටම ඉහළ නංවා කරුණු සහිතව යමක් වටහා දීමෙන් වෙනසක් සඳහා පෙළඹවිය හැකි වෙයි. අධ්‍යාපන මට්ටම අඩු නම් එවැනි පෙළඹවීමකට වැඩි අවස්ථාවක් තිබෙනුයේ චිත්තවේගී කරුණු පදනම්වය.
- ආදායම ඉහළ නම් නව තාක්ෂණයන් උපයෝගී කර ගැනීමට ලබන්නන්ගේ ඉදිරිපත්වීම වැඩියෙන් දැකිය හැකිය. ඒ අලාබයක් සිදු වුවත් එය විඳ දරා ගැනීමට ඔවුන්ට හැකියාව තිබෙන නිසාය. දුප්පත් අය එවැනි අවදානම් නොගන්නේ තම ආර්ථිකයට එවැනි අත්හදා බැලීම් ඔරොත්තු නොදෙන හෙයිනි.
- ලබන්නන් තරුණ වූ තරමට සහ අත්දැකීම් අඩුවූ තරමට වෙනසක් කරා පෙළඹවීමට පහසුය. තරුණ අය තාක්ෂණ කෙරෙහි අනුවර්තනය වීමට වැඩිහිටි අයට වඩා සතුටුය. පහසුය.

පණිවුඩය සමඟ බැඳි සාධක

ඉලක්ක ග්‍රාහක කණ්ඩායමට සමීප වීමට පණිවුඩය සමත් බව අප දැනගත් තරමට සන්නිවේදනය සඵලමත් කිරීමේ හැකියාව ඉහළය. එහෙයින් මෙහි පහත දැක්වෙන හේතු කාරණා අවධානයට ලක් කරන්න.

- ග්‍රාහකයන් මුහුණ දී ඇති ගැටළුවලට පිළිතුරු සපයන පණිවිඩ කෙරෙහි වැඩි අවධානයක් හිමිවන අතරම ඒවා මතක තබා ගැනීමේ ප්‍රමාණයද ඉහළ යයි. තමන්ගේ ගැටළුවක් නොවන කරුණකට ලබදෙන විසඳුම් දෙසට එතරම් උනන්දුවක් යොමු නොවේ.
- ආර්ථික, සෞඛ්‍යය, තත්වය, ආදරය, බිය ආදියට අවධානය කැඳවන පණිවුඩ, පුද්ගල ආකල්ප වෙනස් කිරීමට, එවැනි අවධානය කැඳවීමක් නොමැති පණිවුඩවලට වඩා සමත්ය.
- ප්‍රථම පණිවුඩය හෝ පණිවුඩ කිහිපය හෝ දැනටමත් ග්‍රාහකයන් දන්නා තැනක සිට ආරම්භ කර ඔවුන් නොදන්නා තාක්ෂණික කරුණු ඉන් පසුව ඉදිරිපත් කිරීම. ''දන්නා දෙයහින් නොදන්නා දෙයට''.
- කෙටි, සරල, පොදු හා සුලබව භාවිත වන වචන කෙටි වාක්‍ය හා ඡේද පහසුවෙන් කියවීමට ලිවීමට මෙන්ම සවන් දීමට ද හැකිය. දිග, නුහුරු වචන, හා වාක්‍ය වලට වඩා ඒවා තේරුම් ගැනීමට හා මතක තබා ගැනීමට පහසුය. ග්‍රාහකයන් හුරුපුරුදු හා දන්නා උදාහරණ,

උපමා, කතාන්දර භාවිත කිරීම හා රූප සටහන් යොදා ගැනීම මගින්ද ඵලදායිතාවය නංවාලිය හැකිය.

විද්‍යාඥයන් නොවන කණ්ඩායම්වලට සහ පොදු ජනතාවට සන්නිවේදනය කිරීමේදී ශාස්ත්‍රීය සහ තාක්‍ෂණික භාෂාව හා වචන යොදා ගැනීම නොකළ යුතුය. ඒවා ඔවුන්ට තේරුම් ගත නොහැකි වනවා පමණක් නොව සන්නිවේදන ප්‍රයත්නයේ ඵලදායිතාවය පහළ දැමීමටත් හේතුවේ.

කිසියම් පණිවුඩයක් ඵලදැරීමට නම් එය අපේක්‍ෂිත ඉලක්ක කණ්ඩායම වෙත ලැබිය යුතුය. එහෙයින් පණිවුඩය අපේක්‍ෂිත ඉලක්ක කණ්ඩායම වෙත රැගෙන යන මාධ්‍ය හෝ වාහකය හෝ ගැනද සිතා බැලිය යුතුය. එවැනි අවස්ථාවකදී සිතා බැලිය යුතු කරුණු කිහිපයක් මෙසේය.

- මාධ්‍යය හෝ නාලිකාව හෝ ලද හැකි බව.
  පහසුවෙන ලද හැකි ජනප්‍රිය මාධ්‍යයක් නම් පණිවුඩය අපේක්‍ෂිත ඉලක්ක කණ්ඩායම වෙත සමීපවන සහ භාවිත කරනු ඇති බවට වැඩි බලාපොරොත්තු තබා ගත හැකිය.
  උදා: පුවත්පතක හෝ සඟරාවක සංසරණය හා අලෙවිය, එෆ්. එම්. නාලිකාවල ජනප්‍රියත්වය, රූපවාහිනී නාලිකාවක ශීඝ්‍ර ව්‍යාප්තිය.

- පණිවුඩය ලැබීමේදී ලබන්නාගේ සංවේද වැඩි ගණනක් තුළට එය සැපයෙන බව සහතික කිරීම මගින් සඵලමත් බව නංවාලිය හැකිය.
  උදා: ශ්‍රව්‍ය හා දෘශ්‍ය සංවේද දෙකටම ආමන්ත්‍රණය කරන බැවින් රූපවාහිනිය මාධ්‍යය අනෙක් මාධ්‍ය වලට වඩා ප්‍රබල වීම.

- මාධ්‍යය වඩා සමීප වූ තරමට, පෞද්ගලික වූ තරමට සඵලමත් බව වැඩිවෙයි.
  එනම් ජන සන්නිවේදනය අවබෝධය, දැනුවත් බව නංවාලීමට සමත්ය.

කණ්ඩායම් සන්නිවේදනය දැනුම හා කුසලතා නංවාලීමට සමත් වෙයි. අන්තර් පුද්ගල සන්නිවේදනය ආකල්ප හා හුරුපුරුදු වෙනස් කිරීමට වඩා යෝග්‍යය.

එසේ වුවද රූපවාහිනිය, ගුවන් විදුලි, පුවත්පත් මාධ්‍ය සියල්ල බහු මාධ්‍ය වැඩසටහන් සඳහා යොදා ගැනීම තුළින් දැනුම, ආකල්ප, හුරුපුරුදු සහ කුසලතා වෙනස් කිරීම සඳහා භාවිත කළ හැකිය.

සන්නිවේදනය සඵලමත් කිරීම උදෙසා මූලාශ්‍රයට හෙවත් යවන්නාට ද වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට ඇත.

- ලබන්නා හට තොරතුරු සපයන මූලාශ්‍රය හෝ යවන්නා හෝ විශ්වාසදායී වූ විට සහ පිළිගනු ලබන විට සන්නිවේදනය වඩා සඵලමත් වේ.

- යවන්නා සේවය කරන ආයතනය සහ සන්නිවේදනයේ යෙදෙන විද්‍යාඥයාගේ නම හා සුදුසුකම් (ලබා ඇති උපාධි සහ තනතුරු) ද සන්නිවේදනය සඵලමත් කිරීමට හේතු වෙයි.

- යවන්නා සහ ලබන්නා අතර පවතින පෞද්ගලික ගතිලක්‍ෂණවල සමාන කම ද සන්නිවේදනය සඵලමත් කිරීමටත්, පණිවිඩය පිළිගැනීමටත් හේතු වෙයි. (උදා: අපේ ගමේ අයෙක්, අපේ පාසලේ උගත් අයෙක්, අපේ කෙනෙක් ආදී වශයෙන්)

හුරුපුරුදු

සන්නිවේදනය සහ සම්බන්ධ මූලධර්ම හෝ න්‍යාය හෝ හොඳින් දැනගැනීම පමණක් සඵලමත් සන්නිවේදනය සඳහා ප්‍රමාණවත් නොවේ. සන්නිවේදනය ආරම්භ කරන ආකාරය, එය පවත්වාගෙන යන ආකාරය මෙන්ම එහි නිමාව ද කෙරෙහි සන්නිවේදකයා දැනුවත් විය යුතුය. පහත දක්වා ඇති කරුණු පිළිබඳව අවධානය යොමු කරන්න.

(අ) අවධානය යොමුකරගන්න

සන්නිවේදකයාගේ ඇඳුම් පැළඳුම්, ශරීර භාෂාව මෙන්ම කැපී පෙනෙන ආකාරය මෙහිදී වැදගත් වේ. ලබන්නා සමග මුහුණට මුහුණ බලන්න. විශේෂයෙන්ම ඇහැට ඇහැ මුණගස්වන්න. ලිපියක් ලියන විට පවා මුල් ඡේදය අනිත් ලිපි අතර වෙනස් ලෙස කැපී පෙනෙන දෙයක් විය යුතුය.

(ආ) පණිවුඩය පැහැදිලි කරන්න

පණිවුඩය ඍජු සහ සරල විය යුතුය. ඔබේ පණිවුඩය අවබෝධකර නොගතහොත්, කිසිවෙකුටවත් එය මතක තබා ගත හැකි නොවනු ඇත.

නව තාක්‍ෂණ දැනුම ලබා දීමට පෙර ලබන්නාගේ දැනුම, ආකල්ප සහ හුරුපුරුදු ගැන අවබෝධයක් ලබා ගන්න. එසේම ලබන්නා දැනට භාවිත කරන වත් පිළිවෙත්වලට

අගෞරව නොකරන්න. මදි පුංචිකමක් නොකරන්න වග බලා ගන්න. ඒ කාර්යයන්හිදී හොඳ පැති ගෙන හැර දක්වා නව දැනුම වෙත ගෙනයන්න.

ලබන්නා අනුමාන කරන හෝ එකඟවන හෝ අදහස් පෙරට ගෙන යන්න. තර්ක කිරීමෙන් වළකින්න. කිසිවිටෙකවත් ඔබගේ ශාස්ත්‍රීය හා ශිල්පමය භාෂා ඥානය ප්‍රදර්ශනය කිරීමට නොයන්න.

(ඇ) ප්‍රයෝජනයක් මතුකර දක්වන්න

අප බොහෝ දෙනෙකු යමකට සවන් දෙන්නේ ඉන් අපට ලාභ ප්‍රයෝජනයක්, වාසියක් ඇතිනම්ය. එහෙයින් ලබන්නා හට ඔබගේ පණිවුඩය තුළ ඇත්තේ කුමක්දැයි වටහා දෙන්න. ජනතාව ප්‍රයෝජන අපේක්‍ෂා කරමින් වෙනස්වීම්වලට පෙළඹෙති.

(ඉ) මොළයට පමණක් නොව හදවතට ද කතා කරන්න

චිත්තවේගී අගය බොහෝ විට සඵලමත් සන්නිවේදනය සඳහා දායක වෙයි. මෙනිසා ප්‍රායෝගික අංශය පමණක් නොව හෘදයාංගම කරුණුද ඔබේ පණිවුඩය තුළ රඳවන්න.

(ඊ) විශ්වාසය ජනිත කරන්න

තමන්ට හොඳ භාණ්ඩ සපයනු ඇතැයි විශ්වාසයක් නොමැතිනම් කිසිදා වෙළඳ සැලකින් මිනිසුන් භාණ්ඩ මිලදී ගැනීමට නොපෙළඹෙනු ඇත. ඔබගේ පණිවුඩය ලබන්නන් සමග හොඳහිත හා මිත්‍රත්වය දිනාගන්න. ඔබගේ තත්වය (පදවිය) මෙන්ම සුදුසුකම් ද ඔවුන්ට දැනගැනීමට සලස්වන්න. එමගින් අදාළ පණිවුඩය ලබා දීමට ඔබට ඇති අයිතිය හා හැකියාව තහවුරු කළ හැකිය.

සන්නිවේදකයෙකු ලෙස මිත්‍රශීලී, සිනහවෙන් යුතුව කටයුතු කිරීම අතිශයින් වැදගත්ය.

ලඟා හැකි – මුණ ගැසිය හැකි අයෙකු වන්න

ඔබගේ පණිවුඩය ලබන්නා හට ඔබව මුණ ගැසීමට ඇමතීමට යමක් විමසීමට, පැහැදිලි කරගැනීමට අවස්ථාව තිබිය යුතුය.

ස්ථිරසාරව කරුණු දක්වන්න

සියලු මාධ්‍ය ඔස්සේ එකම පණිවුඩය ගෙන යන්න. එකම හඬකින්, එකම මතය ඉදිරිපත් කරන්න. මිනිසුන් යමක් ඉගෙනගනු ලබන්නේ නැවත නැවත ඇසීමෙන් බව මතක තබා ගන්න.

මේ සියල්ල මෙන්ම ඉලක්ක කණ්ඩායමේ ගති ලක්‍ෂණ සන්නිවේදනයේ සඵලත්වය කෙරෙහි බලපායි. එහෙයින් ග්‍රාහකයන් පිළිබඳව දැන හැඳින සිටීම සන්නිවේදනයේ සඵලමත් බව කෙරෙහි බලපෑමක් කිරීමට සමත් වෙයි.

ග්‍රාහකයන් පිළිබඳව පහත දැක්වෙන ගතිලක්‍ෂණ හා තොරතුරු දැන සිටීම ප්‍රයෝජනවත්ය.

- ඔවුන්ගේ වයස, ලිංගිකත්වය, විවාහක-අවිවාහක බව, තත්වය, ජාතිය, ආගම, උපන් ප්‍රදේශය, අධ්‍යාපනය, වෘත්තිය හෝ රැකියාව, ආදායම
- ඔවුන්ගේ අවශ්‍යතාවන්ට කතා කිරීම සහ ඔවුන්ගේ උනන්දුව හා ගැලපෙන පණිවිඩ ඉදිරිපත් කිරීම
- ඔවුන්ගේ මාධ්‍ය හුරුපුරුදු-ඔවුන්ට සමීප මාධ්‍ය හා නාලිකා
- ඔවුන් විශ්වාස කරන මූලාශ්‍ර හා සන්නිවේදකයන්

පොදු ජනතාව උගත් සන්නිවේදකයන්ට-විද්‍යාඥයන්, වෛද්‍යවරු ආදී - සවන්දීමට හා ඔවුන් පවසන දේ අනුගමනයට වැඩි වශයෙන් සූදානම්ය.

විද්‍යාඥයකු ලෙස ඔබට සඵලමත් ලෙස සන්නිවේදනය කළ හැකි නම් ඔබ සතුව ඇත්තේ ඉතා උසස්, එසේම ප්‍රයෝජනවත් අගය කළ හැකි කුසලතාවයකි. එය පමණක් නොව, ඔබ සේවය කරන ආයතනයට මෙන්ම සමස්ත සමාජයටමව හිමිවන ඉහළම දායාදයකි.

තුසිත මලලසේකර

විද්‍යා සන්නිවේදනය පිළිබඳ අත්දැකීම් සහිත
කෘතහස්ත විද්‍යා ලේඛකයෙකි.
සෞඛ්‍ය අධ්‍යයන කාර්යාංශයේ සෞඛ්‍ය මාධ්‍යවේදියෙකු ලෙස
කටයුතු කළ මෙම කතුවරයා,
ජාතික විද්‍යා පදනමෙහි විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශයෙහි
උපදේශක කමිටු සාමාජිකයෙකු ලෙස ක්‍රියා කරයි.
ඔහු, 1972 වර්ෂයේ හොඳම විද්‍යා ලේඛකයා ලෙස ද
1975 වර්ෂයේදී හොඳම විද්‍යා කෘතිය "පසිඳුරන්" රචිත ලේඛකයා
ලෙස ද
සාහිත්‍ය මණ්ඩලයේ රාජ්‍ය සම්මාන හිමි කරගෙන ඇත.

සන්නිවේදනය සඳහා 'නව මාධ්‍ය' භාවිතය

ආචාර්ය බුද්ධි වීරසිංහ

මාධ්‍ය විප්ලවයේ කාල නිර්ණය

මානව ඉතිහාසයේ බොහෝ දීර්ඝ කාලයක් මුළුල්ලේ, සිද්ධීන් වාර්තා කිරීමේ සහ දැනුම රැස් කර ගැනීමේ මූලිකම ක්‍රමය වූයේ මුඛ සම්ප්‍රදායය. ඉපැරණිම සංරක්ෂිත ලිඛිත වාර්තා හමු වනුයේ ක්‍රිස්තු පූර්ව 3100ට පෙර පැවති සුමේරියානු ශිෂ්ටාචාරයෙනි. තවමත් පවතින පැරණිම මුද්‍රිත පොත වන්නේ ක්‍රිස්තු වර්ෂ 868දී මුද්‍රණය කළ බෞද්ධ ග්‍රන්ථයක් වන 'වජ්‍ර සූත්‍ර' යය. එය සොයා ගනු ලැබූයේ වර්ෂ 1907දී චීනයේ වුංහුආන්ග් හි ලෙනක් තුළ තිබීය. 1445දී යුරෝපයේ මුද්‍රණය සිදුව ඇත්තේ සචල අකුරු භාවිත මුද්‍රණ ශිල්පය කොරියාවෙහි භාවිත කර ශත වර්ෂයකට පමණ පසුවය. වර්ෂ 1450දී ගුටෙන්බර්ග් විසින් ප්‍රථම මුද්‍රණ යන්ත්‍රය නිපදවීය. මෝර්ස් සංකේත සංවර්ධනය කරනු ලැබූයේ වර්ෂ 1838දීය. ඡායාරූප ශිල්ප ක්‍රමය 1839දී එළි දැක්වින. ග්‍රැමෆෝනය 1870දී මුල්වරට වාදනය වූ අතර 1876දී දුරකථනයෙන් කතා කිරීමේ හැකියාව ලැබිණ. බයිස්කෝප් (සිනමාව) තිරය මත පතිතවූයේ 189දීය. රේඩියෝ ටෙලිග්‍රැෆි විද්‍යාව පැමිණියේ 1899දීය. රැහැන් රහිත ගුවන් විදුලි ප්‍රචාරය 1970දී සක්‍රිය විය. රූපවාහිනිය නිපදවනු ලැබූයේ 1927දීය. රූපවාහිනී ආදර්ශන විකාශන 1930 දශකයේදී ඇරඹිණ. චුම්බක පටිවල ශබ්දය පටිගත කිරීම 1928දී සිදු විය. 'බිළිඳු' පරිගණකය තම ප්‍රථම ආචික වැඩසටහන දක්වනු ලැබූයේ 1948දීය. චුම්බක හර මතකය ලැබූයේ 1952දීය. ප්‍රථම වාණිජ චුම්බක තැටිය 1955දී නිපදවනු ලැබීය. ප්‍රථම ඝන අවස්ථා පරිගණකය 1957දී අයි බී එම් සමාගම විසින් අලෙවි කරනු ලැබීය. චන්ද්‍රිකා සන්නිවේදනයට යොදා ගැනීමට 1950 දශකයේ සිට අවස්ථාව සැලසින.

ගෝලීය ගම්මානය, තොරතුරු සමාජය, දැනුම් ශ්‍රමිකයා, පරිගණක හා සන්නිවේදනය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය වැනි නව වචන රාශියක්ම අපගේ වදන්මාලාවට එක් වීමද සිදු විය.

වර්ෂ 1971දී අනුකලිත (සංගෘහිත) පරිපථය නිපදවනු ලැබීය. 1973දී අයි බී එම් සමාගම ප්‍රථම මුද්‍රගත දෘඩ තැටිය (ඩිස්කය) එළි දැක්වුවේය. එක්සත් ජනපදයේ උසස් පර්යේෂණ ව්‍යාපෘති නියෝජිත ආයතනය 1960 දශකයේ අවසන් භාගයේදී පරිගණක සබැඳි ඇතිකිරීම සඳහා අත්හදා බැලීම් ආරම්භ කරනු ලැබීය. අන්තර් ජාලයෙහි ආරම්භය එය විය. වී. එච්. එස්. හෙවත් ගෘහ වීඩියෝ පද්ධතිය (හෝම් වීඩියෝ සිස්ටම්) වෙළඳ පොළට පැමිණියේ 1976දීය. සංඛ්‍යාංක (ඩිජිටල්) රූපවාහිනී තාක්ෂණයේ උපත ද මෙම දශකයේ දීම දැකිය හැකි විය. ඇපල් පරිගණකය උපත ලැබූයේ 1977දීය.

පෞද්ගලික පරිගණක යුගය ඇරඹුනේ 1980 දශකයේදී ය. දුරකථනය, පෞද්ගලික පරිගණකය සහ රූපවාහිනිය අතර කුළුපග සම්බන්ධය (මාධ්‍ය අභිසරණය ලෙස හැඳින්වෙන) ඒ පසුපසින්ම ඇරඹිණ. එය තොරතුරු ස්ඵෝටනයක් ඇති වීමට මුල් විය.

20 වන සියවසේ අවසන් සමයේදී නිර්ගමනය වූ නැතිනම් මතුව ආ සංඛ්‍යාංක (ඩිජිටල්), පරිගණකගත හෝ ජාලගත හෝ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සියල්ල ඇතුළත් කරන පදයක් ලෙස 'නව මාධ්‍ය' යන්න දැක්විය හැක.

ගෝලීය ගම්මානය, තොරතුරු සමාජය, දැනුම් ශ්‍රමිකයා, පරිගණක හා සන්නිවේදනය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය වැනි නව වචන රාශියක්ම අපගේ වදන්මාලාවට එක් වීමද සිදු විය. කොතරම් ශීඝ්‍රගාමී ලෙස වෙනස්කම් ඇතිවීද යන්න එමගින් ම පැහැදිලි වෙයි. එසේම එවැනි වෙනස්කම් තවත් බොහොමයක් තවමත් සිදු වෙමින් පවතින බවද සඳහන් කළ හැකිය.

නව මාධ්‍ය යනු කවරේද?

20 වන සියවසේ අවසන් සමයේදී නිර්ගමනය වූ නැතිනම් මතුව ආ සංඛ්‍යාංක (ඩිජිටල්), පරිගණකගත හෝ ජාලගත හෝ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සියල්ල ඇතුළත් කරන පදයක් ලෙස 'නව මාධ්‍ය' යන්න දැක්විය හැක. පෙළ, ශ්‍රව්‍ය, වීඩියෝ, චිත්‍රණ සජීවනය සහ ප්‍රයෝග ආදී බහු මාධ්‍ය හැකියා සහිත මාධ්‍ය අභිසරණයක් ලබා දීමට නව මාධ්‍ය සමත් විය.

නව මාධ්‍ය සහ මාධ්‍ය අතර පවත්නා පිළිගත් වෙසෙසි බව පදනම්වනුයේ සංඛ්‍යාංක ස්වභාවය, සමීපතාව, සම්ප්‍රේෂණය සහ එහි අන්තර් ක්‍රියාකාරකම් හැකියාව යනාදිය මතය.

අන්තර්ජාලය පදනම් කරගත් පසුතලයක් වන ඉ-තැපැල් ලැයිස්තු, නිවේදන පුවරු, සබැඳි (මාර්ගගත) සංසද, සංවාද කුටි, පොඩ්-කාස්ට්න්, සහ පුද්ගලයන් හට තම තොරතුරු සහ තමන් උනන්දුවක් දක්වන ඕනෑම කරුණක් හා සම්බන්ධ තොරතුරු සහ මතවාද ඉදිරිපත් කිරීමට සහ යාවත්කාලීන කිරීමට අවස්ථාව සලසන සබැඳි සඟරාමය ආකෘතියක් වන වෙබ් වියුණු සටහන් හෙවත් බ්ලොග ආදිය හේතු කොට තොරතුරු ලබා ගැනීමේ හැකියාව සහමුලින්ම පාහේ වෙනස් කිරීමට සමත්ව ඇත. ජංගම දුරකථන පරිහරණයෙන් සිදු කරන කෙටි පණිවිඩ සේවා සහ වීඩියෝ දර්ශන දක්වීම් පිළිගැනීමට ලක් විය යුතු සන්නිවේදන බල ලෙස මතුවෙමින් පවතියි.

කුමක්ද? කවරක් පසන්නේද?

සන්නිවේදනය යනු කුමක්ද?

මෙම ප්‍රශ්නය දීර්ඝ කතාබහකට හා විවාදයකට ලක් විය හැකි නමුත් මෙම ලිපිය සඳහා 1948දී සන්නිවේදන විද්‍යාඥ ලැස්වෙල් ඉදිරිපත් කළ පොදු සන්නිවේදන ආකෘතිය සහ එහි සඳහන් ප්‍රශ්න හතර නිර්වචනය ලෙස සැලකීමට අපේක්ෂා කරමි.

එම ප්‍රශ්න හතර නම්,

- කුමක්ද?
- කවරක් පවසන්නේද?
- කා හටද?
- කුමන බලපෑමක් සහිතවද?

සන්නිවේදනය යනු සත්‍ය වශයෙන්ම ගතිකත්වයකින් යුත් ද්වි-මාර්ගික ක්‍රියාවලියකි. සන්නිවේදනය අවශ්‍ය වන්නේ කා හටද? කවරක් පැවසීමටද? සෞඛ්‍ය සන්නිවේදකයන්, පාරිසරික සන්නිවේදකයන්, ආර්ථික සන්නිවේදකයන්, විද්‍යා සන්නිවේදකයන් ආදී වශයෙන් විවිධ පරාස තුළ වෙනත් වෘත්තීන්හි නියැලෙන අය හමුවීමට පුළුවන. මෙම තේමා ඔස්සේ කටයුතු කරන්නන්, සෞඛ්‍ය පුවත්පත් කලාවේදීන් හෝ විද්‍යා පුවත්පත් කලාවේදීන් හෝ ආදී වශයෙන් ප්‍රසිද්ධියට හා පිළිගැනීමට ලක් වෙයි.

කා හටද?

ශ්‍රාවක (ග්‍රාහක) පිරිස වෙනස් වෙයි. පොදුවේ භාවිත කරන පදය වන 'ජනතාව' යන්න තුළ එකිනෙකට වෙනස් උනන්දු, වයස, චර්යා, වෙසෙන භූ ගෝලීය ස්ථාන සහ වෙනත් ගති ලක්ෂණ දක්වන පුද්ගලයන් ගණනාවක් ඇතුළත්ව සිටිති. සන්නිවේදනයේ ඉතා වැදගත් අංගයක් වනුයේ තම ඉලක්ක ග්‍රාහක (ග්‍රාහකයන්) හඳුනා ගැනීමය. සම්ප්‍රදායික සන්නිවේදන පසුතලය වනුයේ, විශේෂයෙන්ම ජනමාධ්‍ය දෙසින් බලන විට 'එක් අයෙකුගෙ න්-බොහෝ දෙනෙකුට'යන ලෙස දක්විය හැකිය.

1980 දශකය වන තුරු මාධ්‍ය මූලික වශයෙන්ම විශ්වාසය රඳවනුයේ මුද්‍රිත මාධ්‍ය සහ ප්‍රතිසම (සාදෘශ්‍ය) විකාශන ආකෘති කෙරෙහිය. එසේම අප තවමත් සන්නිවේදනය විශ්ලේෂණය කරනුයේ එම යුගයෙහි පරිණාමය වූ සම්ප්‍රදායන් හා සාරධර්ම ඔස්සේය මාධ්‍ය සහ ජනසන්නිවේදනය සලකනු ලබන්නේ ජාතියක සම්මානනීය වූ 'සතරවන බලකේන්ද්‍රස්ථානය' ලෙසය.

සන්නිවේදනය කුමන බලපෑමක් සඳහා ද?

පොදු පිළිතුර වනු ඇත්තේ සමාජයේ යහපැවැත්ම යන්නය. 'එක් අයෙකුගෙන් බොහෝ දෙනෙකුට' පසුතලය භාවිත කෙරෙන සම්ප්‍රදායික මාධ්‍ය හා ජනසන්නිවේදන භාවිතයේ දී, දොරටු පාලක කාර්යභාරය පැහැදිලිව ඉස්මතුවන අතර එහෙයින්ම එයට බොහෝ විවේචන ද එල්ල වෙයි. එය පාලනය කිරීමක් ලෙස දකියි. "ඔබ දැන සිටිය යුතු දෑ අපි පවසන්නෙමු. ඉඳගෙන අප ලබා දෙන තොරතුරු බාරග න්න". මෙම කාසියෙහිම අනෙක් පැත්තක් ද පවතින බව බී. ඇග්නට් නම් සන්නිවේදිකාව 1994 සිය කෘතියක සඳහන් කළ මෙම ප්‍රකාශය තුළින් දක්වෙයි. ඇය කතා කරනුයේ ජනසන්නිවේදනයේ ඓතිහාසික සහ සාහිත්‍යමය මූලයන් කරා ආපසු යාමක් පිළිබඳවය. "ලේඛකයන් හැමවිටම සමාජයෙහි පෙරදැක්මක්-දුරදර්ශීබාවයක් සහිත අය ය. දෛනික විද්‍යාත්මක මත ගත් කල අපට විචාරශීලීව පරිහරණය කළ යුතු තොරතුරු මහත් රාශියක් පවතියි. දැන් අපට අවශ්‍යව ඇත්තේ මීළඟ සහස්‍රකය සඳහා වන දැනුමෙහි දී මෙම තොරතුරු 'මුදල්' බවට පරිවර්තනය කිරීම උදෙසා උදව් කළ හැකි පුහුණු වෘත්තිකයෝය. තොරතුරු සංඛ්‍යාංක කිරීම හේතුකොට ග්‍රාහකයන්ගේ ඉහවහා යන තරමට තොරතුරු සමුදා බිහිවී ඇත. මෙයට පෙර පුස්තකාල සහ වෙනත් භෞතික ඉඩකඩ ග්‍රන්ථ හා අත් පිටපත් දැන් සංඛ්‍යාංක

ආකෘතියට පත් වී බොහෝ වේගයෙන් විශාල දුර ප්‍රමාණ අතර එහා මෙහා ගමන් කරමින් පවතියි. ඒවා තවත්.. තව තවත්... තව තවත් දුර... ගමන් කරනු ඇත.

අන් කිසිදා නොතිබුණු තරමට බොහෝ මිනිසුන් අතට ඉතා ඉක්මනින් බොහෝ තොරතුරු ලැබෙමින් පවතියි.

නියුමන් නම් සන්නිවේදකයා මෙම තත්වය මෙසේ දකියි. ''අප අත්දකිමින් සිටිනුයේ අන්තර්ජාල සහ ජනමාධ්‍ය සන්නිවේදනය අතර සහ පොදු සහ පෞද්ගලික සන්නිවේදනය අතර පැවති වෙසෙසි බව මකා දමන ශ්‍රව්‍ය වීඩියෝ සහ විද්‍යුත් පෙළ සන්නිවේදනයක් සහිත විශ්වීය ලෙස අන්තර් සම්බන්ධතා ජාලයක පරිණාමය ය.

රටවැසි ජනමාධ්‍යවේදියා, සහභාගිත්ව ප්‍රකාශනය සහ සමාජ මාධ්‍ය

සහභාගිත්ව ප්‍රකාශය යනු, ''ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අවශ්‍ය ස්වාධීන, විශ්වාසදායී, නිවැරදි, පුළුල් පරාසයකින් යුත් අදාළ තොරතුරු'' ලබා දීම උදෙසා ''රටවැසියෙකු හෝ රටවැසියන් සමූහයක් හෝ ප්‍රවෘත්ති හා තොරතුරු එක්රැස්කිරීම, වාර්තා කිරීම, විශ්ලේෂණය සහ ව්‍යාප්තිය යන ක්‍රියාවලියේ සක්‍රිය කාර්යභාරයක් ඉටු කිරීමේ කාර්යය'' ලෙස බවුමන් සහ විල්ස් යන සන්නිවේදකයන් දක්වති.

වියුණු සටහන් (බ්ලොග), සංවාද තැටි, දූන් නව නාමයක් හිමිකරගෙන ඇත. එම නාමය වන්නේ 'සමාජ මාධ්‍ය' යන්නය. මෙය විවෘත වසමකි. සමාජ මාධ්‍යයට සම්ප්‍රදායික මාධ්‍යයන්ට පරිපූරක වීමට හෝ ඒවාට තරගකාරීවීමට හෝ පුළුවන. එතුළ සහභාගිත්වය, විවෘතභාවය, සම්භාෂණය (සංවාදය) සහ සම්බන්ධතා පවතියි. මෙහිදී මතුවන ප්‍රශ්නය නම් සමාජ මාධ්‍යන්ට සම්ප්‍රදායික මාධ්‍ය ප්‍රකාශනය සහ ක්‍රියාකරන ආකාරය වෙනස් කිරීමට හැකිවේද යන්නය. එ මගින් යෝජනා කෙරෙනුයේ ප්‍රවෘත්ති පාරිභෝජනය 'පාලනයේ' සිට 'නිරතවීම' දක්වා වෙනස් විය යුතු බවය. එක් අයෙකුගෙන්-බොහෝ දෙනෙකුට යන්න වෙනුවට 'බොහෝ දෙනෙකුගෙන්-බොහෝ දෙනෙකුට' ලෙස පසුතලය වෙනස් විය යුතුය. ග්‍රාහකයන් තොරතුරු පාරිභෝගිකයන් මෙන්ම නිෂ්පාදකයන් බවට ද පත්ව සිටිති. එය ''අනාත්මික ප්‍රජාවන්'' බිහිවීමට මුල්ව ඇත. පොලිස් කෲරත්වය, මැතිවරණ වංචා ආදී ජංගම දුරකථන මගින් හසු කර ගන්නා වීඩියෝගත තොරතුරු ඇතුළු වෙනත් මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කරන තොරතුරු සමාජ මාධ්‍ය මගින් ප්‍රකාශය කිරීම හේතු කොට පොලිස් නිලධාරීන් ඇතුළු තවත් අය අත්අඩංගුවට ගැනීමට පවා හැකිව ඇත. රජයයන් විසින් පනවන පුවත් වාරණ වැනි තහනම් නියෝග අභිබවා යාමද සමාජ මාධ්‍ය සමත්ව ඇත.

එක් අයෙකුගෙන්-බොහෝ දෙනෙකුට යන්න වෙනුවට 'බොහෝ දෙනෙකුගෙන්-බොහෝ දෙනෙකුට' ලෙස පසුතලය වෙනස් විය යුතුය.

1994 දී එම්. හූකර් නම් සන්නිවේදකයා කියා සිටියේ පුවත්පත් ප්‍රකාශනයේ අතිශයින් වැදගත් මොහොතක් දූන් එළඹ ඇති බවය.

''ඔබ ඉදිරියේ පවත්නා අභියෝගය බොහෝ දුරට මෙතෙක් ඔබ මුහුණ දුන් බරපතලම අභියෝගය විය හැකිය. පුවත්පත් නිෂ්පාදකයෙකු ලෙස ඔබ පළමුවෙන්ම කළ යුත්තේ ඔබ තුළ ඔබ පිළිබඳව පවතින පරිකල්පනය කුමක්දැයි නිගමනය කිරීමය. ඔබ පුවත්පත් සපයන සංවිධානයක්ද එසේ නැතිනම් තොරතුරු සපයන සංවිධානයක්ද? රෙමින්ග්ටන් සහ අන්ඩර්වුඩ් ඔවුන්ව දුටුවේ තමන් යතුරුලියනය ව්‍යාපාරයේ නියැළී සිටින බවය. අයි බී එම් සමාගම දුටුවේ තමන් පද සැකසුම් ව්‍යාපාරයක නියැළී සිටින බවය. ඉතිරිය ඉතිහාසගතය''.

සංඛ්‍යාංක යුගයේදී පවා සම්ප්‍රදායික ක්‍රමයන්හි පැවති නිසැගියා පැවතිය යුතුය. ''ගලා එන තොරතුරු සමුදායේ වැදගත් කම අවබෝධ කර ගත හැකි නිර්මාණශීලී සංස්කාරකවරු, වාර්තාකරුවන්, චිත්‍ර ශිල්පීන් සිටිය යුතු යැයි'' එම් ෆ්‍රැන්ක්ලින් නම් සන්නිවේදකයා පවසා ඇත.

මෙම පරිවර්තනයේ පවත්නා අහිතකර නැතිනම් සෘණාත්මක අංශය වනුයේ තොරතුරුවල පවත්නා විශ්වාසනීයත්වය පිළිබඳ ගැටළුවය. එම තොරතුරු ලැබෙනුයේ කොතනින්ද? එය එතැන්හි තැබූ කවරෙකුගේ වුව ඔහුගේ අභිප්‍රාය වන්නට ඇත්තේ කුමක්ද? එය ස්වාධීන බවට විශ්වාස කළ හැකිද?

එය තහවුරු කිරීමට, වලංගු කිරීමට හැකිද? මෙහිදී නැගෙන තවත් ගැටළු ගණනාවකදී සමාජ මාධ්‍ය තුළ වෘත්තීයමයභාවය, ප්‍රවනතා දැක්වීමට සහ සමාජ අවබෝධය නංවාලීමට සම්ප්‍රදායික මාධ්‍ය ක්‍රියාකරන ආකාරයෙන් ක්‍රියාත්මක වීමට සමාජ මාධ්‍ය සමත් වේද? නව තාක්ෂණයට ආර්ථික වශයෙන් දුප්පත් පුද්ගලයන් වෙතට සමාජ ප්‍රගතිය හිමිකර දිය හැකිද?

1982දී එරික් බාර්හෝට් නම් සන්නිවේදකයා සිය කෘතියක් තුළින් පළ කර ඇත්තේ මෙසේය. "මෝර්ස්ගේ ටෙලිග්‍රාප් පණිවිඩය යැවීමේ ක්‍රමය බිහිවීම සහ ඉන් පසුව අප ලද දුරකථනය, රැහැන් රහිත ගුවන් විදුලිය, රූපවාහිනිය සහ වෙනත් ආකාරයේ සන්නිවේදන ආශ්චර්යන් පහළ වීම පිළිගනු ලැබූයේ ප්‍රබෝධමත් අනාවැකි රාශියක ආශිර්වාද එක් කරමිනි. මේ නිර්මාණ එකින් එක ගත් කළ ඒවාට ප්‍රජාතාන්ත්‍රික සමාජය තුළ විශේෂ වැදගත්කමක් පවතින බව පෙනී යයි. මේ හැමකක්ම ලබා දුන් පොරොන්දුවක් ලෙස පෙනෙනුයේ තොරතුරු, අදහස් හා සංකල්ප ව්‍යාප්තිය වඩා පුළුල් කිරීමට තමන්ට හැකි බවය. අපේක්ෂිත ලෙසට එය එසේ සිදුවූ බවට තර්ක කළ හැකිය. නමුත් විරුද්ධ දිසාවෙන් බලන විට අනෙක් ප්‍රතිඵල එතරම් පැහැදිලි ලෙස දැකිය නොහැකි වී ඇත. එක් එක් නව මාධ්‍ය බලපෑම කේන්ද්‍රකරණය සහ පාලනය සඳහා නව අවස්ථා පිරිනමන අතරම ඒකාධිකාරී වීමේ හැකියාව හඳුන්වා දීමක්ද සිදු කරයි.

මෙම දැක්ම නව මාධ්‍ය සඳහාත් වලංගු වේද? සංඛ්‍යාංක බෙදීම මගින් නව සහස්‍රකයේ ප්‍රතිඥාගත 'මුදල' වන 'දැනුම' නාගරික ඉහළ පංතියට පමණක් සීමා කරනු ඇත්ද?

සංඛ්‍යාංක සන්නිවේදනයේ සිදුවන නව තවත් පරිවර්තන සමග පිළිතුරුවලට වඩා වැඩි ප්‍රශ්න ගණනාවක් අප හමුවේ ඉතිරි වනු ඇතැයි සිතීම යුක්ති සහගතය.

ආචාර්ය බුද්ධි වීරසිංහ

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු සහ අධ්‍යයන තාක්ෂණ අංශයේ අධ්‍යක්ෂ ලෙස සේවය කළ මෙම කතුවරයා ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානයේ පුහුණු අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ අතර වර්තමානයේ ව්‍යසන අවම කිරීම පිළිබඳ නිදහස් උපදේශකවරයෙකු ලෙස කටයුතු කරයි.

2012 දී බිලියන 7ක්!

වර්ෂ 2012දී ලෝක ජනගහනය බිලියන 7 දක්වා ඉහළ යනු ඇතැයි ඇමරිකානු ජනසංගණන කාර්යාංශය ප්‍රකාශ කර ඇත. 1999දී බිලියන 6 සීමාවට ළඟාවූ ලෝක ජනගහනයට තවත් බිලියනයක් එක්වීම සඳහා ගතව ඇත්තේ වසර 13ක් තරම් කෙටි කාලයක් පමණය.

ලෝක ජනගහනය බිලියනයක් වීම සඳහා මානව ඉතිහාසයේ වසර 1800ක් ගතවූ බවත් එය බිලියන 2 වීමට වසර 130ක් ගතවූ බවත් කාර්යාංශය විසින් ප්‍රකාශ කරයි.

වාර්තමානයේදී ලෝක ජනගහනය වාර්ෂිකව 1.2%කින් ඉහළ යන අතර වර්ෂ 2050 වන විට එය 0.5% දක්වා පහළ බසිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අද ලෝක ජනගහනයෙන් වැඩිම සංඛ්‍යාවක් වෙසෙන රටවල් තුන වන්නේ පිළිවෙළින් චීනය, ඉන්දියාව සහ ඇමරිකා එක්සත් ජනපදයය. ශ්‍රී ලංකාවට හිමිව ඇත්තේ 53 වන ස්ථානය ය.

යෞවනයන් සමග විද්‍යා සන්නිවේදනය උදෙසා අන්තර්ජාලය සහ ජංගම දුරකථන භාවිතය

තුසිත මලලසේකර

සංවර්ධනය පිණිස වන විද්‍යාත්මක තොරතුරු සමීප කරවීම සඳහා යෞවනයන් සමග සන්නිවේදනය කිරීම ඉතාමත් වැදගත්ය. අදහස් හුවමාරු කරගැනීමට, නව අදහස් සහ ව්‍යවහාරයන් සමග යාවත්කාලීන වීම සඳහා උගැන්වීමට, අප ඔවුන් සමග සාර්ථක ලෙස සන්නිවේදනය කළ යුතු වේ. විශාල ග්‍රාහක පිරිසක් සමග සන්නිවේදනය උදෙසා ඇති මෙවලම ''මාධ්‍යය'' වෙයි. වර්තමානයේ සාම්ප්‍රදායික ''මාධ්‍ය'' තුළට ඇතුළත් වනුයේ පුවත්පත්, සඟරා, ගුවන් විදුලිය හා රූපවාහිනිය පමණක් නොවේ. අන්තර් ජාලය සහ ජංගම දුරකථනද එයට අන්තර්ගතය.



මේ දිනවල ලෝකය පුරා වැඩසටහන් ගණනාවක්ම තරුණ අය සමග සන්නිවේදනය උදෙසා අන්තර්ජාලය සහ ජංගම දුරකථන වෙතට නැඹුරුවෙමින් පවතියි. මෙහිදී ඇතුළත් වන විෂය අතර විද්‍යාව, සෞඛ්‍යය සහ කෘෂිකර්මයද වෙයි.

මෑත කාලයේදී මෙම තාක්ෂණ ලද හැකි බව සහ ජනප්‍රියත්වය හිමි කර ගෙන ඇත්තේ මහත් පිබිදීමකින් යුතුවය. තරුණ අය අතර විශේෂයෙන්ම එය ඉහළ මට්ටමකට ළඟා වනු ඇත. එමගින් තොරතුරු ව්‍යාප්තියට නව හා නැවුම් අවස්ථා උදාකර ඇත. එසේ වුවද මෙම තාක්ෂණ සමහර අවස්ථාවලදී වැදගත් සහ වලංගු ප්‍රශ්නද මතුකරයි. එවැනි ප්‍රශ්න අතර,

- විද්‍යාත්මක දැනුම නංවාලීමට හෝ සෞඛ්‍යමය ප්‍රස්තුතයන්ට මැදිහත්වීම හෝ ඉහළ නැංවීමට අන්තර්ජාලය සහ ජංගම දුරකථන සාර්ථකව භාවිත කළ හැක්කේ කෙසේද?
- මෙම තාක්ෂණ භාවිතයේ පවත්නා වාසි සහ අභියෝග කවරේද?
- අන්තර්ජාලය සහ ජංගම දුරකථන භාවිතය මගින් සිදු කෙරෙන මැදිහත්වීම් සාර්ථක වන බව සනාථ කරන සාක්ෂි හා සාධක තිබේද?

මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමේදී පැහැදිලි පිළිතුරු මෙතෙක් ලද නොහැකි වී ඇත. අන්තර්ජාලය හා ජංගම දුරකථන තරුණ ජනතාව වෙත සමීප වීමේ සන්නිවේදන මෙවලමක් ලෙස මහත් බලාපොරොත්තු පිහිටුවා ඇති අතර මෙතෙක් කර ඇති ඇගයීම් මගින් හෙළි කර ඇති ප්‍රතිඵල නිශ්චිත නිගමන ලබා නොදෙන අතර සමහර අවස්ථාවලදී මිශ්‍ර ප්‍රතිඵල ලබා දී තිබීම ද සැලකිල්ලට ගත යුතුය.

අන්තර්ජාලය

1980 අග භාගයේදී විශ්ව විසිරි වියමන (වර්ල්ඩ් වයිඩ් වෙබ්) නම් සංසිද්ධිය ලෝකය පුරා පැතිර ගියේ මහත් කුණාටුවක් විලසිනි. නමුත් තවමත් සංවර්ධනය වන රටවල අන්තර්ජාලයට සමීප වීමේ හැකියාව සාධක ගණනාවක් මත රැඳී පවතියි. එම සාධක අතර, තාක්ෂණයට භෞතික ලෙස සමීප වීමට පවත්නා හැකියා, මූල්‍ය ස්ථාවරත්වය, අදායම ඇතුළු සමාජ ආර්ථික සාධක මෙන්ම භාෂා ප්‍රවීනත්වය ඇතුළු අධ්‍යාපනය, වයස, පුම්තිරි බව, භූ ගෝලීයව පදිංචි ස්ථානය සහ සංස්කෘතිය ඇතුළු ප්‍රජා විද්‍යාත්මක සාධක පවතියි.

ශ්‍රී ලංකාව තුළ අන්තර්ජාල ප්‍රවේශ පහසුකම් ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතියි. වර්තමාන පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් මෙන්ම පාසල් හැර ගිය දරු දැරියන් හා තරුණ තරුණියන් අන්තර්ජාලය භාවිතය කෙරෙහි මහත් උනන්දුවක් දක්වනු පෙනේ. එහෙත් ඒ අධ්‍යාපන කටයුතු හා සම්බන්ධව පමණක් නොවන බවද කිව යුතුය.

වෙබ් පාදිත මූලාරම්භ තරුණ අය හට අධ්‍යාපනය ලබා

යෞවනයන් සමග විද්‍යා සන්නිවේදනය උදෙසා අන්තර්ජාලය සහ ජංගම දුරකථන භාවිතය

දීමේ අතිරේක මාර්ග විවෘත කර ඇත. උදාහරණයක් ලෙස සෞරග්‍රහ මණ්ඩලය සහ අභ්‍යවකාශ ගවේෂණ කටයුතු පිළිබඳ තොරතුරු සපයන හෝ සෞඛ්‍ය ප්‍රස්තුත හා සම්බන්ධ කළ යුතු නොයුතු දේ දැක්වෙන හෝ වෙබ් පිටු ඇත්නම් තරුණ අය හට ස්වයං මාර්ගෝපදේශිතව අධ්‍යාපනය ලැබීමට අවස්ථාව උදා වෙයි.

වෙබ් අඩවි, විද්‍යාව හා සම්බන්ධ සේවා සැපයීමට සහ ප්‍රවර්ධනය කිරීමටද භාවිත කළ හැකිය. උදාහරණයක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන නවතම සේවා පිළිබඳ තොරතුරු තරුණ ගොවීන් හට ලබා දීමට එමගින් පුළුවන. එසේම මාර්ග ගත සිතියම් සලකුණු වැඩසටහන් ඔස්සේ කෘෂිකර්ම සේවා මධ්‍යස්ථාන හෝ අදාළ මිල ගණන් සමග නිෂ්පාදන මිලදී ගන්නා මධ්‍යස්ථාන හෝ දැක්වීමටද වෙබ් අඩවි යොදා ගත හැකිය.

වෙබ් පාදිත මූලාරම්භයන් වෙත සමීප වීම සීමා කරවන බාධක කිහිපයක් ද පවතියි. ඒ සඳහා ප්‍රමාණවත් තාක්ෂණ සහාය මෙන්ම ප්‍රබල පරිගණක ජාල පැවතීමද අවශ්‍යය. ශ්‍රී ලංකාවේ ජනගහනය තුළ තමන්ගේම පෞද්ගලික පරිගණක සතු වූ අය සිටිනුයේ ඉතා සුළු සංඛ්‍යාවකි. එහෙයින් ''ප්‍රජා පරිගණක මධ්‍යස්ථාන'' පහසුකම් ඇති කිරීමේ සංකල්පය ප්‍රමාණවත් ලෙස වර්ධනය කළ යුතුය.

ජංගම දුරකථන

පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවෙහි ජංගම දුරකථන භාවිතය නොසිතූ විරූ ලෙස ඉහළ ගොස් ඇත. මෙම දුරකථන යොදා ගනු ලබන්නේ ඇමතුම් දීමට හා ගැනීමට පමණක් නොවේ. ඒවා බහුලව භාවිත වන තවත් ක්ෂේත්‍රයක් වනුයේ ''එස්. එම්. එස්'' ලෙස ජනප්‍රියව ඇති කෙටි පණිවිඩ ලබා දීමේ හා ලබා ගැනීමේ සේවය (ෂෝර්ට් මෙසේජ් සර්විස්) ය. මෙම පණිවිඩ යැවීම ඉතා ලාබදායී මෙන්ම විශ්වාසදායී ද වෙයි. එසේම මෙරට තරුණ පිරිස ජංගම දුරකථන භාවිතය කෙරෙහි පමණක් නොව කෙටි පණිවිඩ සේවා යොදා ගැනීම කෙරෙහිද මහත් උනන්දුවක් සහ සාර්ථක අනුගතවීමක් දක්වති.

ජංගම දුරකථන භාවිතය මගින් විද්‍යාව, සෞඛ්‍යය සහ කෘෂිකර්මය ආදී විෂයන්ටද අදාළ ප්‍රස්තුත සඳහා වන සන්නිවේදන මැදිහත්වීම්හි නිරත වීම ලෝකය පුරා බොහෝ රටවල දැන් ඉහළ යමින් පවතියි. උදාහරණයක් ලෙස උගන්ඩාවෙහි රාජ්‍ය නොවන සංවිධානයක්, එරට විදුලි සංදේශ සමාගමක් සමග එක්ව තරුණ අය අතර එච්. අයි. වී. ඒඩ්ස් පිළිබඳව පවත්නා දැනුවත්භාවය නංවාලීමේ පණිවිඩ ව්‍යාප්ත කිරීමේ ව්‍යායාමයක සාර්ථක ලෙස නිරත වීම දැක්විය හැකිය. ඉන්දියාවේ ''ඒඩ්ස් වීරයෝ'' (හීරෝ ඒඩ්ස්) ව්‍යාපෘතිය මගින් හඳුනාගත් ජංගම දුරකථන විභවමය හැකියාව වූයේ, වෙනස්කම් කිරීම්වලට ලක්වේය යන බිය හේතු කොට, තහංචි සහිත තේමා පිළිබඳ ප්‍රශ්න නොවිමසන අය වෙත සමීප වීමේ අවස්ථාව කෙටි පණිවිඩ හරහා ලබා ගත හැකි බවය.

සමහර වැඩසටහන් දැනටමත් ක්‍රියාත්මක ව්‍යාපෘති පරිපූරණය සඳහා ජංගම දුරකථන යොදා ගැනින. ''ජීවත්වීම පිළිබඳ ඉගෙනීම'' ලෙස හැඳින්වෙන නයිජීරියාවෙහි ක්‍රියාත්මක ව්‍යාපෘතියෙහි එහි ප්‍රතිලාභීන්හට තමන් මුහුණ දෙන ගැටළු පිළිබඳව සිය පුහුණුකරුවන් සහ අදාළ වෙනත් වෘත්තිය සම්පත් දායකයන්ගෙන් කෙටි පණිවිඩ ඔස්සේ විසඳුම් ලබා ගැනීමට අවස්ථාව ලබා දී ඇත.

ජංගම දුරකථන භාවිතය මගින් විද්‍යාව, සෞඛ්‍යය සහ කෘෂිකර්මය ආදී විෂයන්ටද අදාළ ප්‍රස්තුත සඳහා වන සන්නිවේදන මැදිහත්වීම්හි නිරත වීම ලෝකය පුරා බොහෝ රටවල දැන් ඉහළ යමින් පවතියි. උදාහරණයක් ලෙස උගන්ඩාවෙහි රාජ්‍ය නොවන සංවිධානයක්, එරට විදුලි සංදේශ සමාගමක් සමග එක්ව තරුණ අය අතර එච්. අයි. වී. ඒඩ්ස් පිළිබඳව පවත්නා දැනුවත්භාවය නංවාලීමේ පණිවිඩ ව්‍යාප්ත කිරීමේ ව්‍යායාමයක සාර්ථක ලෙස නිරත වීම දැක්විය හැකිය.

සමාජ අලෙවිකරණ ප්‍රවේශයක් සහිත වැඩසටහන්වල දී ''පණිවිඩය අලෙවි කිරීම'' සඳහා සහ සේවා ලබා දීම සඳහා ද ජංගම දුරකථන භාවිත කෙරේ. එහිදී ද ප්‍රමාණවත් සාර්ථකත්වයක් හිමි කර ගැනීමට සමත්ව ඇත. එහෙයින් ශ්‍රී ලංකාවේද විද්‍යා මධ්‍යස්ථාන, සෞඛ්‍ය ආයතන සහ කෘෂි සේවා ව්‍යාප්ති මධ්‍යස්ථාන යනාදියට සිය අදාළ පාරිභෝගිකයන් අතරට තම සේවා ගෙනයාමට ජංගම දුරකථන කෙටි පණිවිඩ සේවාව භාවිත කළ හැකිය.

විද්‍යාත්මක දැනුම ව්‍යාප්තියේදී අන්තර්ජාලය සහ ජංගම දුරකථන භාවිතයේ ඇති ප්‍රයෝජනවත් බව පිළිබඳව නිගමනයකට එළඹීමට තරම් තවමත් කාලය පැමිණ නැත. එසේ වුවද දැනට දක්නට ලැබෙන සියළු ලක්ෂණ සහ ප්‍රවනතා පෙන්වා දෙනුයේ මාධ්‍ය ක්ෂේත්‍රයට ''අලුතෙන්'' එක්වූ මෙම තාක්ෂණ සංවර්ධන සන්නිවේදනයේ නව මං මාවතක් හෙළි පෙහෙළි කිරීමට, නව යුගයක් උදා කිරීමට, සැදී පැහැදී සිටින බව යැයි හැඟේ.

තුසිත මලලසේකර

ලැබූ දැනුම විමසමු

27 වෙළුම කලාපය 01

විදුරාව මෙම කලාපය කියවීමෙන් ලද දැනුම විමසා බලන්න.

1. හරිද? වැරදිද?

(අ) රාජ්‍ය තාන්ත්‍රික දේශපාලඥයෙකු වූ බෙන්ජමින් ෆ්‍රෑන්ක්ලින් ස්වභාවධර්මය සතු වූ විස්මිත බව පිළිබඳ ඉමහත් කුතුහලයක් දැක්වීය.

(ආ) භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, භූ විද්‍යාව හා ජෛව විද්‍යාව වශයෙන් විද්‍යාව කුටීර ගත වූයේ ඒ එකිනෙකට සීමා වූ මූල ධර්ම, නීති රීති රහිතවය.

(ඇ) විද්‍යාව සඳහා යොදා ගත් භාෂාව සංකීර්ණ හා ශිල්පීය වීම නිසා එය පොදු මිනිසාට තේරුම් ගත හැකි භාෂා විලාසයක් විය.

(ඈ) ජීවිතයේ උපරිම ඵල නෙලා ගැනීමට සහ සමාජයේ සක්‍රිය සාමාජිකයෙකු වීමට නම් කෙනෙකු විද්‍යාත්මක සාක්ෂරතාවය සහිත අයෙකු විය යුතුය.

(ඉ) විද්‍යා ලේඛකයා සංස්කෘතීන් දෙකක් අතර සබඳතා ඇතිකරන පාලමකි.

2. හරිද? වැරදිද?

(අ) විද්‍යාත්මක දැනුම සහ සංකල්ප කාර්යක්ෂම ලෙස ජනතාව අතරට ගෙන යාමට නම් එම කාර්යෙහි යෙදෙන්නන් හට විද්‍යාව පිළිබඳව මෙන්ම ජනමාධ්‍ය භාවිතය පිළිබඳවත් නිරවුල් අවබෝධයක් තිබිය යුතුය.

(ආ) විද්‍යාව වැටහීම හෙවත් සම්ප්‍රජානනය යනු විද්‍යාව හා තාක්‍ෂණය කෙරෙහි යොමු වූ ආකල්ප සමූහයත්, හුරු බවක් සහ ලැදි බවක් ලෙස සැලකිය නොහැකිය.

(ඇ) ''මහරජතුමනි, මෙම භූමිය ජනතාවටත්, සියළු ජීවීන්ටත් අයත් වන අතර ඔබ එහි ආරක්ෂකයා පමණි.

(ඈ) බ්‍රිතාන්‍ය විද්‍යාභිවර්ධන සංගමය ආරම්භ වුවත් එයින් එහි යටත් විජිත රටවල විද්‍යාභිවර්ධන සංගම් ඇති වීමට උත්තේජනයක් ඇති නොවින.

(ඉ) සත්‍යය සොයා ගැනීම සඳහා භාවිත කළ හැකි මෙම නව ක්‍රමවේදය ආරම්භ වූයේ ගැලිලියෝ ප්‍රමුඛ විද්වතුන් කිහිප දෙනෙකුගේ දායකත්වයෙනි.

3. හරිද? වැරදිද?

(අ) ඇමරිකා එක්සත් ජනපදයේ කළ සමීක්‍ෂණයකට අනුව සමීක්‍ෂණයට දායක වූවන්ගෙන් 70%ක් විශ්වාස කරනුයේ අවුරුදු 6000ට පෙර ලෝකය මවා ඇති බවය.

(ආ) 'හෝමෝ සේපියන්ස්' ආසියාවේ ජනිත වුවත් ඉන් අනතුරුව ලොව පුරා ව්‍යාප්ත වූයේ යැයි විශ්වාස කෙරේ.

(ඇ) විද්‍යා සන්නිවේදකයන්ගේ ප්‍රධාන කාර්යභාරය නම් විද්‍යාත්මක සොයා ගැනීම් ක්‍රියා කරන ආකාරය පිළිබඳව ජනතාවට පැහැදිලි කිරීමය.

(ඈ) ප්‍රමාණවත් තරම් උසස් මට්ටමක ඇති ඕනෑම විද්‍යාත්මක ශිල්පයක් මැජික්වලින් වෙන් කොට හඳුනා ගත හැකිය.

(ඉ) දුම්කොළ හා මධ්‍යසාරවලින් සිදු කරන්නා වූ හානිය, ඒඩ්ස් පැතිරෙන ආකාරය, පරිසර දූෂණය සිදුවන ආකාරය යනාදිය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම විද්‍යා සන්නිවේදකයන්ගේ වගකීමය.

4. හරිද? වැරදිද?

(අ) සන්නිවේදනය චර්යාත්මක පද්ධතියකි. එය වචනමය සහ වචනමය නොවන පොදු සංකේත භාවිත කරමින් තොරතුරු හුවමාරු සහ අවබෝධ සම්ප්‍රේෂණ කිරීමට සමත් වෙයි.

(ආ) සන්නිවේදනයෙන් අපේක්‍ෂා කෙරෙනුයේ එය ලබන්නා සමග පොදු බවක් - ඵකඟතාවක්, ඇති කර ගැනීමය.

(ඇ) නොදන්නා දෙයින් දන්නා දෙයට යෑම සන්නිවේදනයේ ගමන් මග වේ.

(ඈ) කිසිදු සන්නිවේදන මාර්ගයක් ස්වභාවයෙන්ම ඒක මාර්ගික නොවේ.

(ඉ) සන්නිවේදන ප්‍රයත්නයක සඵලමත් බව රැඳෙනුයේ කිසියම් අවස්ථාවක දී තෝරා ගන්නා උචිත සන්නිවේදන ක්‍රියාවලිය, අංග සහ ක්‍රමය මතය.

5. හරිද? වැරදිද?

(අ) ඉපැරණිම සංරක්ෂිත ලිඛිත වාර්තා හසුවනුයේ මොහොන්ජොදාරෝ ශිෂ්ටාචාරයෙනි.

(ආ) බයිස්කෝප්පය (සිනමාව) තිරය මත පළමුවරට පතිත වූයේ 1895 දීය.

(ඇ) අන්තර්ජාලයේ ආරම්භය 1960 දශකයේ දී පරිගණක සබැඳි ඇති කිරීම සඳහා කළ අත්හදා බැලීම්වල ප්‍රතිඵලයකි.

(ඈ) 'නව' මාධ්‍ය ලෙස හැඳින්වෙන්නේ සංඛ්‍යාංක පරිගණකගත හෝ ජාල තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ සියල්ල ඇතුළත් වූවකි.

(ඉ) ලේඛකයන් සමාජයෙහි පෙර දැක්මක් රහිත වූවන්ය.

6. හරිද? වැරදිද?

(අ) තරුණ අය සමග සන්නිවේදනය උදෙසා අන්තර්ජාලය සහ ජංගම දුරකථන වෙතට වැඩසටහන් නැඹුරුවීමක් දක්නට නොමැත.

(ආ) ශ්‍රී ලංකාව තුළ අන්තර්ජාල පහසුකම් සහ ප්‍රවේශ ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් ඇත.

(ඇ) වෙබ් පාදිත මූලාරම්භයන් වෙත සමීප වීමට නම් ප්‍රමාණවත් තාක්‍ෂණ සහාය මෙන්ම ප්‍රබල පරිගණක ජාලද පැවතීම අවශ්‍යය.

(ඈ) ජංගම දුරකථන භාවිතය තුළින් විද්‍යාව, සෞඛ්‍යය සහ කෘෂිකර්මය ආදී විෂය ප්‍රස්තුතයන්ට ළඟා වීම සඳහා ප්‍රයත්න දරා නැත.

(ඉ) විද්‍යාත්මක දැනුම ව්‍යාප්තියේදී අන්තර්ජාලය සහ ජංගම දුරකථන භාවිතයේ ඇති ප්‍රයෝජන නිගමනය කිරීමට තවමත් කාලය ඉක්ම නැත.

පිළිතුරු

1.	(අ)	හරි	(ආ)	වැරදි	(ඇ)	වැරදි	(ඈ)	හරි	(ඉ)	හරි
2.	(අ)	හරි	(ආ)	වැරදි	(ඇ)	වැරදි	(ඈ)	හරි	(ඉ)	හරි
3.	(අ)	හරි	(ආ)	වැරදි	(ඇ)	හරි	(ඈ)	වැරදි	(ඉ)	හරි
4.	(අ)	හරි	(ආ)	හරි	(ඇ)	වැරදි	(ඈ)	වැරදි	(ඉ)	හරි
5.	(අ)	වැරදි	(ආ)	හරි	(ඇ)	හරි	(ඈ)	හරි	(ඉ)	වැරදි
6.	(අ)	වැරදි	(ආ)	හරි	(ඇ)	හරි	(ඈ)	වැරදි	(ඉ)	හරි